**2026 මැයි මස 07 වන දින පෙරවරු 9.30 ට**
**මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද**
**මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |

41. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
42. මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
43. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
44. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
45. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
46. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
47. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
48. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
49. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
50. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණී මෙනවිය

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2026.05.07 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2026.04.02 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, 2026.04.02 දින සභා වාර්තාවේ අයිතම අංක 02(5) යටතේ නාගරික කොමසාරිස්තුමියගේ නම එල්. පී. මනෝජා එස්. ප්‍රනාන්දු මෙනෙවිය ලෙස සටහන් වී ඇති අතර එය එල්. පී. මනෝජා එස්. පතිරණ මෙනෙවිය ලෙස නිවැරදි විය යුතු බව දන්වා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2026.04.02 දිනැති මාසික සභා රැස්වීමේ වාර්තාව සංශෝධනට යටත්ව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2026.04.02 මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන:-</u>

**02(1)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026/04/07 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී එච්. කේ. ෂර්මන් පිලීසියන් ප්‍රනාන්දු මහතා 2026/04/06 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(2)** **ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා 2026/04/09 දින පැවති ක්‍රීඩා හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී ටී. සංජීව ප්‍රියශාන්ත මහතා 2026/04/06 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(3)** **ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා 2026/04/21 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී ඩී. සමන්ත සිල්වා මහතා 2026/04/18 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(4)** **ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, මහා නගර සභා මන්ත්‍රී මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය ඇමරිකා එක්සත් ජනපදයේ අයිසන්හවර් සහයෝගිතා ආයතනයේ ආරාධනය පරිදි 2026.04.05 දින සිට 2026.05.16 දින දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ විදේශ සංචාරයකට සහභාගිවීම සඳහා රාජකාරි නිවාඩු අයදුම්කර ඊට අදාලව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බැවින් 2026/04/07 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට හා අද දින මාසික මහා සභා රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(5)** **ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, මහා නගර සභා මන්ත්‍රී සුජීත් පුෂ්පකුමාර මහතා විසින් පෙත්සම් පැමිණිලි යටතේ ඉදිරිපත් කළ අනවසර ඉදිකිරීමක් වන ටී. එල්. සී. පුස්තකාලයට යාබදව ඇති ලී මඩුව සම්බන්ධව, අනවසර ඉදිකිරීම් යටතේ එම ඉදිකිරීම නතර කරන ලෙසත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පදික වේදිකාව අවහිර කිරීම සම්බන්ධව ක්‍රියා කරන ලෙසත් ලිපි යවා ඇති අතර සෞඛ්‍ය ගැටළුව සම්බන්ධව සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇති බවත්, නාගරික ඉංජිනේරුතුමා විසින් දන්වා තිබෙනවා. එය සභාවට නිවේදන යටතේ ඉදිරිපත් කරනවා.

## 03. සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

**03(1)** **මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, මෙවර ඊද් උත්සවය හා වෙසක් උත්සවය එකම කාල සීමාවක යෙදී ඇති බැවින් හජ්ජි උත්සවයේ ප්‍රධාන අංගයක් වන කුරුබාන කියන ක්‍රියාවලිය සිදු කිරීමට අපට අවස්ථාව ලබා දෙන මෙන් නීතිමය ක්‍රියා පිළිවෙතක් මේ සඳහා ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**03(2)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පහළ ඉදිබැද්ද මැන්ඩිස් පාර මේ වෙනකොට වසර ගණනාවකින් සංවර්ධනය නොවුන මාර්ගයක් හැටියට මේ වෙනකොට එහි පදිංචිකරුවන් අපිට විශාල වශයෙන් දෝෂා රෝපණය කරනවා. මේ මාර්ගය සංවර්ධනය නොකිරීම සම්බන්ධයෙන්. අපේ පාලන කාලය තිබෙනකොටත් මේ පාරවල් අපිට සම්පූර්ණ ගල් යොදා සංවර්ධනය කිරීමට නොහැකි වුනත්, අපි මේ මාර්ග වල නඩත්තු කටයුතු පවත්වාගෙන ගියා. අද මේ වෙනකොට මේ මාර්ග වල නඩත්තු කටයුතු නොකිරීම සම්බන්ධව තමුන්නාන්සේලාට විශාල වශයෙන් චෝදනා එල්ල වෙනවා මොකද ඉදිබැද්ද ප්‍රදේශය බැලුවම මේ මැන්දිස් පාර වගේම ඉහළ ඉදිබැද්දේ තියෙන ජෝන් සැමුවෙල් මාවත ඉතාම බැවුම් ස්ථානයක්. මේ මාර්ගයේ විශාල වලවල් තිබෙන නිසා වාහන පල්ලේහාට ගිහින් මේ වාහන නැවත උඩට ගන්නකොට එවා ගන්න විශාල පරිශ්‍රමයක් යොදන්න වෙනවා, අනතුරු වලටත් ලක් වෙනවා. අපි දන්නවා සභාවේ තිබෙන මුල්‍යමය තත්ත්වය සම්බන්ධව. නමුත් මේ මාර්ග නඩත්තු විය යුතුයි. දැනට සම්පූර්ණ මේ මාර්ගය සංවර්ධනය කරන්න බැරිනම් ඔබතුමාගේ කාරුණික අවදානය යොමු කරලා මේ තිබෙන විශාල වලවල් වහලා මේ ජනතාවට පරිහරණය කරන්න පුළුවන් ආකාරයට මේ මාර්ග සම්පූර්ණ පිළිසකර කරනකම් හරි සකසා දෙන්න කියන කාරුණික ඉල්ලීම කරනවා.

**03(3)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමත් අපිත් දන්නවා අපේ සභාව සතු මේ ජෙට් බවුසරය විශාල කාලයක් තිස්සේ කැඩිලා කැළි දෙකකට වෙන් කරලා තමයි තිබෙන්නේ. මේකේ වැඩිය තමයි මම දන්න විදිහට දිරලා තියෙන්නේ, මේ වාහනය සභාවට අත්‍යාවශ්‍ය වාහනයක් විදිහට පත්වෙලා තියෙනවා. මොකද ඔබතුමත් අපිත් දන්නවා සමහර මාර්ග වල ස්ලැබ් ලැලි දාලා සම්පූර්ණ සීල් තියලා තියෙනවා අඩි 25 ක් 30ක් වගේ යනකන්, එතකොට මේවා සුද්ධ පවිත්‍ර කරන්න බැහැ. මේවා පවිත්‍ර කරන්න ගියාම මේ ස්ලැබ් ලැලි ගලවන්න විශාල පරිශ්‍රමයක් දරන්න සිදු වෙනවා. හැබැයි අර ජෙට් බවුසරය තිබුණම අපිට එක ඉතාම නිවැරදිව ඉක්මනින් ජනතාවට පවිත්‍ර කරලා දෙන්න පුළුවන් වෙනවා. එම නිසා අපි වාහන අධිකාරිතුමාගේ සහ ඉංජිනේරුතුමාගෙත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා මොකද අපරාදේ මේ සභාවට තිබෙන මිලෙන් වැඩිම වාහනයක් හැටියට තමයි අපි මේ වාහනය දකින්නේ. අපි දන්න විදිහට දෙහිවල ගල්කිස්ස නගර සභාව ඇරුණකොට මොරටුව නගර සභාවට විතරයි මේ වගේ වාහනයක් තියෙන්නේ. ඒ නිසා අපරාදේ මේවා දිරලා යන්න දෙන්න එපා. මේ සම්බන්ධව ඔබතුමා මැදිහත් වෙලා මේ වාහනය ඉතා ඉක්මනින් ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(4)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ බල ප්‍රදේශයේ පවුලක සමාජිකයෙක් මරණයට පත්වුනාම අපි සභාව හැටියට විශාල සේවාවක් අපි ලබා දුන්නා. අපි මරණය දැනගත්ත ගමන්ම අපි මේකට පක්ෂ භේදයක්, ආගම් භේදයක්, ජාති භේදයක් බැලුවේ නැහැ අපි ඒ මැරුණ කෙනාට ගෞරවයක් හැටියට අපි ඒ ස්ථානයට ගිහිල්ලා පාර සුද්ධ පවිත්‍ර කරලා, ගෙදර තිබෙන කුණු ටික ඉවත් කරලා, ලයිට් දාලා දෙන්න අපි පොඩි ක්‍රමයක් හදාගෙන තිබුණා. අද මේ වෙනකොට කෙමින් කෙමින් එක නැවතෙමින් යනවා. විදුලි අර්බුදය නිසා ෆැෂ් ලයිට් ගහන්නේ නැහැ කියලා විදුලි අධිකාරිතුමාට කතා කරාම දැන ගත්තා. මම ඒ වෙලාවේ එතුමාට කිවුවේ එහෙම තීරණයක් අරන් තියෙනවනම් ඒ මාර්ගය කරුවලේ තියන්න බැහැ, ඒ මිනිස්සු හරි එතනට ලයිට් එකක් දාන්න ඕන. එහෙනම් අපිට පුළුවන්කම ලැබෙනවද සභාව හැටියට මාර්ගයේ තිබෙන කණුවෙන් මේ සඳහා විදුලිය ලබා

නුදුන්නත් ඒ ගෙදර අයට හරි ගහ ගන්න ලයිට් එකක් දෙන්න කියලා, එතකොට එතුමා මට පැහැදිලිවම කිවුවා එහෙම ලබා දෙන්න බැහැ සභාව අපි තීන්දුවක් අරන් තියෙනවනම් අපිට එක කරන්න බැහැ කියලා. නමුත් අපිට බැහැ කිවුවට ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට ඒවා ලබා දෙනවා, අපි විපක්ෂයේ හින්දද දන්නේ නැහැ එතුමා අපිට කෙළින්ම කියනවා එහෙම සභාවෙන් දෙන්න බැහැ කියලා. මන් ළඟ වීඩියෝ තියෙනවා වෙනත් මරණ ගෙවල් වලට දීලා තියෙනවා. මෙතනදි දේශපාලන පක්ෂ බලන්න එපා. විදුලි අධිකාරිතුමාට උපදෙස් දෙන්න මොන මන්ත්‍රීවරයා කිවුවත් මරණ ගෙදරකට ලබා දෙන නිසා මෙය ලබා දෙන්න කියලා. නිසා මේ සඳහා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(5)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ගිය සභාවෙදීත් අපේ සෞඛ්‍ය කමිටු සභාපතිතුමාට කිවුවා. මේ වෙනකොටත් ඉඳුල් කුණු ගෙනියන්න එන්නෙත් පාරවල් වලට සති තුනකට සැරයක්. මම ගිය සභාවේ කතා කරලා කිවුවා මම ඉන්න පාරෙත් ආවේ සති තුනකට සැරයක් කියලා. සභාවෙන් පස්සෙත් ආවේ සති තුනකට සැරයක්. එක පාරක් ගැන නෙමෙයි පාරවල් ගාණනාවකටම මෙහෙම තමයි. අපි ඉල්ලනවා සතියට දවසක් හරි යන්න වැඩපිළිවෙළක් හදන්න කියලා. ඒ නිසා ඉල්ලා සිටිනවා මේ සඳහා ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා.

**03(6)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ මා වෙත ලැබී ඇති පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න කැමතියි. විශේෂයෙන්ම මහා නගර සභා ආඥා පනතේ 272(28) වගන්තිය යටතේ තියෙනවා පොදු උපයෝගීතා සේවා සම්පාදනය සම්බන්ධව අතුරු ව්‍යවස්ථාව සහ ඊට අදාලව නීති රීති සහ වගන්ති. මහා නගර සභාවක මහජන උපකාර සේවාවක් පිහිටුවීමට හා ඒ බලතල තියෙන ස්ථානයක් තමයි මහා නගර සභාවක් කියන්නේ. ඉතින් මා වෙත ලැබී ඇති පෙත්සම ඊට අදාළම කරුණක් නිසා නීතිමය පැත්තත් එක්ක මම ඔබතුමාට ඉදිරිපත් කරනවා. මෙය නැවත ඉදිරිපත් කිරීමක්. මීට පෙර ඔබතුමා වෙත යොමු කරන ලද ඉල්ලීමක්, මා එම ලිපිය කියවන්නම්. නොම්බර 32/2 ක පොල්කොටුව පාර, රාවතාවත්ත, මොරටුව කියන ස්ථානයෙන් තමයි මෙම ලිපිය මට නැවත ලැබුනේ. මොරටුව සුපර් මාකට් කඩ කාමරයක් ලබා ගැනීම. මම හිතන්නේ මාස 07කට වැඩි කාලයක් වෙනවා මේ ඉල්ලීමට. ඉහත බලයෙන් යුතුව 2025 නොවැම්බර් මසදී මොරටුව මහා නගර සභාවේ නගරාධිපතිවරයා වෙත මොරටුව ප්‍රදේශයේ වැඩිහිටියන් වෙනුවෙන්. ප්‍රාදේශීය බල මණ්ඩලය ඉදිරිපත් කර ලිපියක පිටපතක් මේ සමග අමුණා ඇත. මෙම ලිපිය ඔබතුමිය වෙත ඉදිරිපත් කිරීමට අදහස් කළේ දැනගන්නට ලැබුණු පරිදි 2026 මාර්තු මස නගර සභා රැස්වීමේදී මොරටුවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ඔබතුමිය කළ මෙහෙවර අගය කිරීමක් ලෙසයි. ඒවාගේම ස්තුති කිරීමටයි, නමුත් මෙම යෝජනාව මොරටුවේ වැඩිහිටියන් වෙනුවෙන් මොරටුව මහ නගර සභාවේ නගරාධිපතිතුමත් නගර සභාවේ නිහඬ පිළිවෙතක් අනුගමනය කරමින් සිටීම ගැන ප්‍රාදේශීය බල මණ්ඩලය බලවත් කම්පනයට පත්ව සිටින්නෙමු. මෙතෙක් ලිපියකින් අපට නගර සභාව දැනුවත් කර නොමැති හෙයින් තව සතියකින් පමණ නගරාධිපතිතුමා නැවත හමුවීමට අපි බලාපොරොත්තු වෙමු. බොහොම මානුෂීය ඉල්ලීමක් ඔබතුමා වෙත කරල තියෙනවා. මම හිතනවා ඒ ගැන නැවත ඉදිරිපත් කළේ නැවත සලකා බැලීමක් අවශ්‍ය බැවින් කියලා. මොකද ඔබතුමාලාගේ ප්‍රතිපත්ති සම්පාදන තුළ තියෙනවා වැඩිහිටියන් ආරක්ෂා කරන්න අපි අලුත් වැඩපිළිවෙළවල් හදනවා කියලා. ඉතින් මේක මහ නගර සභාව තුළ අනිවාර්යෙන්ම කළ හැකි කාර්යභාරයක් නිසා, නීතිමය ප්‍රතිපාදන මේ තුළ තිබෙන නිසා

ඔබතුමාගේ අවධානය නැවත මා යොමු කර සිටිනවා මොකද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ආරක්ෂා කිරීම අපේ වගකීමක් සහ යුතුකමක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කියන්නේ මම හිතන්නේ බොහෝ දුර රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින් තමයි එතන ඉන්නේ. ඒ අයගේ සැදෑ සමය ගතකිරීමට අවශ්‍ය ක්‍රම උපායමාර්ග සැලසුමක් විශේෂයෙන් මොරටුව නගර සභාව විදියට අපි සැලසුම් කරලා ක්‍රියාත්මක කිරීම තමයි අපේ වගකීම නැවත නැවතත් ඔබතුමාට කියනවා මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය හැකි ඉක්මනින් යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(7)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මා වෙත නැවත ඉල්ලීමක් විදිහට ලැබිලා තියෙනවා චමින්ද ප්‍රියන්ත පිරිස් මහත්මයා මොරටුව මහා නගර සභාවේ සේවකයෙක් විදියට එතුමා මම හිතන්නෙ කාලයක් තිස්සේ සේවය කරපු පුද්ගලයෙක්. විශේෂයෙන්ම සෞඛ්‍ය අංශය කියන්නේ ගොඩක් දුරට අති කාර්යභාර්යක් තියෙන අංශයක්. බොහොම කැපකිරීම් කරපු මිනිස්සුන්ට මේ වගේ ඉල්ලීම් නැවත නැවත කරන්න වෙනවා කියන එක ගැන ඇත්තටම කණගාටුවට පත්වෙනවා. මොකද ඔබතුමාලාගේ පරිපාලනය පිහිටෙව්වේ කලින් ක්‍රම වලට වඩා වෙනස් විදියට බොහොම ඉක්මනින් ඔබතුමාලා ක්‍රියාත්මක වෙනවා කියලා. ඉක්මනින් ක්‍රියාත්මක වෙන්න බැරි වුණත් යම් කිසි ක්‍රමවේදයක් තුළ මේ ගැටලු විසඳෙනවනම් තමයි හොඳ එතුමාගේ ලිපිය දීර්ඝ ලිපියක් තියෙනවා, මේ ලිපියේ සඳහන් කරුණු ඔබතුමාට සභාගත කිරීම සඳහා මා ඉදිරිපත් කරනවා. ක්‍රමවේදයක් හදන්න මිනිසුන්ගේ ප්‍රශ්න ගෙනාවම මේවා ඉටුකරන්න, ඒ මොකද අපේ සේවකයින් එතුමන්ලා එතුමන්ලාටත් ගරුත්වයක් තියෙනවා ඉල්ලීමක් කරාම සලකා බැලීම අත්‍යාවශයයි සහ එවා ඉටු කිරීම ඔබතුමන්ලාගේ කාර්යභාර්ය විදිහට නැවත මතක් කරනවා.

**03(8)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ වාචිකව පැමිණිලි ගොඩක් ලැබෙනවා සහ විශේෂයෙන් අපි මන්ත්‍රීවරු විදියට අපිට ලොකු ප්‍රශ්න තියෙනවා, ජනතාව වෙනුවෙන් තමයි අපිට ප්‍රශ්න එන්නේ, ප්‍රශ්න ආවහම අපි ඒවා ඉටු කරන්න ගියහම බොහෝ දුරට සෞඛ්‍ය අංශයෙන් අපිට ලොකු ගැටළු මතුවෙනවා. මොකද ඔබතුමා ඔතන නගරාධිපතිවරයා විදියට හිටියට තවත් වෙනත් අංශවල නගරාධිපතිවරුත් මේ නගර සභාවේ දැනට ඉන්නවා අපි හිතන විදිහට මොකද වැඩක් කරගන්න ගියාම තමයි ඒක තේරෙන්නේ මේ එක නගරාධිපතිවරයෙක් නෙමෙයි නගරාධිපතිවරු දෙතුන් දෙනෙක් නගර සභාවේ ඉන්නවා කියන එක, ඉතින් බොහොම කණගාටුයි මොකද ඔබ බොහොම අවශ්‍යතාවයෙන් වැඩ කරන්න චුවමනාවක් ඔබ පෙන්නුම් කළා. ඉතින් ඒ පෙන්නුම් කරපු චුවමනාව ඔබට ඉටුකරන්න ලැබිච්ච අවස්ථාව තමයි මේ ලැබිලා තියෙන්නේ. විශේෂයෙන්ම ඩෙංගු රෝගීන් වෙසෙනවා අපිට මදුරුවන්ට මදුරු දුමක්වත් ගහගන්න බැරි විපක්ෂ මන්ත්‍රී කණ්ඩායමක් තමයි මේ පැත්තේ අද ඉන්නේ. එතුමන්ලාව ගිහිල්ලා හම්බුනාම එතුමන් කියනවා අහවල් පුද්ගලයගෙන් අවසර ගන්නලු අවසර අරන් එන්නලු ඕනනම් දුම ගහලා දෙන්න, ඉතින් අපිට අහවල් පුද්ගලයෝ හම්බවෙන්න අවශ්‍ය නැහැ. නගරාධිපතිලා මොරටුව මහා නගර සභාවේ ඉන්න ඕන එක්කෙනයි. මොකද අපි නීතිය දන්න නිසා අපිටත් පුළුවන් එළිය ගිහිල්ලා මේවා කතා කරන්න. නගරාධිපතිවරු දෙතුන් දෙනෙක් නගර සභාවක් ඇතුලේ ඉන්න බැහැ පරිපාලනය තුළ, මේක ඔබේ දක්ෂතාවයනම් ඔබ එක හදන්න කරුණාකරලා. ඔබ දක්ෂයෙක්නම් ඔබ ඔබේ කාණ්ඩායමේ හරි ඒ වගේ ප්‍රශ්නයක් තියෙනවමනම් අනිත් මන්ත්‍රීවරුන්ගේ අවස්ථාව නැති කරන්න එපා. මහා නගර සභා ආඥා පනත යටතේ අපිට තිබෙන බලතල ඔබ නැති කරන්න එපා. මෙවාගේ නීතිරීති එක්ක අපි වැඩ කරන නිසා අපි දන්නවා අපේ අවස්ථාව අපිට ඕන කියන එක. ඒ නිසා මේ

සඳහා ඔබතුමාගේ කාරුණික මැදිහත්වීම කරන්න කියලා ඉල්ලනවා. ඔබේ කණ්ඩායම දේශපාලනය කරන්න, නමුත් පරිපාලනය තුළට දේශපාලනය ගේන්න එපා කියන ඉල්ලීම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා. අපේ මන්ත්‍රීවරුන්ට දුම ගහගන්න විදියක් නෑ විශේෂයෙන් මට මගේ සහෝදරයෙකුට ඩෙංගු රෝගිය වැලදිලා රෝහලේ ඉඳලා ගෙදර ඇවිල්ලා ඔහුගේ නිවසට දුම ගහගන්න විදිහක් නැහැ. සහෝදරයගේ රෝගය වෙනුවෙන් මගෙන් කරන ඉල්ලීමකට මට ඒ දේ කරලා දෙන්න විදිහක් නැහැ. අවසර අරන් එන්නලු මෙවා කරගන්න. අපි මන්ත්‍රීවරුන්නම් ඔබේ මන්ත්‍රීවරුන්ට තියෙන අයිතියම අපිට තියෙන්න ඕන ඔබ මේ පැත්තේ ඉන්නකොට ඔබ ඉදිරිපත් කරපු කරුණු තර්ක විතර්ක සියල්ලක්ම අපිට මතකයි ඉතින් ඔබතුමාගෙන් බොහොම කරුණාවෙන් ඉල්ලනවා මන්ත්‍රීවරයාගේ වරප්‍රසාද වලට හානියක් කරන්න එපා ලොකු ලොක්ක ගොඩක් හදන්න එපා එක ලොක්කෙක් තියාගෙන මේ වැඩේ කරන්න නැත්නම් අපි අපේ අයිතිවාසිකම් වෙනුවෙන් අනිවාර්යෙන්ම පෙනිසිටිනවා.

**03(9)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මැයි මාසය ඇවිල්ලා තියෙන්නෙ වෙසක් පොහොය යෙදිලා තියෙනවා 30 වෙනිදට, එතකොට ඒ වෙසක් පෝයට අපි ඔබතුමා සමඟ රැස්වීම් කිහිපයකට සහභාගී වුණා. වෙසක් පොයට මේ මොරටුව නගරය අලංකාර කරලා, ලයිට් දාලා, තොරණ් ගහලා කරන වැඩපිළිවෙල ඔක්කොම මේ ප්‍රශ්නෙත් එක්ක නැති වුනා එක ගැටළුවක් නැහැ. නමුත් අපි වෙසක් පෝය සමරන්න ඕන, අපි පියාරා එකේ හිමිකරුට කිව්වා මේ ටික ලයිට් ටිකක් හරි දාන්න කියලා. අපිත් තොරණ ගහනවා හන්දියේ එනිසා වෙසක් දවසට අපේ මොරටුව වෙසක් සිරියෙන් තියෙන්න ඕන කියලා අපි මතක් කරන්න කැමති. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා නගර සභාවෙන් කළයුතු කාර්ය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(10)** **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි මේ දවස් වල ශිරෝමි මන්ත්‍රීතුමිය කිව්වා වගේ. ඩෙංගු වසංගතය, රෝගීන් ගැන අපිට තැන් තැන්වලින් ඇහෙන්නට ලැබෙනවා. බොරුපන ප්‍රදේශයෙත් ඩෙංගු ආශ්‍රිත මරණයක් සිදුවුණා. හැබැයි ඒකට මම පෞද්ගලිකව මට කිව්වා ඊට කලින් ඒ අවට දුම් ගහලා තිබ්බයි කියලත් මට කිවුවා. නමුත් මීට සතියකට පෙරාතුව මට මාධ්‍යයකින් කතා කරලා කිව්වා ඇවිල්ලා වොයිස්කට් එකක් දෙන්න පුළුවන්ද කියලා කටුබැද්ද ඇවිදින මංතීරුව ගාවට, මම ඇහුවා මොකක් සම්බන්ධවද කතා කරන්නන ඕන කියලා, ඒ වෙලාවේ මට ඒ අය කිව්වේ ඩෙංගු මදුරු උවදුර සම්බන්ධව කතා කරන්න කියලා, මදුරු කීටයින් ඉන්නවා ඔවුන් දැකලා ඒ නිසා ඒ සම්බන්දයෙන් වොයිස්කට් එකක් දෙන්න කියලා. ඒ අවස්ථාවේ මම හිටියේ කොළඹ ඒ නිසා මන් කිවුවා මට දැන් මේ වෙලාවේ එන්න විදිහක් නෑ කියන එක. මම මතක් කරනවා පහුගිය අයවැය විවාදයේදී මම මේක කතා කරා, බජට් එකේ තමුන්නාන්සේලා ලක්ෂ හතරාහමාරක් වගේ පොඩි මුදලක් වෙන් කරලා තිබුනේ මේ වර්ෂය සඳහා ඩෙංගු උවදුරට. කොමසාරිස් පාලන කාලයේදීත් ලක්ෂ 10ක් වෙන් කරලා තිබුණ එක තමයි මේ අඩු කරලා තිබුනේ. මම ඒ ගැන විමසනකොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් මට කිවුවා මේ මුදල හොඳටම ප්‍රමාණවත් කියලා. මම ඇහුවාම ඇයි කියලා, අපි දැන් ඉස්සර වගේ නෙමෙයි ඩෙංගු බෝ වෙන ස්ථාන අපි හොඳට සුද්ද කරගෙන යනවා ඒ ඔක්කොම සුද්ද කරන නිසා මේ ලක්ෂ හතරහමාර ඇති කියලා. මම හිතන්නේ මේක ලක්ෂ 10 වුනත් මේක මදී. ඒ නිසා මේ ගැන විහිළුවට තකන්න එපා. ඉදිරියේදී මේ ක්‍රියාදාමයන්ගෙන් පස්සේ ඩෙංගු මරණ ඇති වුනාට පස්සේ ඒක කෙලින්ම චෝදනාව එල්ල වෙන්නේ නගර සභාවට නිසා ඒ ගැන දැඩි අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(11)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුවේ නගරයේ පුරා තමුන්නාන්සේලා පාලන බලය ගත්ත අලුතම ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ විශාල ව්‍යාපෘති කරා ලංකාව පුරාම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පෞද්ගලික ආයතන, පොලිසිය, නගර සභාව මේ සියල්ලක්ම එකතුවෙලා ඒ වැඩේ කලා සාර්ථකයි. ඒ වැඩේ කරලා ඉවරවෙලා තමුන්නාන්සේලා බලාපොරොත්තු වුනා මේ ආකාරයෙන් ඒක දිගටම පවත්වාගෙන යන්න. එක ප්‍රායෝගික නැහැ, අවසානයේ මේක ඔක්කොම එන්නේ නගර සභාවක් විදියට අපේ ඇඟට විතරයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරින් හැමදාම කුණු අදින්න එලියට බහින්නෙ නැහැ. පෞද්ගලික ආයතන වල ඉන්න විධායක ශ්‍රේණියේ ඉඳලා ඒ සේවකයින් කවදාකවත් පළවෙනි පාරට ගියාට ඊළඟ පාරවල් වල එන්නේ නැහැ. අපි තමයි හැමදාම මේක කරන්නට ඕනේ. අද මොරටුවේ නගරය තුළ විවිධ ස්ථාන වල කැළි කසල ගොඩගැහිලා තියෙනවා. විශේෂයෙන්ම කටුබැද්ද මංතීරුවේ දීර්ඝ කාලයක් තිස්සේ කුණු ටික ඇදගන්න බැරිවෙලා තියෙනවා. මම දැක්කා මේ ළඟදි දවසක්, දෙකක් ඇවිල්ලා ඒක ඇදීමක් කරනවා නමුත් විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ වගේම පාරවල් වලත් කැළි කසල තැන් තැන් වල තියෙනවා. හැබැයි මේක විධිමත්ව වැඩ පිළිවෙළක් යොදන්න කියන එක මතක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සභාවේ තිලකසිරි මන්ත්‍රීතුමත් මතක් කලා මේකේ මගෙත් තියෙනවා ඉල්ලීමක් විදියට අර මරණ ගෙදරකට ෆ්ලැෂර් ලයිට් එකක් දාන එක. එක ඇත්තටම වෙන්න ඕන දෙයක් මොකද හේතුව දීර්ඝ කාලයක් තිස්සේ මිනිස්සු මේක අපෙන් බලන් ඉන්නකොට මේක දැන් අපෙන් කෙරෙන්නේ නැහැ කිව්වහම ඒ මිනිස්සු එකෙන් සෑහීමකට පත්වෙන්නේ නැහැ. නගර සභාවක මූලික දෙයක් තමයි ජනතාව වෙනුවෙන් සේවය සපයන එක. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

**03(12)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නගර සභාවෙන් යම් යම් ස්ථානවලට යොදවන සේවකයන් හට ලබා දෙන මෙවලම් ප්‍රමාණවත් නැති තැන් තියෙනවා. සමහරක් වෙලාවට අපි ගෙවල් වලින් දෙන්න ඕන අවශ්‍ය කරන මෙවලම්. සමහරක් වෙලාවට ඒ අය වතුරට බහිද්දි මම දැකලා තියෙනවා ඔවුන්ට බූට්ස් නැහැ. මෙවැනි අනතුරු දායක තත්ත්වයන් තියෙනවා මේවා පාලනය කරගෙන මේ අයට අවශ්‍ය දේවල් ලබා දෙනවනම් ඔවුන්ගේ සේවය තවදුරටත් කාර්යක්ෂමව සිදුකරන්න පුවවන් කියන එක මේ ලිපි පෙත්සම තුළින් මම ඉදිරිපත් කරනවා.

**03(13)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම වාචික පැමිණිල්ලක් කරන්න කැමති, මම මේක පෙර සභා වාරයකදීත් සඳහන් කළා. ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා රාවතාවත්ත පොදු සුසාන භූමියට යන පාරේ දාපු බෝක්කුව සම්බන්ධයෙන්, ඒ බෝක්කුව දැම්මේ ප්‍රමිතියට අදාළ කම්බි නොවන බව මම ගිය සභාවෙදීත් සඳහන් කළා. නමුත් ඒක පිළිබඳව කිසිදු තැකීමක් දක්වන්නේ නැහැ කියන එක තමයි අපිට පෙන්නේ. නිලධාරින්ගේ පැත්තෙන් ගත්තත් ඒ පිලිබඳව කිසිම අවධානයක් යොමු කරන්නේ නැහැ. මම එදා කිව්වා ඒ බෝක්කුවට අදාල කම්බි නෙමෙයි දාලා තියෙන්නේ, ඒ මිලි 8 කම්බියක් කවදාවත් ඒ වගේ විශාල ප්‍රමාණයේ බෝක්කුවට දාන්න නිර්දේශ වෙන්නේ ඉංජිනේරු තාක්ෂණය අනුව නමුත් මේ පිළිබඳ අවධානය යොමු කරන්නේ නැහැ ඇයිද කියලා මං දන්නේ නැහැ? ඇත්තටම තමුන්නාන්සේලාට බලය දුන්නේ ජනතාව මීට වඩා විනිවිදභාවයකින් අරපරිස්සමෙන් වැඩ කරනවා කියන චේතනාවෙන්නේ. අපි දන්නවා සමහර

අය තුළ ඔබතුමා වගේ සමහර අය තුළ මේක ඒ ආකාරයෙන් තියෙනවා නමුත් මේක සිද්ධ වෙන්නේ නැති ප්‍රශ්නෙත් තියෙනවා. පෙර පරිදිම පෙර ආකාරයටම සමහර කොන්ත්‍රාත්කරුවන් සමහර ටීඕ මහත්වරු මේවා ගැන අවදානය යොමු කරන්නේ නැහැ. මහජන නියෝජිතයින් මේ ගැන අවදානය යොමු කරන්න ඕන. තාම මේ පිළිබඳව වැඩපිළිවෙළක් නෑ ඔහේ මූණිවත රැකගෙන යනවා. මම ඉල්ලීමක් කරනවා මේ බෝක්කුව කඩලා මින් ඉදිරියට එවැනි වංචා දූෂණ නොවන විදියට හොර කොන්ත්‍රාත් නොවන විදිහට වැඩ කරන්න අපි වග බලා ගන්න ඕන. ඒ නිසා ඒ බෝක්කුව කඩලා, ඒ දාලා තියෙන්නේ මම කියපු කම්බිය නොවුනොතින් මම මගේ වියදමින් ඒ බොක්කුව හදනවා. ඉතින් මෙහෙම කිරීම තුළින් සිද්ධ වෙන්නේ වංචා දූෂණයට අත වනනවා කියන ඒ ලේබල් එක දැන් ඔබතුමන්ලගේ පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන්ටත් මේ වනවිට වැදීගෙන යනවා. ඒක මේ සභාව ඇති කරගන්න එපා කියන ඉල්ලීම කරනවා. ලබන සභා වාරයට පෙර මේ දේ කරන්න කියලා ඉල්ලීම් කරනවා. මේ ඉංජිනේරු මහත්තයව මම පසුගිය දිනක ගිහිල්ලා හම්බවෙලා බිඩ්කිවු වාර්තාව ඉල්ලුවම ඉංජිනියර් මහත්මයාට තාම මට ඒක දෙන්න බැරි වුනා. පිටපතක් මට දෙන්න බැරි වුනා, ඇයි මට එක නොදෙන්නේ මොකක් හරි ඒ නිලධාරීන් තුළත් මේ කොන්ත්‍රාත්කාරුවන් තුළත් තියෙන නිසානේ එවැනි තත්ත්වයන් වලට මේ සභාව පත් වෙන්න තවදුරටත් ඉඩ තියන්න එපා. එ නිසාම තමයි මාලිමාට මේ නොදන්න සමාජ සේවයක් ගොඩක් දුරට නොවෙච්ච සුදුසුකම් නැහැ කියලා හැම හැම කෙනෙක්ටම මහජන නියෝජිතයෙක් වෙන්න සුදුසුකම් තියෙනවා. නමුත් ජනතාව ඒවා බලන්නේ නැතුව ඡන්දෙ දුන්නේ පසුගිය වකවානු වල සිදුවෙච්ච හොරකම් වංචා දූෂණ නැති කිරීමේ අරමුණින්. නමුත් එවා තවදුරටත් සිදුවෙනවනම් මේක රටට මොරටුවට කරන ලොකු අපරාදයක් එම තත්ත්වයෙන් මුදවා ගන්න ඔබතුමා මැදිහත් වෙන්න කියලා ඉල්ලීම් කරනවා.

**03(14)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පසු ගිය සභා වාරයක මේ ඉල්ලීම මා විසින් කරා ස්ලැබ් කැල්ලක් දාන්න කියලා මේ ජුවෙල් ලංකා එක ළඟට. මෙතන මොරටුවේ ජනාකීර්ණම තැනක්, එතන ඒක ආර්ඩීඒ එකට අයිතියි කියලා මගහරින්නේ නැතුව අපිට මේක කරන්න පුළුවන්. පසුගිය සභාවෙදී ඔසඳ මන්ත්‍රීතුමා මේක මතු කරා. මේක මේ සුළු දෙයක් මේ සඳහා ඉක්මනින් අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(15)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුවේ වෙළඳසැල් වල තියෙන පොල්තෙල් සම්බන්ධයෙන් මම පැමිණිල්ලක් කරා, ඉතාම දුර්වල ජාතියේ පොල්තෙල් වර්ගයක් තියෙන්නේ. මේවා සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන දැනුවත් කරලා ලිපියක් හරි යවන්න. මේ ජනතාව පරිභෝජනය කරන දේවල් ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න. මේවා ආහාරයට ඉතාම නුසුදුසු තත්ත්වයේ තියෙනවා. මෙවැනි දූෂණ වංචා වලට ඉඩ තියන්නේ ඇයි කියන එක අපි අහනවා මෙවැනි දේවල් සිදු කරන්න එපා කියන ඉල්ලීම කරනවා. මේ සඳහා අපේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානීතුමා හරි මැදිහත් වෙලා පරිභෝගික අධිකාරියට හෝ දැනුවත් කරලා පුළුවන් යම් දෙයක් කරන්න කියන ඉල්ලීම කරනවා. මේක අපි මේ සභාවේ කියනවා වාර්තාගත වෙනවා පහුවෙනිදට ඕක එතනින් එහාට නවතිනවා. එහෙම වෙන්න නොදී මොනව හරි ක්‍රියාත්මක වෙන වැඩපිළිවෙලක් හදන්න. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ සම්බන්දව කටයුතු කරන්න කියලා.

**03(16)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඩී. තිලක් විජේතුංග මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මා හට ලිපියක් ලැබීලා තිබෙනවා ඩබ්. එස්. ධනංජය මහත්මයා විසින් ඒ අතුරු මාර්ගයට කාණු පද්ධතියක් සහ කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනවා. මා විසින් සභාගත කරනවා මේ ලිපිය.

**03(17)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් පැමිණිලි අයිතම යටතේ වාචික කරුණක් ඉදිරිපත් කරන්න තියෙනවා. අපි කවුරුත් දන්නවා ඉදිරියේදී නිරිතදිග මෝසම් වැසි තත්ත්වය වර්ධනය වීමට නියමිතයි. පසුගිය කාලසීමාව තුළ අපිට අසාමාන්‍ය ලෙස උණුසුම් කාළගුණික තත්ත්වයක් තිබුණා. එතකොට මට හිතෙනවා ඒ අසාමාන්‍ය උණුසුම් කාලගුණ තත්ත්වයක් ඒ තිබුණු වටපිටාව ඇතුලේ ඊළඟට එන මෝසම ඉතාමත් දරුණු මෝසමක් බවට පත්වීමේ ඉඩක් තියෙනවා. අපි බලාපොරොත්තු වන ප්‍රමාණයට වඩා දැවැන්ත වර්ෂාපතනයක් පැමිණෙන්නට නියමිතව තියෙන්න පුළුවන් එනිසා ගරු නගරාධිපතිතුමනි මගේ ඉල්ලීම මේ පිළිබඳ සාමාන්‍යයෙන් අපිට තියෙන්නේ වැස්සහම වතුර එක් රැස් වෙන තැන් වලට යනවා ගෙවල් යට උනාට පස්සේ ඔක්කෝම උනාට පස්සේ තමයි යම් තීරණ ගන්නේ. නමුත් මේ කාලගුණික තත්ත්වය පිලිබඳ යම්කිසි පුරෝකතනයක් කර ඉදිරියේදී ඒ තත්ත්වයට ඔරොත්තු දෙන විදියට අපේ මොරටුවේ ඒ ජලය එක් රැස්වන තැන් එහෙම නැත්නම් ඒ බ්ලොක් වෙලා තියෙන තැන් ඒ පිළිබඳ අධ්‍යයනයක් කරලා ඉක්මනින්ම යම්කිසි මෙහෙයුමක්, සෞඛ්‍ය අංශය වෙන්න පුළුවන්, කර්මාන්ත අංශ වෙන්න පුළුවන් යම්කිසි මෙහෙයුමකට වැඩපිළිවෙළක් හදන්න කියලා ඉක්මනින් මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. මේක ගත්තොත් එහෙම මේ පැත්තෙන් වේරැස් ගඟ වෙන්න පුළුවන් බොරුපන, තෙලවල පැත්තෙන් වෙන්න පුළුවන්, කොරවළවැල්ල එගොඩඋයන ඒ පැත්ත ගැන ඔබතුමා හොඳටම දන්නවා. රේල් පාරවල් ක්‍රොස්වෙන තැන් එතකොට මේ තැන් වල ඔබතුමා යම්කිසි මම දන්න විදිහට බහුජනතාවත් එකතු කරගත්තු යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මොකද සේනක දමයන්ත ගරු මන්ත්‍රීතුමත් තවත් මන්ත්‍රීතුමියක්ගෙන් හරි කියවුනා ඩෙංගු සම්බන්ධයෙන් මොකද මේ සියල්ලට කලින් අපි සූදානම් වුනොත් අපට ලොකු විනාශයන් අවම කර ගැනීමේ හැකියාවක් තියෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය මම යොමු කරනවා.

**03(18)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම සුපුරුදු පරිදි ඉල්ලා සිටින්නේ අපේ ඉංජිනේරු මහත්මයා නැහැ, සමන්ත මන්ත්‍රීතුමාත් මතු කරා එක දෙයක්. ඒ ස්ලැබ් එක ලුණාව මංසන්ධියේත් ඒ ස්ලැබ් එක දාන්න කියලා ඉල්ලීමක් කරා එම ඉල්ලීම කරනවා නැවත වතාවක්. ස්ලැබ් කැලි දෙකක් විතරයි එතනට දාන්න තියෙන්නේ. එක පිළිබඳව මම නැවත වාතාවක් ඔබතුමාට සිහිකැඳවීමක් කරනවා.

**03(19)** <u>**මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දූලිප් තිසේරා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මුලින්ම ස්තුතිවන්ත වෙන්න ඕන ගිනි නිවීමේ ඒකකයට මොකද එගොඩඋයන උතුර නිවසක් ගිනි ගත්තා ඒ අවස්ථාවේදී මම දැක්කා ගොඩක්ම මහන්සි වෙලා ඒ ගිනි නිවීම් කටයුතු කරා. ඒ සම්බන්ධව ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. ඒවගේම ඒ මිනිස්සු ඇඳන් හිටපු ඇඳුම පිටින් එළියට බැස්සේ ඒ නිසා ඒ වේලාවේ ඉල්ලීමක් ආවා අපි රුපියල් 1000 ගානේ හරි එකතු කරලා මේ නිවස හදලා දෙමු කියලා කට්ටිය. අපි එකතු කිරීම කරා. ඒ මිනිස්සු පහුවෙනිදා මට කිවුවේ නගරාධිපතිතුමාව හම්බවෙන්න යමු කියලා. අපි ඔබතුමාව හම්බවෙන්න ආවා ඒ අවස්ථාවේදී ඔබතුමා නගරාධිපති අරමුදලින් රුපියල් ලක්ෂයක මුදලක් ලබා දුන්න ඒ පිළිබඳව

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. නමුත් ඒ දීපු මුදල නෙමෙයි ඔබතුමන්ලාගේ ජේවීපී ෆේස්බුක් පේජ් එකේ දාන්නේ මුලා අරමුදලක් ලබා දුන්නා කියලා. ගමේ අපි එක්කහු කරලා තමයි අනිත් මුදල් ලබා දුන්නේ ඔබතුමා ලබා දුන්නේ ලක්ෂයක මුදලක් විතරයි. ඔබතුමන්ලා මේ විදිහට සමාජ මාධ්‍ය වල දානකොට අපිට ගමේ ගිහින් සල්ලි එකතු කරන්න බැහැ. මොකද නගර සභාවෙන් හදනවනේ කියලා ගමේ මිනිස්සු අපිට කියනවා. ඔබතුමා මටත් කලින් එතනට ඇවිත් තිබුනා ලක්ෂ 25ක පමණ හානියක් ඒ මිනිස්සුන්ට වෙලා තියෙනවා ඔබතුමා දැක්කා. ඒ නිසා ඉල්ලීමක් කරනවා පුළුවන්නම් ඒ පේජ් එකට ඔබතුමන්ලා දීපු මුදල දාන්න මොකද නැත්නම් ඒ ගමේ මිනිස්සු හිතන්නේ ලොකු මුදලක් දීලා කියලා එකෙන් අපිට එකතු කරන්න බැහැ එහෙම එකතු කරාම අපිව හොරු කියලා හිතනවා. මම පුද්ගලිකව රුපියල් පනස්දහසක මුදලක් ලබා දුන්නා නමුත් අපි ෆොටෝ දාන්න ගියේ නැහැ. ඒ නිසා මේය නිවැරදි කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(20)** <u>මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මේ සභාවට එවනවා ධීවර නිවාස අළුත්වැඩියා කරලා දෙන්න කියලා ඉල්ලීමක්. ඔබතුමා එක න්‍යාය පත්‍රයට දාලා නැහැ. ඒ වගේම මම තව යෝජනාවක් එවනවා ගලි බවුසර් ටික අළුත්වැඩියා කරලා දෙන්න කියලා ඉල්ලීමක්. මට මතකයි ඔබතුමා නගරාධිපති අපේක්ෂක වෙලා ඉන්න කාලයේ, මමයි මගේ මිතුරෙකුයි පෞද්ගලිකව එකතු වෙලා හදපු මෝටරයක් තියෙනවා. එතකොට අපිට කිවුවා මේ ටික හදලා දෙන්නම් කියලා ඔබතුමා නගරාධිපති නෙමෙයි එතකොට අපේක්ෂකයෙක් විතරයි. අපි බලන් හිටියා ඔබතුමා ගමට දෙයක් කරයි කියලා. ඡන්දයක් එන වේලාවේ ඔබතුමාට හදන්න එන්න බැහැ නමුත් අපි හදන්න ඉඩ දුන්නා. දැන් ඔබතුමා මට කියනවා ඒ ගලිය හදන්න බැහැ කියලා. ඒ නිසා එහෙම කරන්න එපා මෝදර ඉන්න ජනතාව ඇවිල්ලා පැමිණිලි කරන්නේ මට ඔබතුමා එන්නෙත් නැහැ ඉන්න මන්ත්‍රීවරු වැඩක් කරන්නෙත් නැහැ. අපි කරනවනම් අපිට ඒ වැඩේ කරන්න දෙන්න. මදුරුවන්ට දුමක් ගහගන්න බැහැ, තෙල් ටිකක් ගහගන්න බැහැ, මළගෙදරකට ලයිට් එකක් දාගන්න බැහැ. ඒ නිසා අපි එවන යෝජනාත් ඇතුළත් කරන්න කියලා ඉල්ලනවා. ඒ වගේම මේ වැඩේ කරලා දෙන්න කියලා ඉල්ලනවා.

**03(21)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයවන හා පෙත්සම් අයිතමය යටතේ වාචික කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. මොරටුවේ ප්‍රධාන පාරේ තිබෙන වීදි ලාම්පු රාත්‍රී කාලයේදී කීපයක් දැල්වෙන්නේ නැහැ. මම මේ සම්බන්ධයෙන් ගිය සභා වාරයේදීත් දැනුවත්කරා. සොයිසාරාම විහාරස්ථානය ඉදිරිපිට, එතන තියෙනවා මංතීරුවක් මේ මංතීරුවේ රාත්‍රී කාලයේ ජනතාව පාර මාරු වෙනකොට වාහන වලට ඒ මිනිස්සුන්ව පෙන්නේ නෑ. එම ස්ථානය ඇතුළුව මොරටුවේ තව තැන් කිහිපයක් තියෙනවා මෙම ප්‍රධාන පාර වීදි ලාම්පු දැල්වෙන්නෙ නෑ මොකද හේතුව ඇත්තටම සභාවට නෙමෙයි තියෙන්නේ මේක ආර්ඩීඒ එකට තමයි මම දැනුවත්ව තිබෙන්නේ. ඒ සඳහා ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

**03(22)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කල්දමුල්ල පාර කොටසක ප්‍රිමික්ස් දමා සකස් කරා ගිය සතියේ ඉතිරි කොටසත් ඉක්මනින් සංවර්ධනය කරලා දෙන්න කියලා නැවත මතක් කරනවා.

**03(23)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ නගර සභාවේ තක්සේරු දෙපාර්තමේන්තුවට යන අතරතුර ඒකෙ ප්‍රධාන නිලධාරී ඇතුළු නිලධාරීන් කිහිපදෙනා බය වෙලා තියෙනවා ඌරු මීයන්ගෙන් පිරිලා අනික ඒ තැන ජරා වෙලා. ඒ ඩිපාර්ට්මන්ට් එකේම කට්ටිය බය වෙලා මම දැක්කා දැන් ඊයේ පෙරේදා නම්

අර පුටු ටික ඔක්කොම අස් කරලා තියෙනවා. නමුත් තාම අර ෆයිල් වගයක් තියෙනවා අස් කරන්න. ඉතා ඉක්මනින් ඒ ටික අස් කරලා ඒ අර ඌරු මීයන් විනාශ කරන්න ක්‍රියාමාර්ගයක් ගන්න කියන ඉල්ලීම කරනවා.

**03(24)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙත් ඒසී වැඩ කරන්නේ නැහැ කාලයක් තිස්සේ. ඉතින් දැනුවත් කරලා තියෙනවා කියලා කියනවා ඒ සඳහා පොඩ්ඩක් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

**03(25)** <u>මහා නගර සභා මන්ත්‍රී - හරීෂ් චන්දන පිලානවිතානගේ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන හා පෙත්සම් යටතේ වාචික කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම කටුබැද්ද සහ ලුණාව ඇවිදින මංතීරුවල ඇතිවෙලා තියෙන ඒ තත්ත්වය ජනතාවට ශාරිරික සුවතාවය ඇති කරගෙන මානසික යම් සහනයක් සලසා ගන්න පුළුවන් ස්ථාන මේ ස්ථානවල යම් ආකාරයක පරිහරණය කිරීමට නොහැකි තත්ත්වයක් උදාවෙලා තියෙනවා. විශේෂයෙන්ම ලුනාව ඇවිදින මංතීරුවේ ඔබතුමා හොඳින්ම දන්නවා දැඩි දූර්ගන්ධයක් වහනය වෙනවා. මේ දූර්ගන්ධයට හේතුව සම්බන්ධයෙන් විවිධ මත පලවෙලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි මේ සම්බන්ධව අපි පුළුල්ව සොයා බැලීමේදී අපිට දැනගන්න ලැබිච්ච කරුණක් තමයි මෙයට ප්‍රධානම හේතුවක් වන්නේ මේ කානු පද්ධතියට මුදා හරිනු ලබන බහිස්ස්‍රාවිය ද්‍රව්‍යන් විශේෂයෙන්ම කානු පද්ධතියට අවසරයකින් තොරව නීති විරෝධීව මේ දමනු ලබන මේ බහිස්ස්‍රාවිය ද්‍රව්‍යයන් තුළින් නයිට්‍රේට් ප්‍රතිශතයක් ඇතිවෙනවා. ඒ නයිට්‍රේට් නිපදවෙලා ඒ නයිට්‍රේට් වලින් තමයි ඇල්ගී හැදෙන්නේ ඒ ඇල්ගී වර්ධනය වෙලා වර්ධනය වීම තුළදී දූර්ගන්ධයක් පිට වෙනවා ඒ වගේම ඇල්ගී මිය යන අවස්ථාවේදී දූර්ගන්ධයක් පිටවෙනවා. මේ සම්බන්ධයෙන් තාක්ෂණික වාර්තාවක් කැඳවලා විශේෂඥභාවයක් තියෙන ආයතනයකින් වාර්තාවක් කැඳවලා මේ ඇල්හී මර්දනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරොත් ඒ දූර්ගන්ධය නවත්ව ගන්න පුළුවන්. විශේෂයෙන්ම ලුණාව ඇවිදින මන්තීරුව අද ජනතාව පරිහරණයට නොගන්නා තත්ත්වයක් ඇති වෙලා තියෙනවා මේ තත්ත්වය ඉතාම බරපතල තත්ත්වයක් විශේෂයෙන්ම ජනතාවගේ ශාරීරික සුවතාවය සහ ජනතාවට යම් ආකාරයකට මානසික සහනයක් ලබාගන්න පුළුවන් ස්ථාන ඒවා ආරක්ෂා සහිතව පරිහරනය කිරීමේ අවස්ථාව උදා කර තහවුරු කිරීම නගර සභාවේ වගකීමක්. ඉතා ඕනෑකමින් මා ඉල්ලා සිටිනවා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියලා.

**03(26)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් යටතේ කරුණක් ඉදිරිපත් කිරීමට කැමති. විදුලි දෙපාර්තමේන්තුවට වසර පහකට කලින් කෲව් කැබ් එකක් තිබුණා මේ කෲව් කැබ් එක හොඳට පරිහරණය කිරීමට පුළුවන් ත්ත්වයේ තිබුණා. ඒක අලුත් වැඩියා කටයුතු සඳහා ගරාජ් එකට දාලා තියෙනවා දැන් වසර ගාණනාවක් තිස්සේ. නමුත් තාම මේක හදලා ගෙනාවේ නැහැ. ඉතින් ඒ කෲව් කැබ් එක තිබ්බනම් ලොකු සේවාවක් කරන්න පුළුවන්, දැන් ත්‍රිවිලර් එකේ ගියාම මේ සේවාව කරන්න හරි අමාරුයි. කෲව් කැබ් එකේ ගියාම 7 දෙනෙකුට විතර යන්න පුළුවන් ඒ අයව ගිහිල්ලා ඒ තැන්වලට දාලා ඒ වැඩ කටයුතු කරන්න පුළුවන් තත්ත්වයක් තිබුණා. දැන් ඒ තත්ත්වය ඇහිරිලා තියෙනවා. එම නිසා මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(27)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, බාහිර පාර්ශවයකට දීලා තියෙනවා අලුත් වැඩියා කටයුතු සඳහා අපේ ගිනි නිවන එකකයේ ගිලන් රථය. එකත් වසර ගණනාවක් තිස්සේම හදලා ගෙන්නේ නැහැ. මොකද මේ අත්‍යාවශය වාහන දෙකක් තමයි මේ වසර ගානක් තිස්සේ බාහිර තැන්වල තියාගෙන අළුත්වැඩියා කටයුතු නොකර ඉන්නේ. ඉතින් ඔබතුමාට මේ වාහන අලුත් වැඩියා කරන අංගනයට අපේ මන්ත්‍රීවරු දෙන්නෙක් පත් කරලා තියෙනවා මේ සම්බන්ධයෙන් සොයා බලන්න. දැන් මේක පොඩ්ඩක් හුළඟේ යවන්නැතුව හෙට අනිද්දට ගිහිල්ලා මේ ගැන හොයලා බලන්න. මීලඟ සභාවෙදී මේ සඳහා අපි උත්තරයක් බලාපොරොත්තු වෙනවා. අපි මේ ඉල්ලන්නේ සේවකයින්ගේ ඉල්ලීම්. අපේ මන්ත්‍රීවරුන්ව යොදවලා මිලඟ සභා වාරයට පෙර මෙහි අවත්වැඩියා කටයුතු නිම කරලා මොකද්ද කරන්න පුළුවන් කියන එක ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම කරනවා.

**03(28)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඒ. ඩී. බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයවනා හා පෙත්සම් පැමිණිලි යටතේ ලිපියක් ලැබිලා තියෙනවා මට ආසිරි ප්‍රදේශයේ ජනතාවගෙන්. අත්සන් සහිතව ඔවුන් ඉල්ලා තියෙනවා ආසිරි පෙදෙස සංවර්ධනය කරලා දෙන්න කියලා. ඔබතුමත් දන්නවා ඇති මමත් ඉතාම හොඳින්ම දන්න කාරණයක් පහුගිය මැතිවරණ දෙකේම ඔබතුමාලාට ආසිරි පෙදෙසේ බහුතරයක් දෙනා ඡන්දය දුන්නා. ඒ මැතිවරණ තුළදී ඔබතුමන්ලාගේ ආධාරකරුවන් ගිහිල්ලා ඔවුන්ට පොරොන්දු වුනා ඒ පාර සංවර්ධනය කරලා දෙනවයි කියලා ඒ පාර වැසි කාලයේදී එළියටවත් බහින්න බැරි තරමටම වතුර පිරෙනවා. ඒ වගේම තමයි කඩතොලු හැම තැනම ඉතින් මම ඉල්ලීමක් කරනවා ඒක සංවර්ධනය කරලා දෙන්න කියලා. ඒ වගේම තමයි සෑම වර්ෂයකම කොරලවැල්ල ශාන්ත මයිකල් දේවස්ථානයේ මැයි මංගල්‍යය යන්නේත් ඔය මාර්ගයෙන් මෙවරත් එම මාර්ගයේම තමයි යන්නේ, ඉදිරියට වැසි කාලයක් එන්නේ ජනතාව අපහසුතාවයට පත්වෙනවා. එනිසා ඔබතුමාගේ කාරුණිකව අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

**03(29)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඒ. ඩී. බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මට ලිපියක් ලැබිලා තියෙනවා ආසිරි ප්‍රදේශයේම නිවැසියන් කිහිපදෙනෙක්ගෙන් ජල ගැටලුවක් සම්බන්ධව. ප්‍රථමයෙන් මම ස්තුතිවන්ත වෙනවා මීට මාස දෙකකට පෙර මෙම සභාවෙම මම ඉදිරිපත් කරපු ඉල්ලීමකට අනුව කොරළවැල්ල ධීවර නිවාස පෙදෙසේ ජල ගැටළුවක් තිබුණා දැන් එක අලුත්වැඩියා කටයුතු කරලා දැන් ඒගොල්ලොන්ට ඒ ජල සැපයුම හම්බෙනවා හැබැයි ධීවර නිවහන් පෙදෙසේ වතුර පෝළිම් ඉවර වෙද්දී දැන් ආසිරි පෙදෙසෙ වතුර පෝලිම් ඇතිවෙලා තියෙනවා. ඉතින් සමහර නිවැසියන්ට ඉතාමත් අඩු පීඩනයකින් එන්නේ ජල සැපයුම ඒ වගේම තමයි සමහර අවස්ථාවල ජල සැපයුම එන්නේම නැති තරම්. මේ පිළිබඳවත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා ඉතාමත්ම හැකි ඉක්මනින් මොකද වතුර කියන්නේ මිනිසුන්ගේ මූලික අවශ්‍යතාවයක් ඉතාමත්ම හැකි ඉක්මනින් ඒ ආසිරි පෙදෙසේ නිවැසියන්ට වතුර ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(30)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඒ. ඩී. බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කොරලවැල්ල අංක 34/1 කොරළවැල්ල මොරටුව රවි පෙරේරා, එතුමා මට ලිපියක් ලබා දීලා තියෙනවා එතුමා ජීවත් වෙන්නේ කොරළවැල්ල නාගසේන විදුහලට යන මාර්ගයේ, එම මාර්ගයේ මිනිසුන් විසින් කුණු දාලා තියෙනවා ඉතින් එතුමා ඉල්ලීමක් කරලා තියෙනවා එතනට දැන්වීම් පුවරුවක් සවි කරන්න කියලා. කුණු දැමීම තහනම් කියලා ඒ වගේම තමයි මම පොඩ්ඩක් මතක් කරන්න ඕන මීට මාස දෙකකට කලින් ඔබතුමාට ලිපියක් ලබා දුන්නා

කොරළවැල්ල මහවිදාන මාවතේ කුණු ගොඩක් සම්බන්ධව. එත් ඒ කුණු ටික අයින් කරලා එතනටත් දැන්වීම් පුවරුවක් සවිකරලා දෙන්න කියලා කුණු දැමීම තහනම් කියලා. හැබැයි කියන්න කණගාටුයි දැන් මාස දෙකක් වෙනවා කුණු ගොඩ එහෙම්මමයි තාම දැන්වීම් පුවරුවක් තියා කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මෙහෙම ගියොත් මුළු මොරටුවම කුණු ගොඩක් වෙනවා. ඉතින් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා.

**03(31)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඒ. ඩී. බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වාචක පැමිණිල්ලක් තියෙනවා නගර සභාවේ වීදි පහන් සම්බන්ධව. කනගාටුයි කියන්න මාස දෙක තුනක් පුරාවටම වීදි පහන් නඩත්තුව අලුතින් වීදි පහන් දැමීම නගරය පුරාම ඇනහිටලා තියෙනවා. වීදි පහන් තියෙන්නේ වරිපනම් ගෙවන ජනතාවගේ පාරවල් ආලෝකමත් කරන්න ඒ වගේම ඒ ජනතාවගේ ආරක්ෂාවට ඒ වගේම රාත්‍රී කාලයේ ගමන් ගන්නා වාහන වලට පහසුවක් වෙන්න. ආණ්ඩුව බාල ගල් අගුරු ගෙනාවා කියලා ජනතාව පලි නැහැ.ආණ්ඩුව කරන වැරදි මොරටු ජනතාවගේ පිටින් දාන්න එපා. ඒ නැවතත් වීථි පහන් සේවාව මොරටුව ජනතාවට දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

මහා නගර සභා මන්ත්‍රීවරුනි,පෙත්සම් පැමිණිලි අයිතමය අවසන් කරනවා. ඉල්ලීමක් කරනවා මට දැනෙන විදිහට මම දන්න විදිහට ඔබ ඉදිරිපත් කරපු බොහෝ කාරණා පිළිගන්න ගමන් හැබැයි කළ හැකි කළ යුතු බොහෝ දේ කරන්න ඔබ මට කතා කළා නම් මෙතන මහා ලොකුවට ඩෙංගු කතන්දරයට අදාළව ගොඩාක් දේවල් කිව්වා. කතා කරපු හැමදේම සත්‍යයක් තිබෙනවා. මට කියපු කාරණාවලදී මම මගහැරීමක් කරල තිබෙනවා නම් මම හැමවිටම ඔබ කතා කරානම් ප්‍රශ්නයක් පිළිබඳව මන් කඩිනමින් ඒ වැඩේට මැදිහත් වෙලා තිබෙනවා. සමහර කාරණා පොඩි අසීරු කාරණා මගහැරීම් කරගන්න බැරි ඒවා තියෙන්න ඇති එනිසා මම කියන්නේ ගෙයක් ගිනි ගත්තා. හැබැයි වෙන කවරදාටත් වඩා ඉක්මනින් අදාළ මන්ත්‍රීවරයා ඇවිල්ලා කිව්වා.නගරාධිපති අරමුදලින් ලක්ෂයක් දුන්නා. හැබැයි එවැනි එකක් වුණත් නැවත විවේචනයක් ගේනවා.අපිට නිශ්චිත මුදලක් දෙන්න කියන එකක් නැහැ. අපේ ජනතාවට යම් හානියක් වුණාම යම් උපකාරයක් කරන්න ඕන කියන අදහස අදාළ කොට්ඨාසයේ මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා කිව්වම ඒකත් සැලකිල්ලට අරගෙන කරනවා. ධීවරපුර නිවාසවල වත්තෙ තිබ්ච්ච තත්වය ඔබ අපි දන්නවා. මොන අමාරු කම් තිබුණත් ඒ තත්ත්වය වෙනස් කළා. ඒ වෙනස් කිරීමට අදාළ කරන මැදිහත්වීමක් කළා. රජයේ මුදල් වලින් මිලියන තුනක් දාලා තියෙනවා කරගන්න විදිහක් නැහැ. අපි වියදම් කරපු මුදල ගෙවා ගන්න බැරුව ඉන්නවා. නීතිමය ගැටලුවක හිරවෙලා. මම කියන්නේ ඔබ උදව් කරනවනම් ඔබ දේශපාලන වාසියක් නොගෙන අවංකවනම් විවේචන ඇතුලේ මාත් එක්ක ඉන්නවානම් මම හොඳටම ඇහුම්කන් දෙන කෙනෙක්. මම හොඳටම ඒක කරන්න උත්සාහ කරන කෙනෙක්. කවදාවත් ඔබේ හිත්රිදවන්න කටයුතු කරල නෑ. කරන්නෙත් නෑ. මටත් ඕන ඔබටත් ඕනා ඔබ ජීවත් වෙන ඒ ප්‍රදේශවල ජනතාවගේ ප්‍රශ්න ටික විසඳන්න. සමහර කාරණා නිලධාරීන්ගේ පැත්තෙ විශාල අඩුපාඩුකම් ටිකක් තියෙනවා. හැබැයි ඉතින් මම මේකෙ පාලකයා විදියට නිලධාරීන් ආරක්ෂා කරගෙන යන්නත් ඕනා. සමහර නිලධාරින් ආරක්ෂා කරගන්න බැරිසීමාවකට ඇවිල්ලත් තිබෙන බව දන්නවා.මම කියන්නෙ උදවු කරන්න . අපි සහයෝගයෙන් මොරටුවෙ වැඩේ කරමු.

## 04. ප්‍රශ්ණ -

**04(01) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න,**

1.මොරටුව මහා නගර සභාවේ නිල වාහන පාවිච්චි කිරීමට නෛතික හිමිකමක් ඇති නිලධාරින්ගේ තනතුරු සහ එම තනතුරු දරණ නිලධාරීන්ගේ පෞද්ගලික නම් මොනවාද?

2.දැනට ඉහත අංක 01 හි සඳහන් නිලධාරීන්ගෙන් නිලධාරීන් කොපමණ ප්‍රමාණයක් මොරටුව මහා නගර සභාවේ නිල වාහන පාවිච්චි කරනු ලබන්නේද?
එම නිලධාරීන් ගේ තනතුරු සහ නම් මොනවාද?

3.මොරටුව මහා නගර සභාවේ නිල වාහන පාවිච්චි කරන ලබන නිලධාරින් සඳහා නිල වාහන ලබාදීමේදී ගමන් කළ හැකි උපරිම කිලෝමීටර ප්‍රමාණයක් නෛතිකව සඳහන් වී ඇත්ද?
වාහන පාවිච්චි කරන ලබන නිලධාරීන්ගේ ගමනාන්තයන් මොනවාද?

I. එසේ සඳහන් වී ඇත්නම් ඒ කොපමණ කිලෝමීටර ප්‍රමාණයක්ද?
II. දෛනිකව කාර්යාලයට පැමිණීමට හා නිවස බලා නැවත යාමට වාහන යෙදවීමේදී එක වාහනයකට එක් නිලධාරියෙකු පමණක් ගමන් කරන්නේද?
එසේ නැත්නම් නිලධාරීන් කිහිප පලක් ගමන් කරන්නේද?
එසේ කිහිප පලක් ගමන් කරන්නේනම් එසේ ගමන් කරනු ලබන නිලධාරීන් කවරෙක්ද?
ඔවුන්ගේ කණ්ඩායම් වශයෙන් එන අයගේ නම් හා තනතුරු මොනවාද?

4.මොරටුව මහා නගර සභාවේ සේවයේ නියුතු නිල වාහන හිමි නිලධාරින්ගෙන් කී දෙනෙකු නිල වාහන වෙනුවට ගමන් වියදම් දීමනාව ලබා ගන්නේද?
එසේ ලබාගනු ලබන නිලධාරීන්ගේ නම සහ තනතුරු මොනවාද?
ඒ ඒ නිලධාරීන් ලබාගන්නාවූ ගමන් වියදම් දීමනාව කොපමණද?

5.ඉහත අංක 04 හි සඳහන් ගමන් වියදම් දීමනාව ලබාගන්නා නිලධාරීන් හට සභාව මඟින් ගමන් වියදම් දීමනාව ගෙවීම සිදුකරනු ලබන්නේ ඔවුන්ගේ පෞද්ගලික වාහන මඟින් ගමන් පහසුකම් ලබා ගැනීම වෙනුවෙනි. එම නිසා එසේ ගමන් වියදම් දීමනාව ලබාගන්නා වූ නිලධාරීන් විසින් ඔවුන් ගමන් පහසුකම් ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන වාහන වල අංක මොනවාද?
එම වාහන මොරටුව මහා නගර සභාව වෙත දෛනිකව ප්‍රවේශ වනවාද?
ඒ ඒ නිලධාරීන් භාවිතා කරනු ලබන වාහන වල මාදිලිය සහ අංකය මොනවාද?

6.නිල වාහන වෙනුවෙන් ගමන් වියදම් ලබාගන්නා නිලධාරින් ගේ නම් සහ ලබාගන්නා මාසික ගමන් වියදම් දීමනාව කොපමණද?

7.නිල වාහන දීමනාව ලබාගන්නා නිලධාරීන්ගෙන් පොදු ප්‍රවාහන සේවය මඟින් සේවයට වාර්ථා කරන නිලධාරීන් සිටීද?
ඔවුන් කවරෙක්ද?
ඔවුන් පැමිණෙන්නේ කොහේ සිටද?

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 04(01) ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට මාසයක් කල් ඉල්ලා සිටිනවා.

## 05. <u>යෝජනා -</u>

**05(01) මහා නගර සභා මන්ත්‍රී, පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

එගොඩඋයන නදී මාවත ගඟට ඇති දෙවට පාර (ස.ණ.ස ඉදිරිපිට) අඩි 03 ක් පළල හා මීටර් 250 ක් පමණ දිග මෙම පාර තැනින් තැන වලවල් හැරී ඇත. වැහි දිනවලට තනිකරම මඩ වලකි. එම නිසා මෙම පාර පළමු වරට කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී එල්. ඩී. රොෂාන් කුමාර පෙරේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි 05 (01) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

05(02) **මහා නගර සභා මන්ත්‍රී ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

මොරටුව ප්‍රදේශය යනු කලාව, සාහිත්‍ය, සෞන්දර්යයට වඩාත් ප්‍රිය කරන හා ඒ පිළිබඳව හැකියාවන් සහිත නිර්මාණශීලි ජනතාවක් ජීවත් වන ප්‍රදේශයකි. එබැවින්, 2026 සාහිත්‍ය උළෙල එකි ජනතාවට සහභාගි විය හැකි ඔවුන්ගේ නිර්මාණ සඳහා අවස්ථාව ලබාදීම වෙනුවෙන් වඩාත් අධ්‍යාපනික හා විචිත්‍රවත් සාහිත්‍ය උළෙලක් පැවැත්විය යුතු යැයි යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී ඩී. සමන්ත සිල්වා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කෙටි අදහසක් ඉදිරිපත් කරනවා වැඩි වෙලාවක් ගන්නේ නෑ. ඔබතුමා ඉදිරිපත් කරපු අදහස මම පිළිගන්නවා කරදියාන ප්‍රශ්නේ. ගරු නගරාධිපතිතුමනි, මෙම යෝජනාව පිළිබඳ මා බලාපොරොත්තු වෙන දේ පිළිබඳව මා විසින් සකස් කල ව්‍යාපෘති වාර්තාවක් මීළඟ මහජන උපයෝගිතා කමිටුවට ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. ඊට පස්සේ පුළුවන් අපට ඒ ගැන සාකච්ඡා කරන්න. මොරටුව මහා නගර සභාවේ අප විසින් සාම්ප්‍රදායිකව සිදුකරණ සාහිත්‍යාංජලි සාහිත්‍ය උළෙලට අමතරව මොරටුවේ ජනතාවට මොරටුවේ දරුවන්ට සහභාගි වෙන්න පුලුවන් ඒවගේම මොරටුවේ තිබෙන රාජ්‍ය ආයතන සම්බන්ධ කරගත් දැවැන්ත විදියේ සාහිත්‍ය කලා මහෝත්සවයක් පැවැත්වීම තමයි මගේ යෝජනාව තියෙන්නේ. මං ඒ සඳහා ගරු නගරාධිපතිතුමනි ව්‍යාපෘති වාර්තාව මහජන උපයෝගිතා කමිටුවට ඉදිරිපත් කරනවා.

යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි 05 (02) යෝජනාව ඉදිරි කටයුතු සඳහා මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

## 06. 2026 අප්‍රේල් මස ස්ථාවර කමිටු වාර්තාවල නිර්දේශයන් සලකා බැලීම.

### 06(1) 2026.04.06 දින පැවති ආයතනය හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, 03 කරුණ, සුදේශ් ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා යෝජනා කරලා තිබෙන සෞඛ්‍ය කම්කරු හා වැඩ ක්ෂේත්‍ර කම්කරු පත්වීම් 20කට අධික පිරිසක් විශ්‍රාම ගිහිල්ලා තියෙනවා ඒනිසා මැන් පවර් හරහා 20ක් ගන්නවා කියන එකට අපි විරුද්ධයි. මොකද හේතුව එහෙම ගන්න බෑ නීත්‍යානුකූලව අපි දන්න විදිහට නම් ගිවිසුම ගැහුවට පස්සේ.ඒකට අපි අපේ විරුද්ධත්වය පළකරනවා. කොහොමත් අපි විරුද්ධයි. එහෙම ගන්න බෑ කියන තැන තමයි අපි ඉන්නේ.සාමාන්‍යයෙන් එහෙනම් ගිවිසුමක් ගහන්න ඕනේ නැනේ. ගිවිසුමක් ගහලා තියෙද්දි එහෙම ගන්න බෑ. ඊළඟ අවුරුද්ද වෙනකම් ඉවසගෙන ඉන්න වෙනවා ගිවිසුම ඉවර වෙනකම්. ඔබතුමාගේ අවධානය යොමු කරනවා 07 වන කරුණ සම්බන්ධයෙන්. එම කරුණෙන් සැපයුම් අංශයේ අතිකාල ගෙවීම සම්බන්ධව ඉල්ලීමක් කරලා තියෙනවා.ඒකට මුදල් කමිටුවේදී තීන්දුවක් අරන් තිබ්බා නමුත් මේක ආයතන කමිටුවේ තියෙන නිසා ආයතන කමිටුවෙන් තීන්දුව අරන් තියෙන්නේ ඉහත වාර්තාව නිර්දේශ කර මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට ඉදිරිපත් කරනවා කියලා.නිර්දේශ කරලා ඉදිරිපත් කරලා තියෙන්නේ. අතිකාල දීමනා වලට අපේ සමහර සෞඛ්‍ය කම්කරු අතිකාල දීමනා ඉල්ලුවම ප්‍රතික්ෂේප කරලා තිබ්බා. අපේ ප්‍රධාන පරිපාලකලා අතිකාල ඉල්ලුවම ඒවා ප්‍රතික්ෂේප කරලා තියෙනවා. හැබැයි මෙතනදි මේ අතිකාල දීමනා ඉල්ලන්නේ සැපයුම් අංශයේ උදවිය.ඒක පුදුමාකාර විදිහට තමයි ඉල්ලලා තියෙන්නේ.ඒක මම මුදල් කමිටුවේදි කතා කරන්නම්.තියෙන ගැටලුව තමයි ඔබතුමාගේ අවධානය යොමු කරන්න සැපයුම් අංශයේ ඔක්කොම නෙමෙයි සමහරු කරන්නේ තමන්ගේ ළමයව ඉස්කොලේ එක්කන් යන එකයි ළමයව ගෙදර එක්කන් යන එකයි ළමයට කවන එකයි ළමයාගේ වැඩ කරන්න තමයි මේ OT එක ඉල්ලන්නේ.ගෙදර වයිෆ්ගේ වැඩ කරන්න තමයි මේ OT ඉල්ලන්නේ. ඒනිසා මේ සැපයුම් අංශයේ කට්ටියගේ හැටි. ඒනිසා කරුණාකරලා ඔබතුමා මේ කියන්නේ බොරුද කියලා බලන්න. ඔබතුමා ඔතන ඉන්නකොට පෙනෙයි. ඔබතුමා උඩ ඉඳන් ජනේලයෙන් බැලුවම පෙනෙයි. හැමතිස්සේම එළියේ. එළියට යන්නේ නගර සභාවේ කාර්යයන් වලට නෙමෙයි එළියට යන්නේ තමන්ගේ ළමයින්ගේ කාර්යයන්ට. එහෙම නිලධාරින් ඉන්නේ සැපයුම් අංශයේ. රෙදි ඇදගෙනද දන්නෑ OT වැඩි කරන්න කියලා තියෙන්නේ. මුදල් කමිටුව හොඳ තීන්දුවක් අරන් තිබුනා ඒ සම්බන්ධයෙන්. මේ සම්බන්ධයෙන් අපේ දැඩි විරෝධතාවය පළ කරනවා. මොකද හේතුව සෞඛ්‍ය කම්කරුවන්ට OT කපලා මේ ආයතන කමිටුව ගත්ත මේ තීන්දුව වැරදි කියන්නයි මම මේක කතා කළේ.

**මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේ කමිටුවේ හැම තිස්සේම කියනවා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ගන්න කියලා. දැන් පෙදරේරුවෙක් නෑ. දීපාල්නේ අපට හිටියේ. දීපාල් හිටියත් ගොඩක් වැඩ කලේ නෑ නගරාධිපතිතුමා. මේකෙත් ශ්‍රම මිලදී ගැනීම් කියලා කියනවා අපට බැරිද මේ කාරණය එකතු කරලා ඇතුලෙන්ම කරලා ගන්න.ශ්‍රම මිලදී ගැනීම් යටතේ ගත්තොත් ආවොත් විතරනේ පඩි ගන්නේ. වැඩ තියෙන වෙලාවට අනිවාර්යයෙන්ම මිනිහා ආවේ නැත්තම් වැඩේ වෙන්නේ නෑ. ඒනිසා මේක හරි තීන්දුවක් ගන්න. මම දැක්කා අයිතම කිහිපයක්ම තියෙනවා ශ්‍රම මිලදී ගැනීම් කියලා. ඒක හරියන්නේ නෑ නගරාධිපතිතුමා. ඔබතුමාලට වැඩ කරන්න විදිහකුත් නෑ. ඒ නිසා මම හිතන්නේ කාවහරි ස්ථිර වශයෙන්ම අරගත්තම එයා සභාවට වගකියනවා. එතකොට ශ්‍රම මිලදී ගැනීම් වලදී

වගකියන්නේ නෑ නගරාධිපතිතුමා. හදිස්සියේ ඔබතුමාට රැකදි වැඩකට ඕන වෙනවා ඒ මිනිහා එන්නේ නෑ වැඩේ කරන්යන්න. ඒනිසා ඔබතුමා කල්පනා කරලා හරි තීන්දුවක් ගන්න කියලා ඉල්ලනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පී.විතානගේ මහතා</u>
ගරු නගරාධිපතිතුමා, ආයතන කමිටු වාර්තාවේ 03 වන කරුණ සම්බන්ධයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා සෙසු කරුණු සම්බන්ධයෙන් එකඟයි සමගි ජන බලවේගය වශයෙන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, අපි සමස්ථ ආයතන කමිටුවට විරුද්ධයි.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.06 වන දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.06 වන දින පැවති ආයතන හා නීතියපිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03 කරුණට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
13. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
15. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිලිනි නෙත්සරණි මෙනවිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.06 වන දින පැවති ආයතන හා නීතියපිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.04.06 වන දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.04.06 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා)

**06(2) 2026.04.07 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.07 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
28. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
29. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.07 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා

4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
11. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
15. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිලිනි නෙත්සරණි මෙනවිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.04.07 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා

**2026.04.07 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා)

**06(3) 2026.04.07 දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මහජන උපයෝගිතා කමිටු වාර්තාව පක්ෂ ද විපක්ෂ ද කියලා සලකා බලන්න ප්‍රථම කරුණු කිහිපයක් අවධානයට ලක්කරන්න ඕන. ඒකෙන් මම ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් පමණක් මේ අවස්ථාවේ අවධානයට ලක්කරනවා. දැන් මේකේ තියෙනවා ගරු නගරාධිපතිතුමනි, පළමු කරුණ 2(1) මම විසින් යෝජනා කළා ජනසෙත පුස්තකාලය හා ඒ ශ්‍රවණාගාරය ආශ්‍රිත ප්‍රදේශය යම්කිසි කලාත්මක බවක් සාහිත්‍ය බවක් පෙනෙන ලෙස ඒ ශාලාව නිර්මාණය කරන්න කියලා. සම්පූර්ණයෙන් නෙමෙයි එහි ඉදිරිපස. දැන් මෙම යෝජනාව ගරු නගරාධිපතිතුමනි මම දැම්මෙ 2025.08.12 අද 2026.05.07 තව මාස තුනකින් ගරු නගරාධිපතිතුමනි මේකට අවුරුද්දක් පිරෙනවා. දැන් මේ යෝජනාව ගරු නගරාධිපතිතුමනි, මාස 09ක් තිස්සේ කිසිදු විදියක ප්‍රගතියක් ප්‍රතිඵලයක් ඉදිරි ගමනක් නොවී මේක තාමත් එක තැන

පල්වෙනවා. කාලයක් කිව්වා නාගරික සංවර්ධන අධිකාරියේ කවුරුහරි නිලධාරියෙක්ගේ උපදෙස් ඕනේ කියලා. ඊට පස්සේ දැන් කියනවා මෝස්තර නිර්මාණ අපේ කටුබැද්දේ තියෙන ඩිසයිනර් සෙන්ටර් එකෙන් දැන් උපදෙසක් බලාපොරොත්තුවෙන් නිලධාරියෙක් කටයුතු කරන්න බලාගෙන ඉන්නවා. ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද ජනසෙතේ ඉදිරිපස යම්කිසි කලාත්මකභාවයකට ඒ පෙනුමක් හදන්න, මේක අනුව ගත්තම අපේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවට රොකට් සයන්ස් එකක්. ඕකට මහලොකු වැඩක් ඕනේ නෑ. මම කමිටු වාර්තා කිහිපයකදිම ගරු නගරාධිපතිතුමනි නිහඬව බලාගෙන හිටියා. මගේ යෝජනාව නිසා නෙමෙයි මම කියන්නේ මේවගේ පොදුවේ ගත්තම ඔබතුමාලගේ කාල සීමාව තුළ සමහර මාසෙන් දෙකෙන් කරන්න ඕන කාරණා මාස 08 මාස 09 මාස 10 ගත කරලත් ප්‍රතිඵලයක් නෑ. ඒකේ එක සංකේතයක් ලෙස තමයි මම මේ කාරණය ඉදිරිපත් කරන්නේ. ගරු නගරාධිපතිතුමනි, මේ කාරණාව වැඩිය ඕනේ නෑ මම ලොකුකමට කියනවා නෙමෙයි අපි කිහිපදෙනෙක් මේ තාරක මහත්මයා ඉන්නවා තවත් මේ වගේ යම්කිසි මේ වගේ කියවීමක් තියෙන මිනිස්සු ඉන්නවා, ඔතනට ගිහිල්ලා පැය දෙක තුනක් ගත කළා නම් අපිට පොඩි අදහසක් ගන්න පුලුවන් මෙන්න මේ විදිහට මේක කළොත් ලස්සනයි කියලා. මේකට යූ.ඩී.එකේ. නිළධාරින් බලාගෙන ඉන්න ඕනේ නෑ. මේකට ඩිසයිනර් සෙන්ටර් එකේ නිලධාරින් බලාගෙන ඉන්න ඕනේ නෑ. අපේ මේ කටුබැද්දේ අපේ මේ මොරටුවේ කලාව ඇගේ තියෙන මිනිස්සු ඉන්න නගරයේ ඔවගේ දෙයක් කරන්න මහලොකු කාලයක් ගතකරන්න ඕනේ නෑ. නමුත් මම නිහඬව බලන් හිටියා මොකද මේකේ කාර්ය පටිපාටියක් තියෙන නිසා. ඒකේ ගරු නගරාධිපතිතුමනි නරකම දේ තමයි අදාළ කාරණා හැම එකක්ම යටයනවා.තව එක උදාහරණයක් ඔබතුමාට කියලා නතර කරන්නම්. මේ කමිටු වාර්තාවේ තියෙනවා 2(5) අපේ ගරු සභාපතිතුමිය සෙව්වන්දි මන්ත්‍රීතුමිය විසින් කරන ලද ඒ ඉල්ලීම සලකා බැලීම. ඒකේ තියෙන්නේ මොකක්ද, කොරළවැල්ල ක්‍රීඩාංගණ මාවතේ ඇති මොරටුව මහා නගර සභාව මගින් පාලනය කෙරෙන මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ කොටසක් ඇලවී කඩා වැටීමේ අවධානමක් මතු වී ඇත. ඒක නිශ්චිත කාරණයක්. එතුමිය ඉදිරිපත් කරන්නේ නිශ්චිත කාරණයක්.කොටසක් ඇලවී කඩා වැටීමේ අවධානමක් මතු වී ඇත.දැන් මේකත් සෑහෙන්න කාලයක් තිස්සේ මේ කමිටුවට එනවා. දැන් මේකේ තියෙන කාරණාව මොකක්ද ඒ අදාළ තාක්ෂණික නිලධාරියා මේකට උත්තරයක් දෙන්නෙත් නෑ. හැබැයි එයා වාචිකව කියනවා මේකේ කිසි අවුලක් නෑ එහෙම කඩා වැටෙන්නේ නෑ. ඊට පස්සේ එයා වගකීම භාරගන්නෙත් නෑ. මේකේ ඇත්ත කාරණයක් තියෙනවා සැලකිය යුතු, ඒ කියන්නේ එකක් තමයි නිලධාරීන් වගකීම භාරගන්නේ නෑ. හැබැයි ඒ භාරගන්නේ නැති හේතුව තමයි නිලධාරින්ට වගකීමක් භාර අරගෙන වැඩ කරන්න පුලුවන් වතාවරණයක් මේ පරිසරය තුළ නෑ වගේ අදහසක් තමයි තියෙන්නේ. සෙව්වන්දි මන්ත්‍රීතුමිය පැහැදිලිව සඳහන් කරනවා ඇලවී කඩා වැටීමට අවධානමක් මතු වී ඇත. ඒනිසා මම කියන්නේ ගරු නගරාධිපතිතුමනි, මේක දැන් කමිටුවෙන් ඉවත් කරලා ලිපිගොනුවෙන් කටයුතු කරමු කියලා ඒක එහෙම තියෙනවා. මේක බොහොම සත්භාවයෙන් ගරු නගරාධිපතිතුමනි මතු කරන්නේ. මේවා අපට පුලුවන් නිහඬව ඉන්න. වෙන්න දීලා නිහඬව ඉන්න. අනතුරක් උනාට පස්සේ මාලිමාවේ ඔබතුමාට ඇගිල්ල දික්කරන්න ලේසියි. අපිට ඒක කරන්න පුලුවන්. මොකද අපි විපක්ෂනේ ඉන්නේ. ආණ්ඩු පක්ෂනේ වගකීම තියෙන්නේ කියලා අපිට කියන්න පුලුවන්. නමුත් ගරු නගරාධිපතිතුමනි තේරුම් ගන්නේ නෑ මෙහෙම ගියොත්, මම එක කරුණක් දෙකක් පෙන්නුවේ. මේ කමිටු වාර්තාවල ගොඩක් ගත්තාම මහ හැරීම් ගොඩක් තියෙනවා. මේ මහ හැරීම් පිළිබඳ ඔබතුමාලා හරියට අවබෝධයෙන් කටයුතු නොකලහොත් ඔබතුමන්ලා ගන්න ඕන තීරණ හරියට නොගත්තොත් ගරු නගරාධිපතිතුමනි මාලිමාව විදිහට නෙමෙයි සභාවක් විදිහට අපි හැමෝටම මේ අරාජිකත්වය

බලපායි. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මේ කාරණා පිළිබඳ ඔබතුමා ඉතාමත් දැඩි අවධානයකට ලක් කරයි කියලා මම විශ්වාස කරනවා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.07 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.07 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(07) හා 02(08) යන කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා

4. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
9. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.07 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(07) හා 02(08) යන කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය දීමෙන් වැලකි සිටි අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - යු.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.07 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(11) කමිටු නිර්දේශයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජා මධුරංග විජයරත්න මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිලිනි නෙත්සරණි මෙනවිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.07 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.07 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා

**2026.04.07 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා)

**06(4) 2026.04.09 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුවේ 2(2) මුදල් බැඳි වාණිජ ආයතන ගැන වාර්තාවක් දීලා තියෙනවා. අපි හරි සතුටුයි. ඔබතුමත් දන්නවා මම නිතරම මේ ගැන කතා කරනවා. ආදායම් වාර්තාව අපිට දීලා තියෙනවා මාසෙටම.නමුත් අපි දන්නේ නෑ කවුද මේ ආයතන කියලා. ආයතන කොපමණද නම් වශයෙන් අපි දන්නේ නෑ. සභාවක් හැටියට අපිට හරි වැදගත් මේ ආයතන කවුද, මේ සියලු දෙනාම ගෙවනවද, ඒකේ හිඟ මුදල තියෙනවද කියලා අපිට දැනගන්න ක්‍රමවේදයක් නෑ. හැමදාම හැම සභා වාරයකදීම මේ වාර්තාව විතරයි දෙන්නේ. ඉස්සරනම් අපිට දුන්නා කවුද ඒ ආයතන කියලා. දැන් අපිට ඒ වාර්තාව ලැබෙන්නේ නෑ. ඒනිසා ලබන සභා වාරෙටවත් ඒ වාර්තාව අපිට ලබාදෙන්න. එතකොට තමයි අපි දන්නේ අපේ ආයතනයට කවුද මේ මුදල් ගෙවන්නේ , කාගෙද හිඟ තියෙන්නේ කියලා. ලබන වාරෙට ඒක ලබාදෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ගරු නගරාධිපතිතුමනි, අනිත් එක තමයි 2(3) ඇමුණුම් අංක 03 කොඩ්බට ආදායම. රු.12,250.00 නමුත් මුදල් කමිටුවේ ආදායම් ශීර්ෂය යටතේ අපිට සඳහන් කරලා තියෙනවා රු.14,750.00ක් කියලා. රු.2500.00ක වෙනසක් තියෙනවා. ඒක ගැන සොයා බලලා නිවැරදි කිරීමක් කරන්න ඕනේ ඇයිද කියන හේතුව සඳහන් කරමින්. 2(9) ජලය බැස නොයන කාණුවක් ඩෙංගු මදුරුවන් බෝවීම වළක්වා ගැනීම සම්බන්ධවයි.අපේ පාලන පක්ෂයේ මන්ත්‍රීතුමියගේ යෝජනාවක්. මේ යෝජනාව ඉදිරිපත් වෙන්නේ 2025.12.10 වෙනිදා. නමුත් අද වෙනතුරු අපිට ඒ කාණුවේ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා පියවරක් ගන්න බැරිවෙලා තියෙනවා පෙදරේරුවෙක් නැති නිසා. ඒනිසා මම හිතෙනවා මේ මාසේ පෙදරේරුවක් සම්බන්ධ කරගන්න යෝජනාවක් දාලා තියෙනවා අපි ඒකට එකඟයි. ඒනිසා මම හිතනවා ඒකත් කරයි කියලා. අනිත් එක තමයි ඩෙංගු රෝගීන් ගැන කතා කළා ආයාචනා හා පෙත්සම් යටතෙත් කතා කළා ඒක 2(11) පිටු අංක 05 ඇමුණුම අංක 08. අපි ඒකෙදි කියනවා ඩෙංගු රෝගය බෝවෙච්ච රෝගීන් කීදෙනෙක්ද කියලා. හැම මාසෙම අපි දන්නවා 50 දෙනෙකුට එහායින් තමයි අපේ රෝගීන් වාර්තා වෙන්නේ. ඒ රජයේ රෝහල්වල පමණයි. ප්‍රයිවට් රෝහල්වල බෙහෙත් ගන්න යන අය සම්බන්ධයෙන් මේකේ වාර්තා වෙන්නේ නෑ. ඒනිසා අපි මේ ගැට අවධානය යොමු කරන්න ඕනේ ඩෙංගු සඳහා අපි මුදල් වෙන්කරලා තියෙනවා. ඒ මුදල් පාවිච්චි කරලා පුලුවන් තරම් ප්‍රයෝජනය ගන්න ඕනා. අනිත් එක කොට්ඨාශ 29ටම පුලුවන්තරම් අපිට ඩෙංගු සඳහා මේ කාණු ටික සුද්ධ පවිත්‍ර කරලා දෙන්න. දුම් ගහන එකත් ඒ කොට්ඨාශ අනුව අපිට කරලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුවේ කරුණු කිහිපයක් තියෙනවා ඔබතුමාට ඉදිරිපත් කරන්න. අපිට තොරතුරු ටිකක් දැන ගන්නයි තියෙන්නේ. මම පළවෙනියටම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව, 2(13) ඔබතුමාගේ අවධානය යොමු කරනවා. 2(13) උක්ත කරුණ සලකා බැලූ කමිටුව මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ගරු නගරාධිපතිතුමා ඇතුළුව පහත සඳහන් නගර සභා මන්ත්‍රීවරුන් හා නිලධාරින්ගෙන් සැදුම්ලත් අනු කමිටුවක් පත්කිරීමට නිර්දේශ කරන ලදී. මෙහෙම පත්කරන්න බෑ. මම හැමදාම කියනවා.ස්ථාවර කමිටුවකට බලය නෑ අනු කමිටුවක් පත්කරන්න.අනු කමිටුවක් පත්කරන්න ඕනේ සභාවෙන්. දැන් මේ වෙලාවේ මේ කරුණ තිබ්බම මේක දන්නේ නැත්තම් හදාගන්න ඕනේ. මේක කරන්න ඕනේ සභාවෙදි සෞඛ්‍ය කමිටු සභාපතිවරයා විසින් කතා කරලා ඔබතුමාට කියන්න

ඕනේ අපිට මේකට කමිටුවක් ඕනේ කියලා. ඊට පස්සේ නගරාධිපතිවරයා තමයි මේ කමිටුව පත්කරන්නේ.ඒක පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් මූලාසනය මහා නගර සභා ආඥා පනත අනුව සභාවේදී තමයි පත්කරන්න ඕනේ.ඒනිසා මේ පත්කරලා තියෙන අනු කමිටුව නීත්‍යානුකූල නෑ. මාවත් දාලා තියෙනවා මේක නීත්‍යානුකූල නෑ. ඒනිසා ඒ සම්බන්ධයෙන් අපගේ විරෝධය පළකරනවා.

ගරු නගරාධිපතිතුමනි, 2(14) ට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එන්නත්කරුවන් පුහුණු කිරීම සම්බන්ධවයි. මේ එන්නත්කරුවන් පුහුණු කිරීම සම්බන්ධයෙන් තියෙන පශු වෛද්‍ය නිලධාරිණියගේ ලිපියේ උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් මහජන සෞඛ්‍ය පශු සේවා ඒකකය මගින් පුහුණුවීම් සඳහා ඉල්ලීම් කර ඇති අතර එම පුහුණුව 2026 අප්‍රේල් මස 07,08,09 දිනවල පැවැත්වෙන බව මා හට දන්වා ඇත. නමුදු මේ වන විටත් අදාළ නාම ලේඛණය මා වෙත ලැබී නැති අතර එම නාමලේඛනය මාර්තු මස 12 වෙනිදාට ප්‍රථම යැවිය යුතුය. මේ පිළිබඳව අවධානය යොමු කොට අදාළ නාමලේඛනය මා හට ලබා දෙන ලෙස සෞඛ්‍ය කමිටුවට යොමු කරමි. මේකේ අකුරු අඩුද වචන අඩුද මේකේ මොකක්ද කියලා දන්නේ නෑ පශු වෛද්‍ය නිලධාරිතුමිය නිදි. මේක මොකක්ද කියලා අපි දන්නේ නෑ. කොහොම වුනත් සෞඛ්‍ය කමිටුවේ ඉන්න උත්තමයෝ ටික මේ ගැන දැනගෙන අපේ ලඟත් ඉන්නවා එක්කෙනෙක්. මේකට දීලා තියෙනවා නිර්දේශයක්, උක්ත කරුණ සලකා බැලූ කමිටුව කළාපවලට අනුයුක්ත කර ඇති සේවකයන්ගෙන් හෝ අනෙකුත් සේවයන්ගෙන් සුදුසු සේවකයන්ගේ නාම ලේඛනය පශු වෛද්‍ය වෙත ලැබී ඇති බැවින් එම සේවකයන් පුහුණු වැඩසටහන සඳහා යොමු කිරීමටත් ඉදිරි කටයුතු ගොනුවෙන් සිදු කිරීමටත් යටත්ව මෙම කරුණ කමිටුවෙන් ඉවත් කිරීමට නිර්දේශ කරන ලදී. මේ කරුණ සම්පූර්ණ වෙලාද කමිටුවෙන් ඉවත් කරලා තියෙන්නේ.දැන් ඔබතුමිය ඉල්ලපු එක ලැබිලද, සාමාන්‍යයෙන් මෙහෙම කමිටුවෙන් ඉවත් කිරීමක් කරන්නේ නෑ. මේක කමිටුවට දාලා ඊළඟ කමිටුවේදී තමයි ඉවත් කරන්න ඕනේ. මේකේ මේ කොළ ප්‍රමාණය අඩු කරගන්නවත් මේකේ වේලාව ඉතුරු කරගන්නවත් කියලා කමිටුවෙන් එහෙම කරුණු ඉවත් කරන්න බෑ. එහෙනම් මේක දාන්නේ නැතුව ඉන්න ඕනා ඒක කෙරිලා නෑ. ප්‍රධාන අංක 03 කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරනවා.ප්‍රධාන නාගරික පශු වෛද්‍ය නිලධාරි විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සලකා බැලීම. ජල භීතිකා මර්දන එන්නත් කිරීමේ වැඩසටහන 2026. ජල භීතිකාව කියන්නේ මමයි තිලකසිරි මන්ත්‍රීතුමයි දැන් එළියට යනකොට වීථි සුනඛයෝ ඇවිල්ලා හරි ගේකින් ඉන්න වෙන සුනඛයෙක් ඇවිල්ලා හරි අපි දෙන්නව කාලා අපි දෙන්නට ජල භීතිකාව හැදෙන්න පුලුවන්. ඔබතුමා වාහනේ යන නිසා ඒක නොවන්න පුලුවන්. නමුත් සුදේශ මන්ත්‍රීතුමා සෞඛ්‍ය කමිටු සභාපති වුනාට බයික් එකේ යනකොට සමහර විට බල්ලෙක් හපලා ජල භීතිකාව හැදෙන්න පුලුවන්.මෙතන තියෙන ගැටලුව මම මේ පෙන්නන්නේ. මම උදාහරණයක් කිව්වේ, නම් කිව්වේ වෙනසකට නෙමෙයි.උක්ත වැඩසටහන සඳහා කාර්යාලය තුළ හා පිටත ජල භීතිකා එන්නත් කිරීම සඳහා මහජන සෞඛ්‍ය පශු සේවා ඒකකයෙන් එන්නත් 5000ක් ලබාගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර අප හට ලබා දී ඇත්තේ එන්නත් 500ක් පමණි. මේක පුදුම වැඩක්නේ. කාටද මේක කියන්නේ. මේක මහා ලොකුවට කතා කරන නලින්ද ජයතිස්ස සෞඛ්‍ය ඇමතිතුමාට කෙලින්ම යොමු කරන්න ඕන ප්‍රශ්නයක්. 5000ක් ඉල්ලන තැන 500යි දෙන්නේ. වරහන් ඇතුළේ තියෙනවා ආනයනය කළ එන්නත් තවම ලංකාවට පැමිණි නැති නිසා පසුව එන්නත් ලබාදෙන බව පවසන ලදී. ඒ කියන්නේ අපි බල්ලන්ට කියන්න ඕනේ උඹලා අපිව හපන්න එපා එන්නත් තාම නැවේ එනවා, ආනනය කරන එන්නත් ඉල්ලුම් කරලා තියෙනවා තාම ලැබිලා නෑ ඒ නිසා පොඩ්ඩක් හිටපල්ලා කියලා කියන්න ඕනේ. උක්ත වැඩසටහන සඳහා එන්නත් ප්‍රමාණය මදි නිසා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයෙන් වරින් වර එන්නත් ලබාගත්

අතර වැඩසටහනේ ප්‍රථම අදියර එනම් මාර්තු 31 දක්වා පවත්වන ලදී. පහත සඳහන් දින සඳහා අපට එන්නත් නොමැති අතර පහත පරිදි එන්නත් අවශ්‍ය වේ. අප්‍රේල් මස 27 දින සිට අප්‍රේල් 31 දින දක්වා එන්නත් 500ත් 600ත් අතර ප්‍රමාණයක් ඕනේ කියලා තියෙනවා. අපි මේ ගරු සභාවෙන් දැන ගන්න කැමති මේ වැඩසටහන අප්‍රේල් 27 ත් අප්‍රේල් 31ත් අතර මේ වැඩසටහන කළාද නැද්ද.ඊට පස්සේ තියෙනවා මැයි මාසයේ 07 වෙනි දින සිට මැයි මාසයේ 12 වන දින දක්වා 400ත් 450ත් අතර එන්නත් ප්‍රමාණයක් ඕනේ කියලා තියෙනවා. අපි අහන්නේ අද දවස 07 වෙනිදා අද වැඩේ පටන් ගත්තද නැද්ද මොකද මේක මොරටුව ජනතාවට අතිශය වැදගත් ප්‍රශ්නයක්.ඒනිසා අපි ඔබතුමා හරහා අදාල නිලධාරිණියට මෙතන ඉන්නවා. ඒනිසා අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කරුණු අපට දැනුවත් කරන්න කියන කාරුණික ඉල්ලීම කරනවා. ඔබතුමා පශු වෛද්‍යතුමියගෙන් ඇහුවා නම් හරි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

පශු වෛද්‍යතුමිය පොඩ්ඩක් කියන්නකෝ.එනනත් කරන්න එන සත්තුන්ව හරවලා යවනවද, එන්නත් කරන්න ඇවිල්ලා හැරිලා යන අය ඉන්නවද,

<u>නාගරික පශු වෛද්‍ය නිලධාරි - ඒ. එස්. පොන්නුසාමි මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ඉස්සෙල්ලම නෝටිස් දාලනේ තිබුනේ. අප්‍රේල් 30 වෙනකම් කරලා තමයි අපි නැවැත්තුවේ. ඊට පස්සේ එන ටික තමයි දැන් ප්‍රමාද වෙලා ගිහින් තියෙනවා. අනිත් තැන්වල කරනවා කියලා අපි දැනුවත් කරලා නෑ. ඒනිසා කරන්න තිබ්බ ටික තමයි අපි දැන් නවත්තලා තියෙන්නේ. සතියට එක දවසක් ඔෆිස් එකේ එන්නත්කරණය කරනවා බෙහෙත් පොඩ්ඩක් තියෙන නිසා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ඒ කියන්නේ දැනට අපි ලඟ බෙහෙත් ප්‍රමාණයක් තියෙනවා.

<u>නාගරික පශු වෛද්‍ය නිලධාරි - ඒ. එස්. පොන්නුසාමි මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩ්ඩයි තියෙන්නේ

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැනට තියෙනවා එන්නත් 50ක්. ඒ 50 තිබුනෙත් දැනට මාසෙකට එකහමාරකට උඩදි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

දැන් අද වෙන කොට එන්නත් කීයත් තියෙනවද

<u>නාගරික පශු වෛද්‍ය නිලධාරි - ඒ.එස්.පොන්නුසාමි මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, එන්නත් 30ක් පමණ තිබෙනවා.ඊළඟ සතියේ අපි ගේන්න බලාපොරොත්තුවෙනවා. ඒක ආවයින් පසු නැවත අපි එන්නත්කරණය පටන් ගන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉස්සෙල්ලම මේ නිලධාරින් ටික ගන්න ඔබතුමා. අරගෙන කැලැන්ඩරයකුත් අතට ගන්න. මේ නිලධාරින්ට කියලා දෙන්න පෙබරවාරි මාසෙට දින කීයද තියෙන්නේ, ජනවාරි මාසෙට දින කීයද තියෙන්නේ, අප්‍රේල් මාසෙට දින කීයද තියෙන්නේ කියලා, කියලා දෙන්න නිලධාරින්ට. මේකේ තියෙන්නේ අප්‍රේල් මස 27 වන දින සිට අප්‍රේල් මස 31 දක්වා. මේක ඔබතුමාගේ ආත්මගරුත්වය සම්බන්ධයෙන් ප්‍රශ්ණයක්. නාගරික කොමසාරිස් කෙළින්ම

වගකීම භාරගන්න ඕනේ මේකේදෙවැනි විධායකයා මේ නගර සභාවේ ඉන්න. මේ වාර්තා නාගරික කොමසාරිස්ටත් යනවා. අපි නගර සභාවට ඇවිල්ලා මේ සභාවේ වාඩිවෙනකොට නගරාධිපතිවරයාගේ නිවේදන තියෙනවා. ඒ නිවේදනවලදි, එහෙම නැත්තම් මේ කමිටුව පටන් ගන්නකොට, අපි පිලිගන්නවා එක දෙයක්, නගරාධිපතිට මේක අකුරෙන් අකුර කියවන්න බෑ එහෙනම් නිලධාරින් ඕන වෙන්නේ නෑනේ. එහෙම කරන්න බෑ කියන එක අපි පිලිගන්නවා. ඒකේ තර්කයක් නෑ. අපි දේශපාලන කුහක වෙන්නේ නෑ ඒකට. ඒකට තමයි නිලධාරින් ඉන්නේ. අප්‍රේල් මාසෙට දින 31ක් තියෙන්නේ කොහෙද මේ ලෝකේ.ෂෙඩ්‍යුල් එකක් නෙමෙයි අපි කතා කරන්නේ අපි කතා කරන්නේ අපිට දෙන මේ වාර්තාව. මේක නෛතික ලියවිල්ලක්.

සභා ඝෝෂා

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි ඔබට අවස්ථාව දීලා තියෙනවා ඒවා බලාගන්න පුලුවන්. මම ඉල්ලීම කරන්නේ බැගෑපත්ව මේ ගෞරවාන්විත වරිත. දිනේක එහා මෙහාවක් වුනාම ඒක විවේනයක් කරන්න. අපහාස කරන්න එපා.

සභා ඝෝෂා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරුන් 2026.04.09 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සරෝජනී මැන්දිස් මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.09 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.04.09 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යු.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
17. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

**2026.04.09 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය)

**06(5) 2026.04.09 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වී.අයි.පී එකේ වහල අලුත්වැඩියා කිරීම සම්බන්ධව වාර්තාවක් මම ඉල්ලුවා, මට තාම ඒක ලැබුනේ නෑ. කමිටුවේ නෑ ඒක මේ පාර . ගිය පාර ඒකේ වාර්තාව ඉල්ලුවේ. මේ පාර ඇවිල්ලත් නෑ. ඒක වාර්තාවක් ලබා දෙන්නම් කියලා කිව්වා. ඒ වුනාට කමිටුවේදි මට ලැබුනේ නෑ වාර්තාව.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ඉංජිනේරුතුමා, අදහසක් තියෙනවද ඔබට, කමිටුවේ නෑ. වී.අයි.පී.එකේ වහල සම්බන්ධව, වහල හදලා තියෙන්නේ, ඔබ ලිඛිතවද ඉල්ලුවේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ගියවර සභා වාරයේදී ඉල්ලුවේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මහා සභාවේ ඇත්තේ වාර්තාව. එතුමා ඉල්ලන වාර්තාව බලලා ඉක්මනට ලබාදෙන්න. අයිතිමයක් නෑ මේ සම්බන්ධව. ඉංජිනේරුතුමා, ඊළඟ ස්ථාවර කමිටුවේදි වාර්තාව ලබා දෙනවද.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, 2(3) කරුණ, පවත්වනු ලබන මළල ක්‍රීඩා පුහුණුවීම් සම්බන්ධව ඒකට කමිටුවක් දැම්මා නගරාධිපතිතුමා, ඒ කමිටුවේ නිර්දේශය කොහොමද දන්නේ නෑ. ඒ කියන්නේ කමිටුව රැස්වුනාද , මොකක්ද ගත්ත තීරණ

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කමිටු රැස්වෙලා අපි තීරණයක් ගත්තා මළල ක්‍රීඩා සහ ක්‍රීඩා පුහුණුකරුවන්ට යම්කිසි ගාස්තුවක් ගෙවන ලෙස තීරණයක් ගත්තා, සියලුම දෙනා පැමිණියා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔවුන්ව ගෙන්නලා සාකච්ඡා කළා.කොටසක් ඉන්නවා ගෙවීම් කරනවා, කොටසක් ඉන්නවා ගෙවීම් කරන්නේ නෑ.එතකොට ඒ හැමදාම ගෙන්නලා සාකච්ඡා කළා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, හැබැයි එහෙම දෙයක් නම් නෑ මේ වාර්තාවේ ඒ සාකච්ඡාව පිළිබඳව

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපේ පාලන කාලයේදි අපි ග්‍රවුන්ඩ් එක හදලා ඉවර වෙලා අපි මළල ක්‍රීඩා පුහුණුකරුවන්ට කිව්වා අපි කාඩ් එකක් ඉෂු කළා. ඒ කාඩ් එකෙන් එක දරුවෙක්ගෙන් රු.100/-ක් අයකරන්න කියලා. දරුවෝ ගාණට සල්ලි අරගෙන ග්‍රවුන්ඩ් එකට දාන්න කාටහරි භාරදෙනවා.දැන් ඒක අවුරුද්දක් තිස්සේ වෙන්නේ නෑ. ග්‍රවුන්ඩ් එක භාර නිලධාරියා ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා ඉල්ලීමක් කළා, ඔබතුමත් කතා කරලා කිව්වා නවත්වන්න කියලා නැවැත්තුවා. නමුත් තාම ක්‍රීඩා කරනවා. සභාපතිතුමා කිව්වා කමිටුවක් තිබ්බා කියලා. අපිට අයවිය යුතු මුදලක්නේ

නගරාධිපතිතුමා. ඒක ගාණ හදලා ගමු සල්ලි. ඒගොල්ලෝ ගොඩක් සල්ලි හම්බ කරනවා මේ කෝචින් වලින්.ඒ නිසා නගර සභාවට අයවිය යුතු ගාණ අපි ලබාගමු.අවුරුද්දක් තිස්සේ නෑ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, ඒ හැමදෙනාම ගෙන්නලා ඒගොල්ලන්ට පැහැදිලි කිරීමක් කළා. ආයේ ගෙවීමක් නැතුව ග්‍රවුන්ඩ් එක දෙන්නේ නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, මේ සම්බන්ධව කවුරුහරි ඉන්නවද චෙක් කර ගන්න.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, ඔව්

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමා, ක්‍රීඩා කමිටු සභාපතිතුමා ලොකු රාජකාරියක් කළා බිග් මැච් සීසන් එකට. එතුමා විකට් එක හදන්න ස්පොන්සර් කෙනෙක් ගෙනල්ලා විකට් ටික හැදුවා. නමුත් අපේ සභාවේ කවුරුත් දන්නේ නෑ කවුද මේ ස්පොන්සර් කියලා. කීයක් දුන්නේ කියලා. අපේ වගකීමක් හා යුතුකමක් තියෙනවා ඒ ස්පොන්සර්ට තැන්ක් යූ කියලා ලෙටර් එකක් යවන්න. එහෙම එකක් අපි දකින්නේ නෑ.ලබන සභාවේදිවත් අපට ඒක ලබා දෙනවා නම් වඩාත් හොදයි. එතකොට ඒ ස්පොන්සර්ස්ලා දිරිමත් වෙනවා අපිට තව උදව් කරන්න.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.09 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |

19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.09 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(06) නිර්දේශයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධවත් ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යු.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.09 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.09 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.04.09 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය)

**06(6) 2026.04.09 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, එක සංශෝධනයක් අවශ්‍යයි. 5 වන එකේ යෝජනාවේ පළමු වෙනි කාරණාවේ සභාවේ වාහන අලුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී මිල ගණන් කැඳවීම විද්‍යුත් තැපැල හරහා එම අමතර කොටස් මිලදී ගැනීම සිදු කිරිම සුදුසු බව යෝජනාවේ කමිටු නිර්දේශය වුණේ නාගරික ගණකාධිකාරි (ආදායම්)ට යොමු කිරීම. හැබැයි මේකේ කාරණා තුනටම කමිටු නිර්දේශය වෙලා තියෙන්නේ නාගරික ඉංජිනේරු වෙතින් ලබාගැනීම කියන එක.ඒකේ පළවෙනි කාරණාව නාගරික ගණකාධිකාරි වෙත යොමු කර වාර්තාවක් ඉදිරිපත් කරමි කියන එක.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2(3) කරුණ දිගරොල්ල පාලම අසළ කඩ කාමරවල ගාස්තු සංශෝධනය හා ගිවිසුම් සම්බන්ධව සාකච්ඡාව. මම හිතන්නේ ඒක දාලා තියෙනවා 04 වෙනි මාසේ 27 වෙනිදා තියනවා කියලා. ඒක පැවැත්වුවද නගරාධිපතිතුමා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඒක පැවැත්වුවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒගොල්ලෝ එකඟ වුනාද අපේ ගිවිසුමට.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඒගොල්ලෝ එකඟයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රශ්නයක් නැද්ද.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි ඉක්මනට මේ වැඩේ කරමු.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, අපිට පුළුවන් කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඊළඟ කාරණය තමයි 2(10) මොරටුව බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය සම්බන්ධව.ඒකෙදි අපි ටෙන්ඩර් කෝල් කරලා අලුත් කට්ටියකට දුන්නද

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒකේ කරන අයගෙන් පොඩි ඉල්ලීමක් ඇවිල්ලා තියෙනවා, අපි ගාණ ටිකක් වැඩි කළානේ.එතකොට ටෙන්ඩර් එක දාපුවම කොහොමත් ඕක ඉල්ලුම් කරන්නේ බොහෝ විට එයාම තමයි. එයාගේ පැත්තෙන් ඉල්ලීමක් මේ. ඊයේ ආවේ ලිඛිතව නෙමෙයි වාචිකව ඇවිල්ලා කිව්වේ. එයාගේ අසරණකම ගැන ටිකක් කිව්වා.එයාට ගෙවන්න පුලුවන් අර මුදලම තමයි කියලා කිව්වා. ටෙන්ඩර් අදාළව වෙන කෙනෙක්ට ගියේ නැත්තම් අපිට නැවත එයාව සලකා බලන්න වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපිට ඇතුළේ පොඩ්ඩක් රෙපයාර් ටිකක් කරගන්න වෙනවා. වතුර බහින තැන් උතුරලා ගඳ එහෙම තියෙනවා. අපේ පැත්තෙන් මැදිහත්වීමක් කරලා, එයාට දුන්නට ප්‍රශ්නයක් නෑ නගරාධිපතිතුමා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.09 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා

23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.04.09 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත් මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
18. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
22. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිනි නෙත්සරණි මෙනවිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.09 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.04.09 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**06(7) 2026.04.10 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනි, අංක 2(3) ආදාහනාගාර සඳහා ගෑස් නිකුත් කිරීම. නැවත වතාවක් මට මේ සම්බන්ධව කතා කරන්න වෙච්ච එක ගැන මම කණගාටු වෙනවා. මේකේ ජනවාරි මාසයේ අපි ගෑස් නිකුත් කරනවා සිලින්ඩර් 34 ක් පෙබරවාරි මාසේ නිකුත් කරනවා සිලින්ඩර් 13ක් ඒ කියන්නේ ජනවාරි මාසෙට මරණ 41 ක් තියෙනවා ආදාහනාගාරයේ පෙබරවාරි මාසේ 37ක් තියෙනවා. එතකොට මාර්තු මාසයේ අපි ගෑස් සිලින්ඩර් නිකුත් කරලා නෑ. නමුත් මාර්තු මාසයේ මරණ 34ක් තියෙනවා. එතකොට ආදාහනාගාරය කොහොමද නඩත්තු වුණේ. ගෑස් නිකුත් කරලා නෑ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමිය, ආදාහන ඔක්කොම කරලත් තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනි, ඔව්. භූමිදානය කරලා ආදාහනය කරා කියලා ලිච්චද දන්නේ නෑ. මෙතනදි අපේ මුදල් කමිටුවේ වැය ශීර්ෂ 1208 සඳහන් කරනවා පෙබරවාරි 03 නෙමෙයි පෙබරවාරි දක්වා තුන්ලක්ෂ අටදහසක් අපි ගෙවීම් කරනවා. කමිටුවේදි සඳහන් කරනවා මාර්තු වලට ගෑස් සිලින්ඩර් නිකුත් කර නොමැති බව මම සඳහන් කරමි කියලා.එතකොට මාර්තු වලට ගෙවිමක් කරනවා දෙලක්ෂ හැට හතර දහසක් මුදල් කමිටුවෙන්. ලොකු ගැටලුවක් තියෙනවා ගෑස් නිකුත් නොකර මරණ 34ක් ආදාහනය කරනවා, මාර්තු වලට ගෙවිම් කළේ නෑ කියලා තියෙනවා නමුත් මුදල් කමිටුවෙන් දෙලක්ෂ හැට හතර දහසක් ගෙවීම් කරලා තියෙනවා.අරකයි මේකයි දෙකම සංශෝධනය කරන්න ඕනා.මොකද එකම කමිටු වාර්තාවක සඳහන් වෙන්නේ නෑ. මේ සම්බන්ධව අවධානවය යොමු කරන්න. මේ සම්බන්ධ ප්‍රශ්න කිහිපයක්ම මතු කළා, දැන් මේ තුන්වෙනි වතාව.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය වුට්ටක් පැහැදිලි කරන්න. ඒ කියන්නේ අපි මාර්තු මාසයේ ගෑස් නිකුත් කළේ නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනී, නිකුත් කළේ නෑ. ආදාහනාය කරලා තියෙනවා මරණ 34ක්

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 34ක් ආදාහනය කළා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනී,ගෑස් නිකුත් කරලා නෑ

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමිය, ඒකේ මොකක්ද ඔබතුමිය ප්‍රතිවිරෝධයක් මතු කරනවා මුදල් කමිටුවේ වියදමක්?

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමා, මුදල් කමිටුවේදි එකින් එක චෙක් කරන්න බෑ. මේක ඵලදායිතා කමිටු වාර්තා වෙන්නේ එන්නේ. මේගොල්ලෝ මුදල් ගෙව්වේ නෑ කිව්වම ඒකත් එක්ක මුදල් කමිටුව චෙක් කරනකොට මුදල් කමිටුවේ ගෙවීම් කරලා.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, හරි නේද

<u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා මේ ගැන අවධානය යොමු කරන්න. නිතරම හැමදාම වගේ මේ වගේ වැරදි අහුවෙනවා.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, ඇත්තටම මම ස්තුතිවන්ත වෙනවා ඔබතුමියට, ඔබතුමිය මේ ගැන ගොඩක් අවධානය යොමු කළා මේ සම්බන්ධයෙන් දිගටම කතා කළා ඒකේ ප්‍රතිඵලයක් සහ කමිටුවේ මහන්සි වීමේ ප්‍රතිඵලයක් ලෙස අපිට අර ගෑස්වල යම් කන්ට්‍රෝල් එකක් කරගන්න හම්බ වුණා. මෙතෙක් තිබ්බ්ච එකේ යම් පාලනයක් කරගත්තා කියන අදහස මට තියෙනවා. ඔබතුමියලා මේ කරන මේ ප්‍රශ්න කිරීම් නිසා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, ඒ ගැන සතුටුයි. ඒ නිසා අපට අවස්ථාව දෙන්න මේවා පොඩි ගැටලු නෙමෙයි.මේකේ විනිවිදභාවයක් තියෙන්න එපැයි. අපිත් වගකියනවනේ.ඔගොල්ලෝ විතරක් නෙමෙයි විරුද්ධ පක්ෂෙත් වගකියන්න වෙනවා සභාවේ වාර්තාවක්නේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, විරුද්ධ වෙනවනේ ඒනිසා වගකියන්න ඕනේ නෑ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, වගකියන්නේ නෑ. නමුත් සමූහිකව අපි මෙතන ඉන්න නිසා ඒක පැහැදිලි කිරීම ඔබට යුතුකමක්.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ගිය සතියේ ගරාජ් එකට ලොරියක් දැම්මා හදන්න රු.850.00ක කෑල්ලක්. කොළඹ ගියා කැබ් එකක් අරගෙන ඒක ගේන්න.මේකේ තියෙන්නේ එලදායිතානේ.රු.850.00 කෑල්ල මෙතනින් අරගෙන දාන්නේ නැතුව කොළඹ ගිහිල්ලා කැබ්එක අරගෙන තෙල් ටික වියදම් කරගෙන ගිහිල්ලා මොකක්ද කළේ කියලා ඔබතුමා පොඩ්ඩක් හොයලා බලන්න.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මම කියන්නේ ඔබතුමාටත් මම ගොඩාක් ස්තුතිවන්න වෙනවා දැනට මන්ත්‍රීතුමා ගොඩාක් මැදිහත් වෙනවා සැලසුම් කමිටුව පැත්තේ ගොඩාක් දේවල් වෙනස් කරගන්න ඉතාම හොඳ සහයෝගයක් දෙනවා. මම කියන්නේ මට ඔක්කෝම උදව් කරන්න මේ ගරාජ් එක වෙනස් කරගන්න. ඇත්ත අර්බුදයක් තියෙනවා.ඇත්ත ප්‍රශ්නයක් තියෙනවා.අපි ඔක්කොම එකතු වෙලා වෙනස් කළ යුතු තැනක් තමයි ගරාජ් එක.ඒක මත සියල්ල තීන්දු කරලා තියෙනවා. දැන් වැඩපිළිවෙලක් තියෙනවා අදහසක් තියෙනවා කොළඹ යවන්නේ නැතුව මෙහේ මේ කටයුතු කරගන්න.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.10 දින පැවති එලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.10 දින පැවති එලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(03) කරුණට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කල අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත් මිය
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.10 දින පැවති එලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා

9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිලිනි නෙත්සරණී මෙනවිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.04.10 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.04.10 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**06(8) 2026.04.10 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, 2(2) කරුණ අපි දිගින් දිගටම සාකච්ඡා කළා, හොයලා බැලුව්, කනත්තට ගියා අපි හොයලා බැලුවා. නගරාධිපතිතුමා ඔබතුමත් කනත්තට යනවා මළගෙවල්වලට ගියාම එන්ට්‍රන්ස් එකේ දකුණු අත පැත්තේ තාප්පේ තමයි කඩා වැටිලා තියෙන්නේ. අපි ඒ තාප්පේ නම් කරනවා E කියලා. එතකොට ABCD කියන්නේ ඒ අළු කුටි තියෙන්නේ නගරාධිපතිතුමා අපේ ආදාහනාගාරය ඉස්සරහ පොකුණත් එක්ක. E තියෙන්නේ කඩා වැටිච්ච පැත්තේ. නමුත් නගරාධිපතිතුමා මම දිගින් දිගටම හොයලා බලද්දි E පැත්තට යවන්න ඕන ලියුම් ටික ඔක්කෝම යවලා තියෙන්නේ ABCD කියන මිනිස්සුන්ට තමයි ලියුම් 269ක් යවලා තියෙනවා.අපි ළඟටත් ගොඩක් කට්ටිය එනවා ලියුම් ලියා ගන්න, බැරිම තැන ගියා බලන්න මොකක්ද මේ කාරණය කියලා. එතකොට නගරාධිපතිතුමා මේ නිලධාරින් මොකක්ද මේ කරන්නේ.නගරාධිපතිතුමා A එකේ තියෙනවා අළු කුටි 108ක් , B එකේ තියෙනවා 156ක්, C එකේ 159යි, D එකේ 267යි, E එකේ තියෙන්නේ 111යි. නමුත් ලියුම් 269ක් යැව්වට ඒ ලියුම් 269ම වැඩක් නෑ ගරු නගරාධිපතිතුමා 111ට එකක්වත් ගිහිල්ලා නෑ. අපිට හොයලා බලන්න කියලා කිව්වනේ දැන් ආයේ ගිහිල්ලා වාර්තාවක් ගන්නවා අළු කුටියේ 2X2 ගැඹුර 2යි, පළල 2 යි, දිග 2යි. අළු කුටියේ මුට්ටි දෙකක් දාලා මැදින් ගහලා තියෙනවා කැල්ලක්. එතකොට මේගොල්ලෝ හිතෙනවා එතන හිස් කියලා. හිස් නෑ බඩු ඇතුලේ තියෙනවා. එහෙම නෑ නගරාධිපතිතුමා එහෙම හිස්ව තියෙන්නේ 10යි. මේ 111 10කට

දාන්න බෑ නගරාධිපතිතුමා. ඒනිසා නිලධාරින් අපි ලෙජර්ගත කරලා සල්ලි ගෙවලා හැමදේම කරලා තමයි අළු කුටි දාලා තියෙන්නේ. අම්මාගේ තාත්තාගේ, සීයාගේ ආච්චිගේ, මීමුත්තගේ විස්තර ඔක්කෝම දාලා තියෙන්නේ. දැන් අපි මොකද මේදේවල් වලට කරන්නේ, ලියුම් යවලා තියෙන්නේ E බ්ලෝක් එකට නෙමෙයි ABCD වලට. මේක බරපතල කාරණයක් නගරාධිපතිතුමා, ඔබතුමන්ලා බැණුම් අහනවා, මෙතන ඉන්න අපිත් බැණුම් අහනවා, අපිත් ඒ කාලේ හිටියනේ. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමා අවධානය යොමු කරන්න, මේ පෝස්ට් කරපු ලියුම්වල මුද්දර ගාස්තුවලට කවුද වගකියන්නේ, අපි මෙච්චර කල් කතා කළාට නගරාධිපතිතුමා, නාගරික ගණකාධිකාරි පැත්තෙන් වෙන වැඩේ වෙලා නෑනේ. කවුරුහරි භාරව ඉන්නවනේ, මොකක් හරි සෙක්ෂන් එකක භාරව ඉන්නවා මෙයා තමයි සෙමට්‍රි එක සම්බන්ධව. මේ මිනිස්සු මෙතන ඉඳන් මොකක්ද කරන්නේ. යන්න කියන්නකෝ සෙමට්‍රි එකට, කාරණය බරපතලයි කියන්නේ සමහරක් කට්ටිය දැන් නඩු යන්න හදනවා. නගර සභාවේ සභිකයන් හැටියට අපිටත් බලපානවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමා මේ වැරැද්ද හදන්න. මේ නිලධාරින් එක්ක ඔබතුමාට වැඩ කරන්න බෑ. මේ නිලධාරින් හරියට වැඩ කරන්නේ නෑ.එක්කෝ මේගොල්ලන්ට දැනුම නෑ. සූරියප්පෙරුම වගේ දැනුම් නැති කෙනෙක්ව දාලා ඇති. ඒක ගැන පොඩ්ඩක් හොයලා බලන්න ඕනේ.

ගරු නගරාධිපතිතුමා ඊළඟ කාරණාව, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ගොඩක් දවස්වලට මම නගර සභාවට එන නිසා ගොඩක් ප්ලෑනින් වලදි යම්කිසි සුළු සුළු අඩුපාඩු නිසා ගොඩක් රිජෙක්ට් වුණ කාලයක් තිබුණා. කොමසාරිස්තුමියගේ කාලේ එකක් තිබ්බා 2024 එකක්, මන්ත්‍රිවරුනි පොඩ්ඩක් දැනගන්න පළල අඩි 20ක් වෙන්න ඕන ඉඩමක් පාස් කරන්න.නමුත් පළල 19.6ක් තියෙනවා දසක 04ක් අඩුවක් තියෙනවා.මම නගරාධිපතිතුමාට තේරුම් කරලා දුන්නා දශම 04ක් අඩුවක් තියෙන්නේ එහා පැත්තේ ඉඩමෙන් දෙන්නෙත් නෑ මෙහා පැත්තේ ඉඩමෙන් දෙන්නෙත් නෑ මේ ඉඩම දිග් වෙන්නෙත් නෑ පර්චස් 15කුත් තියෙනවා. දැන් ඒ මනුෂ්‍යයට ලෝන් එකක් ගන්න විදිහක් නෑ මේ දශම 04 නිසා. නගරාධිපතිතුමා හොඳ අවධානයෙන් අහලා ඒ වැඩේ කරලා දුන්නා බොහොම ස්තුතියි. ඒවගේම තමයි මම මේ ප්ලෑනින් සෙක්ෂන් එකේ වැරදි කිහිපයක් කියන්නේ පොඩ්ඩක් තේරුම් ගන්න මේ කුහකකමින් කියනවා නෙමෙයි.මේ කවුන්ටර් වල මිස්ලා අම්බානෙට බැනුම් අහනවා මිනිස්සුන්ගෙන්. ඊයේ මනුෂ්‍යයෙක් ඇවිල්ලා බැන්නා නගරාධිපතිතුමා දවස් තුනක් ආවා, මේ තුන් වෙනි දවස තව එකක් කියනවා කියලා බැනලා බැනලා ගියා. අනිත් එක නගරාධිපතිතුමා ඉඩමක් තියෙනවා පර්චස් 10යි. අම්මගෙන් හම්බ වුනේ ගේ තියෙනවා. දැන් මේගොල්ලෝ ලෝන් එකක් ගන්න සර්වියර් ප්ලෑන් එක පාස් කරන්න දානවා. උක්ත කරුණ සලකා බැලූ කමිටුව මේ ගොඩනැගිල්ල ඉවත් කර ගන්නා ලෙස දැනුම් දෙනවා. ඉවත් කරලා ආවට පස්සේ සර්වියර් ප්ලෑන් එක පාස් කරනවා කියලා. මේ මොන නීතිද ගරු නගරාධිපතිතුමා.මම නගරාධිපතිතුමාට ගිහිල්ලා කතා කළාම නගරාධිපතිතුමා තේරුම් ගත්තා මේ අනුමැතියෙන් මේ නිවස ආවරණය නොවේ කියලා අනුමත කළා.ඊට පස්සේ අපි දඩයක් එක්ක බිල්ඩින් ප්ලෑන් එක දානවා නගරාධිපතිතුමා ඒකත් කළා බොහොම ස්තුතියි. ඒකයි වෙන්නේ ඕනේ. මේ මිනිස්සුන්ව හරවලා යවන එක නෙමෙයි. සිස්ටම් එකනේ චේන්ජ් කරන්න ඕනේ. ඒවගේම නගරාධිපතිතුමා පෙරේදා කේස් එකක් ආවා සුදේශ් මන්ත්‍රිතුමත් දන්නවා සමන්ලාල් නගරාධිපතිතුමාගේ කාලේ පර්චස් 37.5ක් පාස් කරලා තියෙනවා. ඒ 37.5 දරුවෝ දෙන්නට බෙදලා දෙන්න කඩලා දැම්මම, මේ මොරටුව මහා නගර සභාවේ මේ ප්ලෑනින් කමිටුවේ සභාවේ නිශාන්ත ප්‍රදිනාන්දු නොවේ.කොහේවත් නැති යූ.ඩී.එකේ නිලධාරි තමා සභාපති.ඔහු කියන දේවල් විතරයි මේකේ කරන්නේ.දැන් නගරාධිපතිතුමා තේරුම් අරන් ඉන්නවා. ගරු නගරාධිපතිතුමනි,නැවත කියනවා

යූඩී ක්ලියරන්ස් ඕනලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ලියරන්ස් ඕනලු පරිසර බලපත්‍ර ඕනලු දරුවො දෙන්නට අනුමත කරපු එක දෙකට කඩද්දි ආයෙත් ක්ලියරන්ස් ඉල්ලනවා.මේවා සරල දේවල් නගරාධිපතිතුමා ඔබතුමයි මෙහි ප්‍රධානියා. යූඩී නිලධාරි කියන්නේ එක පුද්ගලයෙක් විතරයි. ඒ නිසා ඔබතුමාගෙන් ආදරයෙන් ඉල්ලා සිටිනවා. අපි ජීවන් කුමාරතුංග ඇමතිතුමාගෙ කාලෙ තමයි බිම් සවිය ආවේ.ඊට පස්සෙ මුළු ලංකාවම බිම් සවිය බවට පත්වුනාට පස්සෙ සමන්ලාල් නගරාධිපතිතුමා බිම් සවියත් පාස් කරලා දුන්නා.දැන් ඒවා කරන්නෙ නැහැ. බිම්සවිය අරන් ගිහිල්ලා ඒ කියන කැඩස්තරේ සර්වේට කියලා ආයෙ ඇදගන්නවා රුපියල් තිස්පන්දහක්, පනස්දහක්, ලක්ෂයක් දීලා ඇදගන්නවා. ඊලගට භාරදෙන්න ආවම ඕගොල්ලන් ගහලා තියෙනවා මුල් සැලැස්ම අනුමත නොවුනානම් නීතීඥ මහතෙකුගෙන් ලියුමක් අරන් එන්න කියලා.නීතීඥ මහතාට විසිපන්දහසක් දෙන්න ඕනා.මේවා අවශ්‍ය නැහැ නගරාධිපතිතුමා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි,මම ඉංජිනේරුතුමාට කිව්වා අවශ්‍ය කරුණු කාරණා දාලා දිවුරුම් ප්‍රකාශයක් ලෑස්ති කරලා ඒ දිවුරුම් ප්‍රකාශය ලෑස්ති කරලා ගන්න.ආයෙත් මොකටද නීතීඥයෙක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,කොහෙන්ද මේ නීතිය ආවෙ. යූඩී එකේ නිලධාරිය කියන විදියට නටන්න එපා නගරාධිපතිතුම. එයාට ඕනේ මේ ෆයිල් එක ෆේල් වුනාම යූඩී එකට යවන්න.යූඩී එකේ එයා වෙනම වැඩේ කරනවා.ඒක නවත්තපු එක හොදයි.අනෙක් එක තමයි සර්වෙ ප්ලෑන් එක බාරදෙද්දි සත්‍ය පිටපත් කියලා තුනක් අරගෙන එන්න කියනවා.කොමසාරිස් පාලන කාලෙ කොමසාරිස්තුමිය ලගට අරගෙන ගියාම කොමසාරිස්තුමිය දෙහිවලට කෝල් එකක් ගත්තා.ඒවා අවශ්‍ය නැහැ කිව්වා.නමුත් ඒක තාම ක්‍රියාත්මකයි.සත්‍ය පිටපත් ගන්න එක්දාස් පන්සිය ගාන‌ෙ තුනක් යනවා හාරදහස් පන්සියයක් යනවා. මොකටද සත්‍ය පිටපත් අපේ නිලධාරීන් ඉන්නවානෙ බලන්න.එහෙම කරන්න එපා නගරාධිපතිතුමා සමහර වෙලාවට දුර පලාත් වල සර්වේස්ලා ඉන්නෙ.ඒක කරන්න එපා නගරාධිපතිතුමා ඒක අයින් කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී -ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මම පොදු කාරණාවක් මතු කරන්නම්.ඔසද මන්ත්‍රීතුමා කතා කරනකොට මට හිතුනා.ඔබතුමා නගරාධිපති උපදේශක තනතුරක් දුන්නට පාඩු නෑ. මට කියන්න ඕන කම තියෙන්නේ ගරු නගරාධිපතිතුමනි, විපක්ෂයේ විදියට අපේ හැසිරීම ගැන ඔබතුමාට යම් අවබෝධයක් තියෙනවා. එතකොට දැන් උදේ ඉඳලා නිලධාරීන්ට තමයි ගොඩක් දෝෂාරෝපණ වුනේ. ඒවායේ සත්‍යයක් තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, මමත් මහජන උපයෝගිතා කමිටුවේ නිලධාරීන්ගේ දුර්වලතාවය ඉලක්ක කරා. හැබැයි නගරාධිපතිවරයෙක් ඉන්නවා පාලනයක් තියනවා. ඔබතුමත් පාලනයත් මේකෙන් නිදහස් වෙන්න බැහැ. මට මතුකරන්න ඕන කාරනාව මේකයි. බොහෝම සහෝදරාත්මක විවේචනයක් මම කරන්නේ මොකද හේතුව කොයි වෙලාවේ හෝ මේක අනිත් පැත්තට පාලනය පිට පෙරළෙන්න පුළුවන්. ඔබතුමන්ලාට තේරෙන්න ඕනා ඔබතුමන්ලාගේ කණ්ඩායමේ විසිහයක් ඉන්නවා. එතකොට මේ විසිහයේ තියෙන ඒගොල්ලන්ගේ තියෙන ධාරිතාවයයි අපේ එක මන්ත්‍රීවරයෙක්ගේ තියෙන ධාරිතාවයයි අතර සංසන්දනය කරොත් මොකක්ද කියන එක ඔබතුමාට පැහැදිලි වෙයි.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමනි,මන්ත්‍රීවරුන්ගේ අත්දැකීම් මත තමයි බොහෝ දේවල් නිවැරදි කරගන්න පුළුවන්.දැනුම විතරක් මදි අත්දැකීම් ඕනා.මගේ මන්ත්‍රීවරු ගොඩක් තාම අත්දැකීම් ලබමින් ඉන්ගේ.අත්දැකීම් තියන මන්ත්‍රීවරුන්ගේ මැදිහත්වීම මම අගයනවා.මම නගරාධිපති හැටියට නිලධාරීන් ආරක්ෂා කර ගන්න ඕනා. හැබැයි මම ඒකෙම කිව්වා සමහරවිට කොච්චර කරත් ආරක්ෂා කරගන්න බැරි තත්ත්වයන් එනවා.එතකොට ඒක පෙරළා බලපානවා ජනතාවට. ඒ නිසා මං කියන්නේ මේ වෙලාවේ ඒ ඒ දෙපාර්තමේන්තුව ප්‍රධානියකුටම තමන්ගේ කාර්ය නිදහසේ කරගන්න ඕනා බාධාවක් නැහැ. ඒ කටයුතු කාර්යක්ෂම කර ගන්න අවශ්‍ය වන ක්‍රියාමාර්ග ටික ගන්නයි ඕනේ. කවදාවත් මම කිසි නිලධාරියෙකුට බලපෑම් කරන්නේ නෑ. මට ඕන වේගවත් ලෙස වැඩ කරගන්න හැම මන්ත්‍රීවරයාගේම මැදිහත්වීමත් නැතුව මේවා කරන්න බෑ. අපිට හැමදාම විරුද්ධව කතා කර කර ඉන්න පුළුවන්. එතකොට නාගරික සංවර්ධන අධිකාරියේ නීති රාමුවක් ඇතුළේ තමයි මේ පවතින්නේ. නගරාධිපතිට තීන්දු ගත හැකියි.ඒ ගන්න තීන්දුව නිලධාරීන්ගේ නිර්දේශයක් නැතුව ගියොත් පෙර හිටපු එක්කෙනාට වෙච්ච දේ වෙනවා. මම හැමතිස්සෙම කියන්නෙ නිලධාරීන්ගේ කටයුතු විශ්වාස කරලා ඔවුන් තමයි මේක කරන්න ඕනා. අරයටම ඕන ඕන විදියටම නෙමෙයි මේක කරන්න ඕනා.ඔබ කිව්ව හරි. දැනට එයාට අවශ්‍ය විදිහටම කොමසාරිස්තුමිය මේක වෙනස් කරන්න මහන්සි වෙනවා.අපිට සැහෙන අභියෝගයක් අරගලයක් තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටුවට අදාළව කරුණක් පැහැදිලි කර ගැනීමට අවශ්‍යයි. ගරු කොමසාරිස්තුමිය සැහෙන මහන්සි වෙනවා. මං හිතන්නේ පළාත් සභා අරමුදල් වෙන්න ඇති ඒ රුපියල් මිලියන පහක මුදලක් අපේ බේල් එකේ සංවර්ධන කටයුතු සඳහා වෙන්කර ගත්තා.අවාසනාවකට නාස්තිය හා කාර්යක්ෂමතාවය පිළිබඳව වැඩියෙන් කතා කරන ඔබතුමන්ලා අතින් මං හිතන්නේ මිලියන පහෙන් තුනයි දශම පහයි අපි ප්‍රයෝජනයට අරන් තියෙන්නේ. අනෙක් එකයි දශම පහක්ම අවිච්ඡේදනය වෙලා.ඔබතුමන්ලා මරණ ගෙදරකට ලයිට් එකත් ගහන එක නවත්තලා තියනවා. සම්පත් ඉතිරි කරගන්න ඕනේ කියලා. ඉතින් මේ අවස්ථාවේදී මං හිතන්නේ මේ වගේ මුදලක් අපි නාස්ති කර ගැනීම සම්බන්ධයෙන් අපිට ලොකු ගැටළුවක් තියෙනවා. ගරු නගරාධිපතිතුමනි,සිද්ධ වෙච්ච දේ වෙලා ඉවරයි. ඒ සඳහා ඔබතුමා ගන්න ක්‍රියාමාර්ග මොනවාද ඒවගේම තමයි ඉදිරියේදී දැන් අපි කුණු ටිකක් අදින්න ගියත් ලයිට් එකක් දාගන්න ගියත් ඔබතුමා නෙමෙයි.ඔබතුමාට අපි නිතරම කතා කරන්නේ නෑ. ඔබතුමාට කිව්වත් සතුටින් කියන්නේ නගරාධිපතිතුමා ඔබ ඒ වැඩේ කරල දෙනවා. නමුත් ඔබතුමාගේ කණ්ඩායමේ අය මෙච්චර අපි කුණු ටිකක් ඇදගන්න බැරි වෙලාවෙදි මෙච්චර මිලියන එකයි දශම පහක් නාස්ති වෙනකන් උඩ බලාගෙන ඉඳලා තියනවා.මීට පස්සෙ මේ වගේ දෙයක් ඇති නොවෙන්න ඔබතුමා ගන්න ක්‍රියාමාර්ගය සභාවට පැහැදිලි කරන විදිය මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටුවේ 02(01) අඟුලාන, ලුනාව පාලර් ඒක සම්බන්ධ මුලින්ම සාකච්ඡා කරද්දී කමිටුවට ඉදිරිපත් කරද්දී මේ ගැන මං සොයාබැලීමක් කරා ඉඩම සම්බන්ධව. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් කියලා ප්‍රාදේශීය ලේකම් එක්කත් සාකච්ඡා කරලා ඉඩම් නිලධාරි එක්ක කතා කරා. මේ ඉඩම කොටස් තුනකට තියෙන්නේ. කොටස් තුනෙන් එක කොටසයි ප්‍රාදේශීය ලේකම කාර්යාලට අයිතිය තියෙන්නේ. එයාලට අනෙක් කොටස් දෙක සම්බන්ධව පැහිදිලි වීමක් තිබුනෙ නැහැ. ඉතුරු දෙක සුදේශ් මන්ත්‍රීතුමා කර්මාන්ත කමිටුවේ ඉන්න කාලේ කොටස් දෙකක් නගර සභාව සතුද කියලා සැකයකුත් තිබුනා.ඒ ගැන සොයා බලන්න එතුමා වෙනම නිර්දේශයක් දුන්නා. මම හිතන්නේ නගර සභාව සතු කොටස් දෙකක් එතන තියනවා.

පාලර් එක මෙතනින් වෙන කොහාට හරි අරන් ගියොත් සුදුසු තැනක් කිට්ටුව අහල පහල නැහැ නගරාධිපතිතුමා. පොඩ්ඩක් ජනතාවට අවශ්‍ය වෙන්නේ ඔය ස්ථානයම තමයි මම හිතන විදියට. මෙම යෝජනාව ඉදිරිපත් කරේ මම. එතකොට කර්මාන්ත කමිටුවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එන අවස්ථාවේදි නිකං හෝ යුතුකමක් වශයෙන් මාව කැඳවුවනම් මටත් කථා කරන්න තිබුනා යෝජනාවට සාධාරණයක් වන විදිහට. ඉඩම් නිලධාරිනියත් එක්ක කතා කරාම එයාලට අයිතිය තිබුනෙ එක කොටසයි. කොටස් දෙකක් නගර සභාවට අයිතිය තියෙන්නේ. ඒ ගැන ප්‍රාදේශීය ලේකම්ට අයිතිය තිබ්බ එක කොටසයි නගර සභාවට තමයි මං හිතන විදියට අයිතිය. ඔබතුමාගේ වැඩි අවධානයක් යොමු කරලා මෙතන අපි පාලර් එක මෙතන හදමු කියලා මම යෝජනාව ඉදිරිපත් කරනවා. 02 (03) යෝජනාව මම ඉදිරිපත් කරල තියනව ලූනාව පස්වෙනි පටුමඟ, හයවෙනි පටුමග හා හත් වෙන්න පටුමඟ ඒ බෝක්කුව දාන්න වතුර බහින්න. මම හැමතිස්සෙම කිව්වා මේකෙ දෙකක් එක පාර කරන්න බැරි නම් එකක් හෝ මේ අවුරුද්දේ කරන්න ඊලග අවුරුද්දෙ හරි ඊට පස්සෙ හරි අනෙක් එක කරමු කියලා. මේ යෝජනාවට සමගාමීව 02 (06) යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. මම යෝජනාව ඉදිරිපත් කලේ 2025.08.12. එම යෝජනාවම 2025.09.18 වන දින ඉදිරිපත් කරලා තියෙනවා. මේක අයින් කරන්න කියලා කීහිපවතාවක්ම ඉල්ලීම් කරත් මේ සභාව තුළ ඒක අයින් කිරීමක් කරේ නෑ ඔබතුමන්ලා. ඒ යෝජනාවත් තියාගෙන ආවා. 2025 වසර අවසානයේදී කමිටුවක් කැඳවලා සී ජී ආර් එකෙන් වෙරළ සංරක්ෂණයෙන් ඇවිල්ල එතන බලන්න ගිහිල්ලා බෝක්කුව දාන්න නිර්දේශයකුත් දාගෙන තමයි ආවේ. එතකොට අපි මුදල් කොච්චරක් යනවද කියලා අපිත් සමීක්ෂණයක් කරා. කොරළවැල්ල, එගොඩඋයන ප්‍රදේශවල 2025 මුදල් වලින් ඒ ව්‍යාපෘතිත් කරා. යම්කිසි අවබෝධයක් ඔබතුමාටත් තියනවා මෙච්චර මුදලක් එක බෝක්කුවකට යනවා කියලා. එහෙම අවබෝධයක් ඔබතුමාටත් තියනවා මේ බෝක්කුව දාන්න මෙච්චර මුදලක් යනවා කියලා. එතකොට එහෙම අවබෝධයක් තියෙද්දි ලක්ෂ දොලහක් එවනවා එක බෝක්කුවක් සදහා ලක්ෂ හය ගානෙ. ලක්ෂ හයෙන් කරන්න බැහැ කියලා ඔබතුමත් දන්නවා. ලක්ෂ දොලහෙන් කරන්නත් බැහැ කියලා ඔබතුමා දැන දැන ලක්ෂ දොලහක මුදල් අනුමැතියක් දානවා. එතකොට නගරාධිපතිතුමා 2025 අවසානයේදී කිව්වා අපි එක බෝක්කුවක් හරි කරමු කියලා. එහෙම සාකච්ජාවකුත් ගියා. ලක්ෂ දොළහෙන් කරන්න බැහැ කියලා දැන දැනම මුදල් ලක්ෂ දොළහක් එතනට යොමු කිරීම සුදුසු දෙයක් නෙවෙයි. ඔබතුමාට හැකියාවක් තියනවානම් මේ වසර තුළ ඒ දොළහත් අරගෙන තව මොකද සුසාන භූමියට මුදල් ලක්ෂ පහළොවයි ගානක් වෙන් කරාට විශාල මුදලක් එතන ඉතුරු වුණා. ලොකු මුදලක් ගියේ නෑ. ඒ මුදලින් ඉතුරු මුදල මේ මෙතනට දාලා ගමේ වැඩේ නිසා අපිට පුලුවන් නම් එක බෝක්කුවක් මේ අවුරුද්දේ හදලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වගේම 02(06) යෝජනාවත් ඉදිරිපත් කරන්න බැහැ. නගරාධිපතිතුමා එහෙම යෝජනාවක් තියෙද්දී.ඔබතුමාගේ අවධානය ඒකට යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටුව යන අවස්ථාවේ සභාවට වෙලා තිබෙන විශාල පාඩුවක් සම්බන්ධව අපිට දැනගන්න ලැබුණා මේ වෙනකොට සභාවෙන් ඇණවුම් කරලා ගෙනල්ලා තිබුනා කෝලාස්වල ප්‍රමිතියෙන් අඩු තත්ත්වයක් තමයි තියෙන්නේ.ඒක නිසා මේ කෝලාස් වලින් ලෝඩ් කීපයක් අනලා සංවර්ධනය කරපු නඩත්තු කරපු මාර්ග මේ වෙනකොටත් ගැලවිලා ගිහිල්ලා තියනවා. ගරු නගරාධිපතිතුමනි සභාවක් හැටියට ලොකු පාඩුවක්.සභාව වෙනුවෙන් වෙච්ච ලොකු පාඩුවක්. මේ පාඩුව වෙනුවෙන් මොකක්ද අරන් තියන ක්‍රියාමාර්ග කියල දැනගන්න කැමතියි. මොකද කෝලාස්ටික රිටන් කරා කියලා මේකට උත්තරය ලැබෙන්නේ නෑ.ඒක කල යුතුයි. හැබැයි ලෝඩ් කීපයක් අනලා තවත් අමුද්‍රව්‍ය ගොඩාක් ඕනා වෙනවා.සේවකයන්ගේ ලොකු ප්‍රමාණයක් මේකේ සේවය කරනවා. එතකොට ඒගොල්ලෝ එතනට ගිහිල්ලා ශ්‍රමය යොදවනවා මේවාට ලොකු මුදලක් යනවා.ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරලා මේවා තමයි දැවැන්ත හොරකම් කියන්නෙ.වංචා දූෂණ හොරකම් කියන්නෙ.හැබැයි මේකත් ඔබතුමන්ලාට අත

සුද්ද කරගන්න පුළුවන්. අත පිහිද ගන්න පුළුවන් අපි හොරකම් කරලා නැහැ කියන එක නෙමෙයි මේකට උත්තරේ.ඔබතුමාට අපි තරයේ කියා සිටිනවා මේවට අපට විසඳුම් ලබා දෙන්න. ලොකු මුදලක් මේකෙ නාස්ති වෙලා තිබෙනවා.අපිට කියන්න නැවත මේවා ලබාගන්නෙ කොහොමද කියලා.කෝලාස් ටික රිටන් කරලා මේවාට උත්තර එනවා කියලා අපි විශ්වාස කරන්නෙ නැහැ.ඔබතුමාගෙන් සාධාරණ පිළිතුරක් හා සාධාරණ විසඳුමක් අපි මේකට බලාපොරොත්තු වෙනවා මොරටුවේ ජනතාව නියෝජනය කරන මහජන නියෝජිතයො වශයෙන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඊයෙත් කෝලාස් දාන්න ගියාම ගැලවෙනවා.මම මිස්ලත් එක්ක කතා කරාම කෝලාස් දාන ප්‍රමාණය වගේ දෙගුණයක් දැම්මොත් හරියනවා කිව්වා. මේක වෙන තැනකින් ගාණ වැඩියෙන් ගෙනල්ලා තියෙන්නේ ඒ නිසා කවුද ඕඩර් කරේ මොකක්ද කාරණය කියලා පොඩ්ඩක් හොයලා බලන්න ඕනා.නැත්නම් ඒකටත් අපහාස විදින්නෙ ඔබතුමන්ලා.අපිට ප්‍රිමික්ස් ලෝඩ් එකක් අල්ලලාවත් නැහැ මේ අවුරුද්දටම.නමුත් ප්‍රිමික්ස් දාන්න ඉල්ලලවත් නැති පාරවල් වලට ප්‍රිමික්ස් දානවා. ඒ කියන්නේ කෝලාස් අන්තිම බාලයි. ගාන වැඩියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>

02(14) මගේ යෝජනාවක් තියෙනවා. ධීවර නිවාස ප්‍රජාශාලාව අලුත්වැඩියා කර දෙන්න කියලා. සභාව සතු දේපළක් නෙමයි කියලා කමිටුවෙන් කියලා තියනවා.මට දැනගන්න පුලුවන්ද කොහෙටද අයිති කියලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ධීවර අමාත්‍යාංශයේ කිසිදු ලේඛනයක් නෑ. නාගරික සංවර්ධන අධිකාරිය පැත්තේ හොයන්න ඕනා. දැන් ඒගොල්ලොන්ගේ පැත්තෙන් ප්‍රතිපාදන වෙන් කරලා මේක සංවර්ධනය කළා. ධීවර අමාත්‍යාංශයේ නිකුත් කරපු සමහර ලිපි ලේඛන ගිහින් දුන්නා. නමුත් ඒ අයිතිය තහවුරු කරන මේකෙ සිද්ධ වෙච්ච ලොකු ප්‍රශ්නයක් තියනවා.මේ ඉඩම පවරගත්තේ ධීවර නිවාස හදන්න. මේක ධීවර නිවාස හදන්න පවරගෙන මේ මහල් නිවාස ටික හදාගෙන යනකොට මට දැනිච්ච දේ තමයි ඇත්තටම ධීවරයින්ට දෙන්න නෙමෙයි හැදුවේ. මේක තිබුනෙ ධීවර අමාත්‍යාංශය යටතේ. ඒ වෙලාවෙ ඕන අයට දෙන්න බැරි නිසා මේක වෙනස් කළා. මන්ත්‍රිවරු ගෙවල් දෙන ලැයිස්තුව හැදුවා. ඒ කවුරුත් ධීවරයො නෙමෙයි. ධීවරයො නොවන අයට ධීවර අමාත්‍යාංශයෙ තියන ඒවා දෙන්න බැහැ. ඒ නිසා මේ නිවාස මාරු කළා වෙන කුමන හෝ අමාත්‍යාංශයට කියලා මට හිතෙනවා. නිවාස සංවර්ධන අධිකාරිය පැත්තෙන් නිවාස අමාත්‍යාංශයට. කොහොමහරි දැන් වෙච්ච දේ තමයි මෙහෙම වෙනකොට ඒ අයට ගෙවල් අහිමි වෙන බව දැනගෙන ඔක්කොම එකතුවෙලා කඩාගෙන පැන්නා.ඔය නිවාස බලෙන් ඇල්ලුවෙ.ඒ වෙලාවෙ ධම්මික මහත්තයාත් දයාරත්න සර් සහ මමත් අපිත් මැදිහත් වුණා. ඒ නිසා මේ මොකක් හරි අදාල නිශ්චිත පරාගත්තු අමාත්‍යාංශක ලේඛන මොනවා හරි ධීවර අමාත්‍යාංශයත් එක්ක තමයි දැන් අපිට දිගටම මේ කටයුතු කරගන්න වෙන්නේ.ධීවර අමාත්‍යාංශය යටතේ තමයි තිබිය යුත්තේ වෙන තැනක නෙමෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ කාරණාව මෙහෙමයි ගෙවල් හදද්දි සල්ලි වෙන් කරන්න ඕනා මොකක් හරි අමාත්‍යාංශයකින්නෙ. අමාත්‍යාංශය යෝජනාවක් හෝ මොකක් හරි කැබිනට් පත්‍රිකාවක් අනුව මම දන්න විදියට අදාල සල්ලි වෙන්කිරීම හෝ අදාල යෝජනාව කරලා තියෙන්නේ සල්ලි වෙන් කිරීම හෝ අදාළ යෝජනා සියල්ල කරලා තියෙන්නේ ධීවර අමාත්‍යාංශයෙන්. එතකොට ධීවර අමාත්‍යාංශයෙන් ගෙවල් හදලා තියෙනවා. ඒ ගෙවල් කව්ද ගන්නෙ කියන එක නෙමෙයි වැඩේ

ඉඩමට මුදල් වෙන් කරලා ගෙවල් හැදීමත් එක්ක තමයි ඔය ප්‍රජා ශාලාවත් හැදෙන්න මං දන්න විදියට. මම දන්නෙ නැහැ.මේ ලියකියවිලි වෙනස් කම් තියනවාද කියලා.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීවරුනි,අපි මීට අදාලව ධීවර අමාත්‍යාංශයෙන් සාකච්ඡාවක් ඉල්ලමු.මම ඊට පස්සෙ මැදිහත්වෙලා විදුලිය අරගෙන දෙනකොට ධීවර අමාත්‍යාංශයෙන් තමයි ඒ අවසරය දුන්නෙ. විටින් විට මේ අමාත්‍යාංශ වලින් මැදිහත්වීම් කළාට මේක තමන්ට අයිති නොවන බව තමයි කියන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දූලිප් තිසේරා මහතා**</u>
ගරු නගරාධිපතිතුමා, මට මේක පොඩ්ඩක් කියන්නකෝ, එතකොට මේ නගර සභාවට අයිති දේපළක් නෙමෙයිනේ. ඒතකොට බැකෝ ඒහෙම දාලා සුද්ධ කරන්න පුලුවන්ද.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමා, සරළයිනේ, අපේ සමහර කාරණා තියෙනවා සෞඛ්‍ය බලධාරියා අපි. මිනිස්සුන්ට සෞඛ්‍ය ගැටලුවක් මතු වුනාම ඒ අයිතිය කාගෙද කියලා අපි හොයන් නෑ අර සෞඛ්‍ය ප්‍රශ්ණෙට විසඳුම් සොයනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දූලිප් තිසේරා මහතා**</u>
ගරු නගරාධිපතිතුමා, මට කියන්න මම දාපු යෝජනාව ඔබතුමා න්‍යාය පත්‍රයට ඇතුළත් කළේ නෑ. ගලිවලවල් ඇදලා දැනටත් ගලිවලවල්වල වතුර උතුරලා තියෙනවා.මම ඔබතුමාට අවුරුදු උත්සවය වෙලාවෙත් කිව්වා. දැනටත් තියෙනවා. මොකක්ද මගේ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න බැරි හේතුව.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමා, ඒක අපිට අදාළ නැනේ. අපට අයිති නොවන දේපළක්. සමහර විට ඒ අයගේ සෞඛ්‍ය ගැටලුවක් මතුවුණම න්‍යාය පත්‍රයට ඇතුළත් කරන එක නෙමෙයි . මිලියන තුනක් වෙන් කරලා තියෙනවා ඔබේ ප්‍රශ්ණෙට.අපි නෙමෙයි. මිලියන තුනක් වෙන් කරලා තියෙනවා සම්පූර්ණ මළ නාලිකා පද්ධතියම අලුත්වැඩියා කරන්න. එහා බිල්ඩින් දෙකේම ප්‍රශ්නේ තාම තියෙනවා. අපි හැදුවේ ඉස්සරහ ප්‍රධාන වල විතරනේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දූලිප් තිසේරා මහතා**</u>
මම කියන්නේ ගරු නගරාධිපතිතුමා, ඔබතුමා අපේක්ෂක වෙච්ච වෙලාවේ මගේ ලඟට ඇවිල්ලා

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමා,නැවත නැවත මතු කරන්න එපා. ඔබලා මට විරුද්ධව අල්ලස් එකටත් ගිහිල්ලා පැමිණිල්ලක් කළානේ ඔය සම්බන්ධව. ඔබතුමන්ලා කරපු පැමිණිල්ලට ඇතුළේ අදත් හිරවෙලා තියෙනවා ඔඩිට් ඒක මේකට විරුද්ධයි. ඒතකොට ඒ රජයේම ආයතනයක් ඒකට ගෙවීම කරගන්න බැරුව ඉන්නවා.ඒනිසා ඒගොල්ලෝ එන්නේ නෑ ඉතුරු ටික හදන්න.මේක දේශපාලනිකව බෙදා ගැනීමට යන්න එපා.ඔබ හොඳ වැඩක් කරනවා නම් ඒකට අපි එකඟයි.

<u>**මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>
ගරු නගරාධිපතිතුමා, ඒකේ අයිතිය තියෙන්නේ ධීවර අමාත්‍යාංශයට තමයි. විශේෂයෙන් ඔබතුමා මතක් කරපු විදිහට පවුල් 61කට ඔතන විදුලිය තිබුණා. ඉතුරු පවුල් 03ට විදුලිය ගන්න අවශ්‍ය අධිකාරිය බලය තියෙන නිසා ලිපි ලබාගත්තේ එහෙන්. විශේෂයෙන් ඒ පවුල් 03ට මගේ මන්ත්‍රී වැටුප එකතුර කරලා තමයි විදුලිය ලබාදුන්නේ එහෙන් ලිපි අරගෙන. ඊට පස්සේ ඔය ව්‍යාපෘති සම්බන්ධව ගද්දි මහජන උපයෝගිතා කොටස යටතේ ගත්තේ ඕක ධීවර අමාත්‍යාංශයට අයිති වුණාට එවකට අමාත්‍යාංශ දෙකකින් ප්‍රතිපාදන අරගෙන තමයි ස්වරේජ් ලයින් එක ස්ථාපිත

කළේ.එකක තමයි ඔබතුමා දන්නවා බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම වාරිමාර්ග අමාත්‍යාංශයෙන් මිලියන 04ක් විතර අපිට ලැබුණා. ඉතුරු ටික විශේෂයෙන් මම මැදිහත්වෙලා ජී.කී.ඕ. ප්‍රොජෙක්ට් එක යටතේ මොරොක්කෝවල තියෙන කාර්යාලයෙන් තමයි ප්‍රතිපාදනයක් විදිහට පිටු 48ක මට මතක විදිහට මම මැදිහත් වෙලා ප්‍රොජෙක්ට් ප්‍රපෝසල් එකක් යවලා ඒ සල්ලි ගෙන්න ගත්තේ.ඒ ව්‍යාපෘතිය ජාත්‍යන්තර මට්ටමේ ට්‍රීට්මන්ට් ප්ලාන්ට් ඒකක් විදිහට කරන්න පුලුවන් වුණේ ඒ ව්‍යාපෘතිවල මැදිහත්වීම නිසා. ඒනිසා ප්‍රතිපාදන ගන්න ඒක ප්‍රශ්ණයක් නෑ අයිතිය තියෙන්නේ ධීවර අමාත්‍යාංශයට එගොඩඋයන නිවාස සංකීර්ණයේ. ඒවගේම එතන ප්‍රජාශාලාව හදන්න ප්‍රතිපාදන ලබාගත්තේ, ඕක කැඩිලා බිඳිලා තිබුණේ, මිනිස්සුන්ට මරණයක් වුණාත් ගෙනියන්නේ උඩට තමයි ගෙනියන්න වෙන්නේ. ඒනිසා ප්‍රතිපාදන ලබාගත්තේ විශේෂයෙන්ම විමධ්‍යගත අරමුදල්වලින්. ඒ අනුව තමයි ප්‍රජා ශාලාව හැදුවේ. ඊට පස්සේ ඒකේ නඩත්තු කිරීමේ ප්‍රශ්ණයක් නිසා අකාලයේ විනාශ වෙලා ගියා. ඊට පස්සේ ගත්තම ජලය තිබුණේ නෑ.ගොඩාක් වෙලාවට ගෙදර මහත්තුරු වැඩ ඇරිලා එනකොට ගෙදර නෝනලා තමයි තට්ටු හතරට කළ වලින් වතුර අදින්නෙ. ඒ නිසා ජලය ලබාදීමට මම මැදිහත්වීමක් කලේ ජලසම්පාදන මණ්ඩලය හරහා ඊට පස්සෙ පොදු පයිප්ප කැපීමේ පදනම මත පවුල් හැටහතරට ජලය ලබාදෙන්න මැදිහත්වුනා.මේකෙ ධීවර අමාත්‍යාංශයට තමයි වගකීම තියෙන්නේ.දැනටත් ඒ ට්‍රීට්මන්ට් ප්ලාන්ට් එකේ තියන සිකුරිටි සිස්ටම් එක තියනවා.ගරු නගරාධිපතිතුමනි,ඔබතුමත් සභාවේ කතා කරාට පස්සෙ මමත් පොජෙක්ට් ඒකේ ඉන්න දිල්ෂාන් ඉංජිනේරුතුමත් වන්දන මහත්තයත් දැන් ඉන්නෙ ජර්මනියෙ.එතුමාට මම වට්ස්අප් කෝල් එකක් අරගෙන සම්බන්ද කරලා දුන්නා ප්‍රාදේශීය ලේකම්තුමාට.ඒ ව්‍යාපෘතිය කරලා ඒ මිනිසුන්ට සහනය දෙන්න පුලුවන්.ඒ නිසා මගේ පැත්තෙන් කරන්න ඕනා සහයෝගය මම කරා.ඒක ඉෂ්ඨ කල යුතු කාරනාවක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,කර්මාන්ත කමිටුවේ අංක 02(08) පාරමී පෙර පාසල එගොඩඋයන,දකුණ මිලියන හයයි දශම හතක් ඇස්තමේන්තු කරලා ලේඛනගත කරලා තියනවා.ලේඛනගත කරලා කොච්චර කාලයක් යයිද දන්නෙ නැහැ.ඒගොඩඋයන ජනතාවට අයිති භුක්ති විඳිය යුතු කාරණාවක් මේක.02(10) යෝජනාව ඔබතුමා විසින් දෙදහස් දහඅටේදී මහා සභාවට ඉදිරිපත් කරපු යොජනාවක්. මා විසින් දෙදහස් විසිහයේදී ඉදිරිපත් කරනවා.මේක මිලියන දෙකයි දශම හතරක් ඇස්මේන්තු ගත කරනවා.නමුත් ඒකත් ලේඛනගත වෙනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමිය,ඒක හෙට අනින්දට කරනවා .

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, 02(29) යෝජනාව මගේ යෝජනාවක් සොයිසාපුර බී01,බී02 ජනවාරි කමිටුවට ඉදිරිපත් වෙන්නෙ.ඒකේ නිර්දේශයක් සඳහා ජල ප්‍රවාහන මණ්ඩලයට ලියුමක් ලියනවා 2026.04.08 වෙනිදා. ජනවාරි මාසයේ කතා කරන වාර්තාවෙ නිර්දේශය සම්බන්ධ අදාල වාර්තවේ අදාල ආයතනයට ලියුම ලියන්නෙ මාස දෙකතුනක් ගිහිල්ලා.ඒ නිසා එතන ලොකු ගැප් එකක් තියනවා.අපිට සාර්ථකත්වයක් ගන්න බැහැ.අපිට යෝජනාවක් ඉදිරිපත් කරලා කාලයක් තිස්සෙ බලන් ඉන්න වෙනවා.කර්මාන්ත කමිටුවට ලියමු ලිවීම සම්බන්ධව සෙකට්රි කෙනෙක් විශේෂයෙන් දෙන්න වෙනවා.ලියම් ලිවීම සම්බන්ධව ඒ අදාල ආයතනවලට.අපි කමිටුවේ කතා කරලා මාස දෙකතුනක් යනවා ඒ ලියුම් අදාල ආයතනවලට යන්න.මම හිතනවා කොමසාරිස්තුමිය ලියුම් අදාල ආයතනයට යවන එක ගැන අවධානය යොමු කරයි කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම මෙතන වෙන අයිතමයක් නැති නිසා මෙතනින් මතු කරන්න අවශ්‍යයි කියලා මට හිතුනා.ඒක යුතුකමක් මුළු සභාවෙන්ම සහ ඔබතුමා ඇතුලු.පසුගිය කාලයෙ කරදියාන කසල කන්දෙ දැවැන්ත ගින්නක් ඇතිවුනා.ඒකට දූල්සිරි මහතාගේ සහ ගිනි නිවීම් කණ්ඩායමේ මැදිහත්වීම ඉතාම විශ්ෂ්ටයි.ගින්න ඇතිවෙච්ච වෙලාවෙ සුදේශ මන්ත්‍රීතුමා එතනට ගිහිල්ලා හිටියා.අපේ කණ්ඩායම දවස් දහයක් දොලහක් වැනි දින ගානක් ගොඩාක් මහන්සි වුනා. මෙතුමන් ඇතුලු කිහිපදෙනෙක් අසනීප වුනා.ගරු නගරාධිපතිතුමනි මේකෙ තවදුරටත් විශේෂයෙන් විදුලි ගින්නක් ආවොත් අපි හැලජන් පාවිච්චි කරනාව.අපේ රසායනික ද්‍රව්‍ය තවදුරටත් පාවිච්චි කරන්න පුලුවන් ක්‍රමවේද සහ ඊට අදාල පුහුණුව ලබාදීමට කටයුතු කරනවා වගේම කසල කන්ද ලග දින දොලහක වගේ කාලයක් හිටපු නිසා විශේෂයෙන් ඩයොක්සීන් සහ පියුරාන් කියන වායුත් එක්ක ප්‍රදේශවාසීන් සියලු දෙනාට විශාල ගැටලු මතුවෙලා තියනවා.බොරුපන,මේ පැත්තෙන් වෙරළුහැර,මේ පැත්තෙන් කැස්බෑව ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රදේශ සහ අපේ සේවකයන්ගෙ.ඒ නිසා ඔවුන්ට සෞඛ්‍ය පරීක්ෂණයක් අනිවාර්යයෙන්ම කලයුතු තත්ත්වයක් තියනවා කියලා මම විශ්වාස කරනවා.ඔවුන්ට සෞඛ්‍ය පරීක්ෂණයක් කරන්න කමිටුව විදියටත් සභාව විදියටත් කටයුතු කරයි කියලා විශ්වාසය තුළ මම ඉන්නවා.මේකෙ යම් විදියකින් වායු වෙනස්වීමක් තියෙනවානම් මධ්‍යම පරිසර අධිකාරියත් අනෙකුත් ආයතන ටිකත් සම්බන්ධ කරගෙන ඒ ප්‍රදේශයේ වායු පරික්ෂණයක් සිදු කිරීමට මැදිහත් වෙන්න කියලා මම ගරු සභාවට යෝජනා කරනවා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.10 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රි | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රි | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රි | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රි | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රි | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රි | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රි | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රි | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රි | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රි | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතරණ මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රි | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රි | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රි | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රි | - | කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රි | - | තුසිත් ද සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රි | - | ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රි | - | ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රි | - | බී.සරෝජනී මැන්දිස් මහත්මිය |
| 23. | මහා නගර සභා මන්ත්‍රි | - | එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |

24. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.10 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(01), 02(03), 02(06) යන කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.10 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - පී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්.චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
16. මහා නගර සභා මන්ත්‍රී - එච්. චන්දන පිලාන විතානගේ මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.10 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.03.11 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එච්. එල්. තිළිණි නෙත්සරණි මෙනෙවිය)

**06(09) 2026.04.21 දිනැති මුදල් පිළිබඳ ස්ථාව කමිටු නිර්දේශයන් සලකා බැලීම**

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ වැය ශීර්ෂය 1004 සභික දීමනා ජනවාරි හා පෙබරවාරි මාසයට මිලියන 2.70ක් එන්න ඕන එක, මිලියන 3.1ක් කියලා සඳහන් වෙනවා. ඒක පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න පුලුවන්ද? මිලියන 1.35ක වෙනසක් තියෙනවා මෙහි. ගිය සභා වාරයේදීත් මේ පිළිබඳව වැරදීමක් තිබුණා. ජනවාරි සිට මාර්තු දක්වා අපේ සභික දීමනාව මිලියන 04ක් වෙලා තියෙනවා. සභාවේදී සෑම දෙයක්ම පෙනෙන්නේ නැහැ නගරාධිපතිතුමනි. මේවා සභාවේ ලේඛනගත වෙන වාර්තාවක්නේ මේවා. සභාවට අයිතියක් තියෙනවා මේ පිළිබඳව දැනගන්න. මම කණගාටු වෙනවා මේ තරම් සභිකයින් ඉන්නවා එක්කෙනෙකුවත් මේක දැක්කේ නැද්ද කියන එක. මුදල් කමිටු වාර්තාව සෑම කෙනෙකුටම ලැබෙනවානේ. මම කණගාටු වෙනවා ඔබතුමාගේ පාර්ශවය හරි ඒ පිළිබඳව අවධානය යොමු නොකිරීම පිළිබඳව.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, එතුමිය කියන්නේ මාසිකව යන සභික දීමනාවට අනුව ජනවාරි හා පෙබරවාරි එකතුව පෙන්වනවානේ. තුන්ලක්ෂ විසිහතරදාහක් පෙන්වනවානේ ජනවාරි, පෙබරවාරි මාස වල. මාර්තු මාසෙට එන්නේ ලක්ෂ 10යි. එතුමිය කියන්නේ එතැන වැඩිවීමක් තියෙනවා. ඔබතුමිය ගිහිල්ලා අපේ නාගරික ගණකාධිකාරීතුමිය සමඟ කතා කරලා කොහොමද එහෙම වැඩි වුණේ කියලා බලන්න. මීළඟ මුදල් කමිටුවේදී මේ පිළිබඳව ඔබතුමිය ගෙන්න ගන්න. සභාවට අයිතියක් තියෙනවා මේ පිළිබඳව දැනගන්න එය ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. දැන් මුදල් කමිටුවේ සාමාජිකාවක් මුදල් කමිටුවට සම්බන්ධ වෙනවා. මෙහෙම වෙනසක් ඒ වෙලාවේදිත් තිබුණා. මිළඟ කමිටුවේ දී මේ සම්බන්ධයෙන් ඔබතුමියට පිලිතුරු ලැබුණේ නැතිනම් මීළඟ සභා වාරයේදී මේ පිළිබඳව කතා කරන්න. මම ඔබතුමියට ස්තූතිවන්ත වෙනවා මේ පිළිබඳව ඉදිරිපත් කිරීම සම්බන්ධව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ පිටු අංක 12, අංක 11 කරුණ නාගරික ඉංජිනේරු විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සලකා බැලීම, මේකේ තියෙන්නේ උක්ත කරුණ සලකා බැලූ කමිටුව උක්ත කරුණට අදාළව ගරු නගරාධිපතිතුමා විසින් ලබා දී ඇති අනුමතිය ප්‍රකාරව එම කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානයක් මඟින් ඉටු කරවා ගැනීමට නිර්දේශ කරන ලදී. එතකොට අපිට දැන් තියෙන ගැටලුව මොරටුව මහා නගර සභාවේ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරලා තියෙනවා. එතකොට මෙහෙම ලියාපදිංචි කරලා තියෙද්දි ද සොයිසා ක්‍රීඩාංගනයේ ගාලු පාර දෙසින් ඇති ටෙරසේ ගැලවී ඇති දැල නැවත සවි කිරීම සඳහා මෙහි ආරක්ෂිත දැලක් සවි කරන්න ඇයි මේක ප්‍රජා පාදක සමිතියකට දෙන්නේ? ඇයි මේක කොන්ත්‍රාත්කරුවන් ගන්න බැහැයි කිවුවාද? මේක ටෙන්ඩර් කළේ නැත්තේ ඇයි? කියලයි අපි අහන්නේ. ඇමුණුම් අංක 09. මම අහන්නේ ඔබතුමාගෙන් නිර්දේශය පිළිබඳව උක්ත කරුණ සලකා බැලූ කමිටුව නගරාධිපතිවරයාගේ නිර්දේශය මත කියලා තියෙන්නේ. මේ ඇමුණුම් අංක 09 තියෙන්නේ මෙම

කර්මාන්තය ඉටු කිරීම සඳහා ගරු නගරාධිපතිතුමාගේ උපදෙස් ලැබී ඇත. ලංසු කැඳවා ඉටු කිරීමට අවම වශයෙන් දින 07ක් පමණ ගතවන බැවින් ප්‍රජා පාදක සංවිධානයක් මඟින් මෙම කර්මාන්තය ඉටු කරවා ගැනීම සුදුසු වේ. කාරුණික උපදෙස් සහ නියෝග සඳහා ඉදිරිපත් කරමි කියලා නාගරික කොමසාරිස්ට දාලා තියෙනවා නාගරික ඉංජිනේරු. එතකොට දැන් අපිට තියෙන ගැටලුව ඇයි මේක මෙච්චර හදිස්සි. ඇයි මේක මේ ටෙන්ඩර් කරලා මේක විනිවිදභාවයෙන් යුක්තව දෙන්න බැරි ඇයි?

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔව් ඒකේ නීතිමය ගැටලුවක් මොකක්හරි තියෙනවාද? ඒ කියන්නේ අපිට බොහෝ වැඩ කටයුතු ඉක්මන් කරගන්න තියෙන වුවමනාව, ප්‍රජා පාදක සංවිධාන කියන්නේ නීත්‍යානුකූල සමිති. එතකොට ප්‍රජා සංමිති වලට ලබා දීමේ අයිතිය තියෙනවා. එතකොට ටෙන්ඩර් කර කර කාලය ගත කරනවා වෙනුවට මේ අත්‍යාවශ්‍ය කටයුත්තක් ප්‍රජා සමිතියකට දීලා කරවා ගැනීමේ වුවමනාව තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔව් නීතිමය ගැටලුවක් තියෙනවා. මේක මොරටුව මහා නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නෙවෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තමයි තියෙන්නේ ප්‍රජා පාදක සමිති. හැබැයි මොරටුව මහා නගර සභාවට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෝ ඉන්නවා. ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට දෙන්න බැරි සාධාරණ හේතුවක් තියෙනවානම් විතරයි ප්‍රජා පාදක සමිතියකට දෙන්නේ. නමුත් ඔබතුමාගේ මෙහිදී තර්කය වෙන්නේ කාලය සම්බන්ධයෙන් ගැටලුවක්. මේ කාලය ඉතුරු වෙන්නේ නැහැ ප්‍රජා පාදක සමිතියකට දුන්නාට. තව වැඩිපුර කාලයක් යනවා ඒකට. මම දන්නේ නැහැ ඔබතුමා කුමන අරමුණකින් මෙය ප්‍රජා පාදක සමිතියකට දුන්නාද දන්නේ නැහැ. ඔබතුමාගේ තීරණය ඔබතුමා හරි කියලා හිතෙනවානම් අපිට ප්‍රශ්ණයක් නැහැ. නමුත් අපි කියන්නේ මේ තීන්දුව වැරදියි කියලා. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 13 මෙහි නාගරික ඉංජිනේරු විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සලකා බැලීම මොරටුව මහා නගර සභාව වෙත අවශ්‍ය කෝලාස් සපයා ගැනීමට 2026.03.31 දිනැති ඇනවුම් කිරීම මුදල් කමිටු නිර්දේශයට හා මහා අනුමැතිය සඳහා මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරමි. මේකේ ගරු නගරාධිපතිතුමනි, 2026.03.31 දින ඇනවුම් කිරීම සඳහා අනුමැතිය ලබාගෙන තියෙනවා. ඔබතුමා ලබා දීලා තියෙනවා වටිනාකම එකොලොස්ලක්ෂ පහලොස් දහස් එකසියයි. එතකොට උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත සඳහන් ඇනවුම, ඇනවුම් කිරීමට නිර්දේශ කරන ලදි කියලා තියෙනවා. මේකේ අංක 12 තියෙනවා මොරටුව මහා නගර සභාව වෙත අවශ්‍ය කෝලාස් සපයා ගැනීමට 2026.03.31 දිනැති ප්‍රසම්පාදන කමිටු නිර්දේශය සඳහා අනුමැතිය මුදල් කමිටු නිර්දේශයට හා මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව වෙත ඉදිරිපත් කරමි. ප්‍රසම්පාදන කමිටු නිර්දේශය දීලා තියෙනවා 2026.03.31 දිනයෙන්. නගරාධිපතිතුමා සාමාන්‍යයෙන් ප්‍රසම්පාදන කමිටු නිර්දේශය ලැබෙන්නෙත් 2026.03.31, ඇනුවුම් කිරීමට නිර්දේශය ලැබෙන්නෙත් 2026.03.31 දිනයෙන්. සාමාන්‍ය ක්‍රමවේදය තමයි ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මුදල් කමිටුවට ඇවිල්ලා සම්මත වුණාට පස්සේ තමයි මෙය ඇනවුම් කරන්න අවස්ථාව තියෙන්නේ. ඉතින් මේක එකම මොහොතේ එකම දිනයෙන් තමයි මේ සිද්ධ වෙලා තියෙන්නේ. නමුත් මෙහෙම සිද්ධ වුණ ගනුදෙනුව දූෂිත ගනුදෙනුවක් වෙලා තියෙනවා අද වෙනකොට. කෝලාස් ගෙනෙල්ලා කෝලාස් ටික ප්‍රමිතියෙන්

තොරයි. ගල් අඟුරු වගේ තමයි මේ කෝලාස්. ඒ නිසා ගරු නගරාධිපතිතුමා අපිට ප්‍රශ්ණය තියෙන්නේ මේකට කවුද සම්බන්ධ වුණේ? මේ සම්බන්ධයෙන් අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා කරුණාකරලා කමිටුවක් පත් කරලා ඇයි මේ ප්‍රමිතියෙන් බාල කෝලාස් ගේන්න ක්‍රියාත්මක වුණේ? මේ වැඩේ කළේ කවුද? මේක ගරු නගරාධිපතිතුමා ඔබතුමාට බැහැර කරන්න බැහැ මොකද හේතුව මේක ඔබතුමාගෙවත් මගේවත් සල්ලි නෙවෙයි. මේවා මොරටුවේ මහා ජනතාවගේ බදු මුදල් වියදම් කරලා තියෙන්නේ කාබාසිනියා කරලා තියෙන්නේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අපි ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලනවා මේකට වහාම ක්‍රියාත්මක වන පරිදි ස්වාධීනව කමිටුවක් පත් කරලා මේක හොයන්න මොකද්ද මේකේ වෙලා තියෙන්නේ කියලා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේතුමා මේ කතා කරන කාරණාව පිළිබඳව මටත් ගැටළුවක් තියෙනවා. මම අද උදෙත් කතා කළා මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ගෙන්. මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය හරහා පරීක්ෂණයක් කරන්න පුළුවන්ද? පරීක්ෂණයක් හරහා අපිට වාර්තාවක් ලබා දෙන්න. මේ හදිස්සි කියලා මේවා ගණන් යනවා අරවා ගණන් යනවා කියලා එතකොට අපිත් පෙලෙනවානේ මේ ගණන් යන එකෙන් හැකි ඉක්මනින් මේ බඩු ටික ගෙන්න ගන්න. මෙවැනි අවස්ථාවක් ආවාම ඔබතුමා ඉදිරිපත් කරන කාරණාව පිළිගෙන ඒ පිලිබඳව අපි විධිමත් පරීක්ෂණයකට යමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ ගෞරවය ඒ සම්බන්ධයෙන් පිරි නමනවා. දැන් ඒකට ස්වාධීන පරීක්ෂණයක් කරනවානම් ස්වාධීන වෙන්න ඕන. පරීක්ෂණයක් කරනවා කියලා අර සොයිසාපුර කලාපයේ පරීක්ෂණය වගේ වෙන්න බැහැ. ස්වාධීන පරීක්ෂණයක්නම් ඔබතුමා කරන්නේ අපි අනිවාර්යෙන්ම ඔබතුමාට උපරිම සහයෝගය ලබා දෙනවා. ඒකේ තර්කයක් නැහැ, අපිට දේශපාලනයක් අදාළ නැහැ. අපි කියන්නේ මේක කවුරු කළත් වැරැද්ද වැරැද්දමයි. ඒ නිසා ඒ වැරද්ද නිවැරදි කරන්න.

අනෙක් කරුණ 15(1) මේ අතිකාල ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරලා තියෙනවා ප්‍රධාන පරිපාලකවරු. ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුවේ සභාපතිවරයාත් ඉන්න නිසා මම මේ අවධානය යොමු කරන්නේ මේ කලාප වල එක එක ක්‍රමවේදයන් ක්‍රියාත්මක වෙනවා ගරු නගරාධිපතිතුමා. සමහර ප්‍රධාන පරිපාලකවරු සියලු දෙනාම නෙවෙයි, බොහොම වැදගත් පරිපාලකවරු ඉන්නවා. සභාවට බොහොම ආදරයෙන් වැඩ කරන කට්ටිය ඉන්නවා ඒ අයට අපේ ගෞරවය. මේකේ ප්‍රශ්ණය තියෙන්නේ නගරාධිපතිතුමා සමහර සේවකයන්ගේ පැමිණීම පිටවීම අත්සන් කරන්නේ ප්‍රධාන පරිපාලකවරු. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා ඔබතුමාගෙන් දැන් මේ නගර සභා පරිශ්‍රයේ වැඩ කරන මේ අපේ සේවක සේවිකාවන්ට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතයට දාලා තියෙනවා. නමුත් මේ කලාප වල ඉන්න සමහරු ඒ ඇඟිලි සලකුණු ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා සමහරු එයින් අයුතු ප්‍රයෝජන අරගෙන සේවයට වාර්තා කරන්නේ නැහැ නගරාධිපතිතුමා අපි බොහොම වගකීමෙන් කියන්නේ. ඔබතුමා ඇහුවොත් ඒ කොහෙද කියලා ඔබතුමාට පෞද්ගලිකව නම් සමඟ දෙන්න පුලුවන් අපිට මේක. ඒ නිසා කරුණාකරලා අපි ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන්, මේ සම්බන්ධයෙන් මහා ලොකු වියදමක් යන්නේ නැහැ. මේ නගර සභාවේ වැඩ කරන සියල්ලන්ටම එකම නීතියක් ක්‍රියාත්මක වෙන්න ඕන. ඒ නිසා ඇඟිලි සලකුණු යන්ත්‍රය මෙයට ක්‍රියාත්මක කරන්න. ගරු නගරාධිපතිතුමනි, 15(03) කරුණ අපි ආයතන කමිටුවේ විරුද්ධ වුණ කාරණාවමයි ඇවිල්ලා තියෙන්නේ, සේවකයන් 15 දෙනෙකු බඳවා ගැනීම සම්බන්ධයෙන් ඒ

පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා ඒක නීත්‍යානුකූල නැති බව පැහැදිලි කියන්නට ඕන.

ගරු නගරාධිපතිතුමනි, 15(04) කරුණ 2026.04.06 දිනැති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද නාගරික ඉංජිනේරු විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සලකා බැලීම මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මොරටුව මහා නගර සභාව සතු පෙර පාසල්, ආයුර්වේද බෙහෙත් ශාලා, මාතෘ හා ළමා සායන, සුපිරි වෙළඳසැල්, සභාව සතු කඩ කාමර පිහිටි ස්ථාන, ක්‍රීඩාංගන, ජාත්‍යන්තර ක්‍රීඩාංගන, පුස්තකාල, වෛද්‍ය රසායනාගාර, ශ්‍රවණාගාර, සුසානභූමි, ආදාහනාගාර, ප්‍රජාශාලා, දිවාසුරැකුම් මධ්‍යස්ථාන, දිනපොල වශයෙන් ගොඩනැඟිලි රැසක් පවතී. මෙම ස්ථානවල නිරන්තරයෙන් අළුත්වැඩියාවන් සිදුකිරීමට සිදුවේ. නමුත් මෙම සභාවේ පෙදරේරුවෙකු නොමැති වීම හේතුවෙන් බොහෝ අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුව ඇත. ඒ අනුව ස්ථිර තනතුරු සඳහා පෙදරේරුවෙකු බඳවා ගන්නා තෙක්, මේක මේ පෙදරේරුවෙක් ගන්න ඕන කියන තැන අපිත් ඉන්නවා. එහි කිසිදු තර්කයක් නැහැ. නමුත් මේ කියලා තියෙන ක්‍රමවේදයට යන්නේ නැතුව මේකේ අපේ නගර සභාවේ වැඩ කරන පෙදරේරුවෝ ඉන්නවා. මේ නගර සභාවේ වැඩ කරන හොඳ දක්ෂ පෙදරේරුවෝ ඉන්නවා. ඉතින් ඒ නිසා ඔබතුමාට පුළුවන් අපේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකට කිව්වානම් නැතිනම් ඉංජිනේරුතුමාට කිව්වානම් පෙදරේරුවෙක් දෙන්න කියලා මොහොඳ ඔහොම කාණු සුද්ධ කරන්න ආව ළමයි තමයි අද ගරාජ් එකේ හොඳම වැඩකාරයෝ වෙලා තියෙන්නේ. ගරාජ් එකේ හොඳටම වැඩ කරන්නේ මේ අය. ඒ නිසා ඔබතුමා පොඩ්ඩක් හොයලා බලන්න ඒ වගේ දක්ෂ වෘත්තිකයන් අපේ ළඟ ඉන්නවා. අපි ඒ අයගෙන් ප්‍රයෝජනයක් ගන්නේ නැති එකයි ප්‍රශ්ණය තියෙන්නේ. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා මොකද හේතුව මේවා බදු ගෙවන ජනතාවගේ මුදල් නිසා ඒවා කළමනාකරණය කර ගන්න පුළුවන්. මම ඔබතුමාට කිව්වා ආයතන කමිටුවේ දී සැලසුම් අංශය සම්බන්ධයෙන්, සැලසුම් අංශයේ මෙය දාලා තියෙන්නේ ආයතන කමිටුවෙන් නාගරික ගණකාධිකාරී මේක දානකොට දාලා තියෙන්නේ කොටසක් කියවනවා කාලය යන නිසා. උදාහරණ ලෙස වායුසමීකරණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ආදීය අක්‍රීය වීම මත අළුත්වැඩියා කටයුතු සඳහා විශාල කාලයක් වැය වීම ඒක නිසා තමයි අතිකාල ඉල්ලන්නේ. ඇයි මේගොල්ලන්ද ඒවා හදන්නේ. මේ මේවා අළුත්වැඩියා කරන්න කාලයක් යනවලු. මෙයාලද මේවා හදන්නේ ඒකයි අපිට තියෙන ගැටලුව. මේකේ තියෙන්නේ ඉහත සඳහන් පරිදි මසකට පැය 10 බැගින් අතිකාල ප්‍රමාණයක් සැපයුම් අංශයේ කළමනාකරණ සේවා නිලධාරීන් තිදෙනා සඳහා ලබා දීමට නිර්දේශ කරන ලදී කියලා තියෙනවා. මේ ඉල්ලීම් කොච්චර දුරට සාධාරණද කියලා පොඩ්ඩක් හොයලා බලන්න කියන ඉල්ලීම කරනවා. මොකද මම දැක්කා මෙතැන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ සේවකයෝ ඉල්ලලා තියෙනකොට ඒක ප්‍රතික්ෂේප කරලා තිබුණා. ඒක ප්‍රතික්ෂේප කරලා මේ අපේ ප්‍රධාන පරිපාලකවරු ඉල්ලලා තියෙනකොට ඒක ප්‍රතික්ෂේප කරලා තිබුණා. මොකද ඒ මිනිස්සු වැඩ කරන මිනිස්සු. මේ වැඩ කරන මිනිස්සුද? ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු නගරාධිපතිතුමනි, 16 වෙනි පිටුව මෙහි තියෙනවා විශ්‍රාමික සේවක සේවිකාවන් ඇගයීම. ඒක ඉතාමත්ම හොඳ වැඩක් ඔබතුමාගේ යෝජනාවක් කියලා තමයි ආරංචිය තියෙන්නේ. ඒ සම්බන්ධයෙන් ගෞරවය හිමි වෙනවා. හැබැයි කරලා තියෙන විදිහ තමයි වැරදියි. මේකේ වැඩේ ඔක්කෝම ඉවර කරලා තමයි ඇවිල්ලා තියෙන්නේ මුදල් කමිටුවට. ඒ නිසාම තමයි හිටපු නගරාධිපතිවරයා මේ අල්ලස් එකේ ඉන්නේ දිගටම නඩුව යන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න මේවා මේ කරන්න ඉස්සෙල්ලා ක්‍රමවේදයක් හදා ගන්න.

මොකද වැඩේ හොඳයි නමුත් වැඩේ කරලා තියෙන විදිහ හරියන්නේ නැහැ. මේකේ තියෙනවා 18 පිටුවේ, 16 කරුණ අර ජලභීතිකා එන්නත් කිරීමේ වැඩසටහන ඒක මම සෞඛ්‍ය කමිටුවේ දී කතා කරපු නිසා ඒ සම්බන්යෙන් මම කරන්නේ නැහැ. ගරු නගරාධිපතිතුමනි, 18 කරුණ අඟුලාන පොලිස් මුරපොළ, මම මේ කතා කරන්නේ අත්‍යාවශ්‍ය ටික විතරයි ඒකේ. 19 පිටුවේ, 18 වෙනි කරුණ අඟුලාන පොලිස් මුරපොළ සඳහා ගිවිසුම් ගතවීමට අදාළව නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් සන්ධ්‍යා නෝනිස් මිය විසින් කෙටුම්පත් කරන ලද බදු සාධන පත්‍රය ලෙස ඇමුණුම් අංක 16 ලෙස සභා අනුමැතියට ඉදිරිපත් කරමි කියලා තියෙනවා. මෙහි දී අපිට දැනගන්න ඕන අඟුලාන පොලිසියත් සමඟ මේ බදු ගිවිසුම ගැහුවද කියන එක තමයි අපිට දැනගන්න තියෙන්නේ. මේක නගරාධිපතිතුමා අපිට පොඩි පැහැදිලි කරගැනීමක් ඕන ඔබතුමාගෙන් යාන්ත්‍රික ඉංජිනේරුගෙන් මේක පැහැදිලි කරගන්න තියෙන්නේ 20 වෙනි පිටුවේ,19 වෙනි කරුණ අනු අංක 01 මේකේ තියෙනවා ගරු නගරාධිපතිතුමා MMC/MEC/2062 ගොනු අංකය, 226-2062 ටිපර් රථය අළුත්වැඩියාව හා ටිපර් රථයක් බවට පරිවර්තනය කිරීම කියලා. මේ රථය කලින් තිබුණේ මොකද්ද? මේ ටිපර් රථයක් බවට පරිවර්තනය කළේ කුමන රථයක්ද?

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේ සම්බන්ධයෙන් නාගරික යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ අදහස විමසනවා.

<u>නාගරික යාන්ත්‍රික ඉංජිනේරු - එච්. එන්. ප්‍රියශාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ස්කිප් කන්ටේනර් කියන එක තමයි ඔංචිල්ලාව කියන එක තමයි ටිපර් රථයක් බවට පරිවර්තනය කලේ. තවම හදලා නැහැ. ඒක හදන්න අනුමැතියක් ගන්න තමයි මිල ගණන් කැදවලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ වාහන රක්ෂණාවරණය සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවා. අංක 20 මොරටුව මහා නගර සභාව සතු රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර රක්ෂණය කිරීම සඳහා පහත සඳහන් කාර්යන් ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි. 2026.05.31 දිනට පෙර සම්පූර්ණ ටෙන්ඩර් පටිපාටිය අවසන් කර වාර්ෂික රක්ෂණය ලබා ගැනීමට මාස 02කට ආසන්න කාලයක් ප්‍රසම්පාදන කටයුතු සඳහා අවශ්‍ය වන බැවින්, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති වීම සහ සභාවේ රක්ෂණාවරණයක් නොමැතිව ධාවනය කිරීම දැඩි අවදානමක් බැවින් මාස 03ක කාලයකට රක්ෂණාවරණයක් දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම. මම අහන්නේ ගරු නගරාධිපතිතුමා දැන් මේකේ රක්ෂණය කල් පිරෙන දිනය දන්නවා නිලධාරීන්. මේ දවසට තමයි රක්ෂණය කල් පිරෙන්නේ කියලා. එතකොට රක්ෂණය කල් පිරෙනකන් ඉදලා කියනවා මේක හදාගන්න බැරිවුණා මේකට ඩොකියුමන්ට්ස් ටික හදා ගන්න බැරි වුණා ඒ නිසා මේ තියෙන රක්ෂණාවරණය මාස 03ක් දීර්ඝ කරන්න කියලා. අපි අහන්නේ ඇයි මේක අවසාන මොහොත දක්වා නොකලේ. සමාන්‍යයෙන් ඔබතුමාගේ වාහනයක් තියෙනවානම්, මේ වාහනයක් තියෙන ඕන කෙනෙක් දන්නවා නිලධාරීනුත් දන්නවා තමුන් පාවිච්චි කරන වාහන සඳහා රක්ෂණාවරණය කරන කොට ඒ රක්ෂණාවරණය අදාළ දිනයේ දී ලබා ගන්න ඕන නැත්නම් පොලිසිය අල්ලනවා. ඒක දන්න නිසා තමුන්ගේ වාහනය රක්ෂණාවරණය ලබා ගන්නවා දිනයට ගිහිල්ලා. එක දවසක්වත් රක්ෂණාවරණය පැනලා පාරට වාහනේ දාන්නේ නැහැ. නමුත් මෙහිදී කියනවා රක්ෂණාවරණය

මාස 03කින් දීර්ඝ කරන්න කියලා ඉල්ලනවා. මම අහන්නේ මොකද්ද මේකට හේතුව කියලා අපිට දැනගන්න ඕන.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේ සම්බන්ධයෙන් අදහස් දක්වන්න නාගරික යාන්ත්‍රික ඉංජිනේරු වෙත අවස්ථාව ලබා දෙනවා.

**නාගරික යාන්ත්‍රික ඉංජිනේරු - එච්. එන් . ප්‍රියශාන්ත මහතා**

ගරු නගරාධිපතිතුමනි, ගරාජ් එකට ආවා අලුත් නිලධාරියෙක් මාරුවීමක් අරගෙන. ඒ ආව නිලධරියාට තියෙන අනෙක් වැඩත් එක්ක නියමිත කාල වේලාවට කර ගන්න බැරිවුණා ඒ නිසා තමයි කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා සිටින්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතුමනි, එතුමාගේ දුර්වලතාවයක් තියෙනවා කියලා පිළිගත්ත නිසා ඉන්එහාට අපිට කතාවක් නැහැ. හැබැයි ඒ දුර්වලතාවය තවදුරටත් වෙන්න තියන්න එපා. මම ඇමුණුම් සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඇමුණුම් අංක 02 ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව එහි කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මයා සභාපති කියලා අත්සනුත් කරලා තියෙනවා මේ ඉරකින් කපලාත් තියෙනවා. මම අහන්නේ ඒක කපලාද නැතිනම් ඒක ප්‍රින්ටින් මිස්ටේක් එකක්ද?

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඒක ප්‍රින්ටින් මිස්ටේක් එකක්. ඔබේ ප්‍රශ්ණය මග හරින්න එපා මගේ වුවමනාව වෙනුවෙන්. මම මානුෂීය ඉල්ලීමක් කළේ කරදියාන වත්තේ සාකච්ඡාවක් නිසා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතුමනි, ඔබතුමා මෙහි ප්‍රධානියා හැටියට ඔබතුමාට අත්‍යාවශ්‍ය රාජකාරියකට යන්න ඕනනම් ඒ සම්බධයෙන් අපි සංවේදී වෙනවා. මම ලෑස්ති වෙලා ආව කරුණු ගොඩක් තියෙනවා. ඉතින් ඔබතුමා නගරාධිපතිවරයා හැටියට සහභාගී වෙන්න ඕන රැස්වීමකට සහභාගී වියයුතු නිසා මම නිහඬ වෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා**

ගරු නගරාධිපතිතුමනි, බැරිවෙලා හරි දැන් මේ වාහන එකම දවසින් ඉන්ෂුවරන්ස් එක හම්බවෙන්නෙත් නැහැ. බැරිවෙලා හරි මේ එක වාහනයක අනතුරක් සිද්ධ වුණොත් ඒ අනතුරට අදාළව වන්දි සම්බන්ධ නඩුවක් පවරන්න පුලුවන් දිසා අධිකරණයේ. ඒ දිසා අධිකරණයෙන් පවරන වන්දිය තත්ත්වය උඩදී අදාළ පුද්ගලයන්ට වන හානිය සම්බන්ධයෙන් ලිමිට් ඒකක් නැහැ. ඔහුට වෙන හානිය සම්බන්ධයෙන් සම්පූර්ණ වන්දිය ගෙවන්න වෙන්නේ මහා නගර සභාවට. ඒ කියන්නේ මේ මොරටුව මහා ජනතාවගේ සල්ලි. හැබැයි ඒ වගකීම පැහැර හැරියාම නගර සභාවෙන් එය සම්පූර්ණයෙන් ගෙවන්න ඕන. මේවා මේ නිලධාරීන්ට අමතක වෙනවානම් මේ මතක් කරන්න තවත් නිලධාරියෙකු පත් කරන්න. මොකද එහෙම නැතිනම් කෝටි ගාණක් ගෙවන්න වෙන්නේ නගර සභාව. එතකොට අපිට ගිහින් කියන්න බැහැ මෙන්න මෙහෙම අපේ නිලදාරියෙකුට අතපසුවීමක් වෙලා ගෙවන්න බැහැ කීයලා කියන්න බැහැ. එහෙම නැතිනම් ඒක ඒ නිලධාරීන්ගෙන් අයකරගන්න ක්‍රියාමාර්ගයක් ගන්න. මේක බොහොම බරපතල කාරණාවක්. මේවා අපි ගෙවන්නේ නැහැ මේවා මොරටුවේ මිනිස්සුන්ගේ බදු මුදල් වලින් ගෙවන්නේ.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔච් එතුමා මතු කරපු කාරණාව භාරගන්නවා. ඒ කියන්නේ සමාවෙන්න කියලා අතපසුවීමක් කියලා වාහනයක් ඇක්සිඩන්ට් වුණොත් බේරෙන්න බැහැ. ඒ නිසා හරියටම මේ කටයුත්ත වගකීමක් ඇතිව වෙන්න ඕන. මේක මේ අළුත් නිලධාරියෙක් ආවා ඒක නිසා බැහැ. මම කියන්නේ මේවා උත්තර නෙවෙයි.

**මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම එතුමාට ස්තූතිවන්ත වෙන්න ඕන. හැබැයි මෙහෙමත් දෙයක් තියෙනවා මේ ගරාජ් එකෙන්නේ මේ ඉන්ෂුවරන්ස් එකෙන් කරන්නේ හැබැයි සාමාන්‍යයෙන් වාහන ගොඩක් තියෙන ආයතන වල ඉන්ෂුවරන්ස් එක කරන්නේ ෆයිනෑන්ස් ඩිපාර්ට්පමන්ට් එක. මෙතන මේ කාර් හදන්නයි ඉන්ෂුවරන්ස් එකයි ඔක්කෝම ගරාජ් එකට පැටෙව්වාහම ඇත්තටම මේවා වෙන්න පුලුවන්. හැබැයි ඉන්ෂ්වරන්ස් ඩයරි එකක් තියෙනවා. ඕනෑම ආයතනයක ඉන්ෂ්වරන්ස් ඩයරි එකක් තියෙන්න ඕන. ඒක විසඳෙනෙවා ඒක ෆයිනෑන්ස් එකෙන් කළානම්. දැන් මේ ඉන්ෂුවරන්ස් එක කරනකොට එන අවුරුද්දේ ඉන්ෂුවරන්ස් එකත් ඩියුව් මේ හැමදාම තර්ඩ්පාටි දාලා කරගෙන යන්න බැහැ. දැන් අපි තර්ඩ්පාටි එකකට අනුමත කළාට මේක කරගෙන යන්න ෆයිනෑන්ස් එකට දෙන්න. නැතිනම් මේක මේ ගරාජ් එකේ ඉන්න බාස්ට අරගොල්ලන්ට මේගොල්ලන්ට කරන්න අමාරුයි. තව කෝලාස් පිළිබඳ ප්‍රශ්ණ දෙක තුනක් ආවා. මේ කෝලාස් එකේ වුණේ දැන් අපි මේ පාර CSS නේ ගත්තේ මේ පාර බැරල් 30ක්. ඒක නෙවෙයි මෙතන වුණේ මීට ඉස්සෙල්ලා ආව බැජ් එකක RSS ලොට් එකක ප්‍රශ්ණයක් තිබිලා බැරල් 30ක්ද කොහෙද අයින් කරලා තිබුණා. ඒ අයින් කරලා තිබ්ච්ච එක පාවිච්චි කරලා හදපු ප්‍රිමික්ස් එකකින් තමයි ඔය ගැලවිලා ප්‍රශ්ණය වුණේ. නමුත් මේ අලුතින් ගෙනාව 30ත් ප්‍රශ්ණ නැතුවාම නෙවෙයි. මේ පළවෙනි පාර නෙවෙයි කොලාස් වල ප්‍රශ්ණය වුණේ.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරුන් 2026.04.21 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජීත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතරණ මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |

22. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.21 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(03), 03, 15(07), 21 යන කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් සඳහා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - පී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - එච්. එල්. තිළිනි නෙත්සරණි මෙනවිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.21 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.04.21 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 12, 13 යන කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.04.21 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා)

## 07 ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීන්නාදු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 2026.02.18 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 60 යටතේ 2026 ජනවාරි මාසයට අදාළ මූල්‍ය වාර්තාව ඇමුණුම 78 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

## 08 පුද්ගලික ස්වභාවයේ කරුණු - නැත

## 09. වෙනත් කරුණු

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතුමනි, අපි මේ වේලාවෙ ස්තූති කරන්න ඕන මහා සභාව පවත්වන අවස්ථා වල නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යය භාර්යයක් කරපු මහඟු වැඩ කොටසක් කරපු ලංකා නිලධාරි මහත්මිය මම හිතන්නේ ඇය වෙනත් ස්ථානයකට මාරුවීමක් ලැබිලා ගිහින් තියෙනවා. අපි එතුමියගේ සේවය අගය කරන්න ඕන විශාල කාර්ය භාර්යක් කරපු නිලධාරිනියක්. එතුමිය තවත් අවුරුදු 03ක් වගේ කාලයකින් තමයි මම හිතන්නේ විශ්‍රාම යන්න තිබුණේ. අපිට එතුමිය තියාගන්න තිබුණානම් හොඳයි එතකොට අපිට අලුත් අත්දැකීම් අරගෙන තවදුරටත් කරගෙන යන්න තිබුණා. කෙසේ වෙතත් දැන් ස්ථාන මාරුවීම සිද්ධ වෙලා තියෙනවා. එතුමියට අපේ සභාවෙත් මොරටු මහ ජනතාවගේ ස්තූතියත් පුදකරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතුමනි, පොදු විපක්ෂයක් විදියට අපෙත් ස්තූතිය පුද කරනවා එතුමිය දීර්ඝ කාලයක් මේ සභාවේ මම හිතන්නේ මම ආව දවසේ ඉඳන්ම සිටියා දීර්ඝ කාලයක් මේ සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ට බොහෝම සුහදශීලිව බොහෝම ලෙන්ගතු සේවයක් කළා. සාමාන්‍යයෙන් පක්ෂ විපක්ෂ කාගෙන්වත් වැරදි දෙයක් අහගන්නේ නැතිව මේ සභාවේ කටයුතු කලේ එතුමියගේ දක්ෂතාවය සහ ඒ සුහදශීලීත්වය සහ කාර්යශූරත්වය නිසා කියන එක මේ වේලාවේදී මතක් කර සිටිනවා. එතුමිය මෙතැනින් ගිය එක සම්බන්ධයෙන් අපි කණගාටු වෙනවා. නමුත් එතුමිය ඒ කරන සේවාව තව ස්ථානයකට එතුමියගේ සේවාව මේ හා සමානව මීටත් වඩා හොඳින් ඉටු කරන්න එතුමියට ධෛර්ය ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, තව කොටසක් එකතු කළොත් හොඳයි කියලා මම හිතනවා. එතුමිය කරපු සේවයත් එක්ක එතුමියගේ පර්සනල් ෆයිල් එකට යන විදියට අපි අපේ ප්‍රශංසා ලිපියක් යොමු කළොත් වැදගත් මොකද මම හිතන්නේ මෙතුමාටත් දැවැන්ත සහයෝගයක් ලබා දුන්නා ලේකම් අංශයට. ඒ නිසා මම හිතන්නෙ තීන්දු ගන්නකොටත් විද්‍යාත්මක විදියටත් ඒ කටයුතු සිදුකලා. ඒක ලොකු අඩුපාඩුවක් ඒ රික්තය අපිට සම්පූර්ණ කරන්න ලොකු කාලයක් යයි.

ඒ නිසා අපි එතුමියගේ පර්සනල් ෆයිල් එකට සමස්ථ සභාවේම අගය කිරීමක් විදියට යන ප්‍රශංසා ලිපියකුත් යොමු කළොත් ඒක මොර්ටිවේෂන් එකක් වෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම අවුරුදු 22ක් මේ සභාවට ඇවිල්ලා තියෙනවා එතුමියත් සමඟ ඒ අවුරුදු 22 ඇතුලෙම ආයතන අංශයේ ඉදලාම කතාබහ කරලා ඔබතුමත් එහෙමයි. ඉතින් එක පැත්තකින් ගණගාටු වෙනවා ඉතාමත් දක්ෂ නිලධාරිනියක් රැස්වීම් අංශය බොහෝම හොඳට කළමනාකරණය කරපු නිලධාරිනියක්. නමුත් රාජ්‍ය සේවයේ හැටි මෙහෙම තමයි. අපෙන් නික්මිලා අළුත් තැන රාජකාරි ඉටු කරන්න ගිහිල්ලා තියෙනවා. එතුමියට සුබ පතනවා රාජ්‍ය සේවයේ ගමන පිළිබඳව ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, අපේ තවත් නිලධාරීන් කිහිපදෙනෙක් මේ සභාවට අවශ්‍ය මේ වගේ ස්ථාන මාරුවීම් ලැබෙමින් තියෙනවා විශේෂයෙන් අපේ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය ඇතුලුව ඉතින් මම හිතනවා පළපුරුදු, අවංකව සේවය කරන අය අපෙන් ස්ථාන මාරුවීම ගැන. ඒක සභාව පවත්වාගෙන යාමේදී අතිශය දුෂ්කරතාවන්ට අපිට නෙවෙයි විශේෂයෙන් ඔබතුමාට මුහුණ දෙන්න සිද්ධ වෙයි. අපි අපේ පැත්තෙන් අපේ ගෞරවය, ගෞරවනීය ප්‍රණාමය ලෙන්ගතු සහෝදරාත්මක ඇසුරක් නිලධාරියෙකුට එහා ගියපු සහෝරාත්මක ඇසුරක් අපි අතරේ තිබුණා. ඉතින් එතුමියගේ ගමන ගැන සුබ පතනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි කතා කලේ නැතිනම් ඒක ලොකු අඩුවක් වෙනවා මොකද හේතුව ලංකා මිස් කියලා කියන්නේ සහෝදරියක් වගේ අපිත් එක්ක අවුරුදු 20කට වැඩිය බොහොම ලෙන්ගතුව ඇසුරු කරපු තැනැත්තියක්. හැබැයි ඇය හැමෝටම ලෙන්ගතුයි. ලේකම් අංශය කියලා කියන්නේ මන්ත්‍රීවරුත් එක්ක නිරන්තරයෙන් ගැටෙන අංශයක්. හැබැයි ඇයගේ ඒ තිබුණ පරිනතභාවය ඇය ප්‍රශ්ණයක් දිහා බලන විදිහ සමහර වේලාවට අපි ලේකම්වරයා එක්ක ප්‍රශ්ණයක් ඇති කරගෙන ඇයට කිවුවොත් එහෙම ඇය දෙපැත්ත බොහෝම, ගෙදර ඉන්න අර මව්තුමියක්ගේ කාර්යය භාර්යවත් කාර්යක්ෂමවත් කරනවා අපි දැකලා තියෙනවා. මොකද හේතුව ඇය මෙතන තියෙන දේ එතැනට කියන්නෙත් නැහැ, එතැන තියෙන දේ මෙතැනට කියන්නෙත් නැහැ. අපිවත් බොහෝම හොඳට කූල් කරලා අනෙක් පැත්තත් හොඳට කූල් කරලා එතුමියගේ තිබුණ අමුතුම දක්ෂතාවයක් තියෙනවා එතුමියගේ. ඒ නිසා මම කියනවා ඒ වගේ රාජ්‍ය නිලධාරීන් රටට සම්පතක් කියන එකයි අපිට කියන්න තියෙන්නේ. එතුමිය කළා වූ කාර්යය භාර්යය සම්බන්ධයෙන් අපේ ශීර්ෂ ප්‍රණාමය පුද කරනවා ඒ වගේම අපේ සුරේෂ් මන්ත්‍රීතුමා කිවුවා වගේ අපේ දක්ෂ නිලධාරීන් කිහිපදෙනෙක් අපෙන් මාරුවෙලා ගිහිල්ලා තියෙනවා. විශේෂයෙන්ම ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීන් කිහිපදෙනෙක්ම ගිහිල්ලා තියෙනවා. ඉතින් ඒ උදවියගේ මාරුවීමත්, අපිව ඒ උදවිය සමඟ වැඩිය ගැටෙන්නේ නැති නිසයි කතා කරන්න දන්නේ නැත්තේ. හැබැයි ඉතින් සභාව අතින් ගත්තොත් එහෙම ඒ උදවියත් විශාල කාර්යය භාර්යයක් සභාව වෙනුවෙන් ඉෂ්ඨ සිද්ධ කරපු පිරිස් මාරුවෙලා ගිහිල්ලා තියෙනවා. ඒ වගේම වංචා දූෂණ වලට අහුවෙච්ච අයවත් මාරුවෙලා ගිහිල්ලා තියෙනවා. ඉතින් අපි කියන්නේ ඒ මාරු වුණ සියලු දෙනාටම අපේ ගෞරවය ස්තුතිය පුදකරනවා. මොරටුව ජනතාව වෙනුවෙන් යම් හෝ සේවාවක් කළානම් ඒ සේවාව වෙනුවෙන් අපේ ශීර්ෂ ප්‍රණාමය ඒ සියලුදෙනා හට යොමු කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් පාලක කණ්ඩායම විදියට මම හිතන්නේ ලංකා මිස් කියන්නේ කවුද කියන්න අපි අමුතුවෙන් කියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. විශාල කාර්යය භාර්යයක් මේ සභාවේ කරපු කෙනෙක්. රාජ්‍ය සේවයේ දීර්ඝ කාලයක් අත්දැකීම් තිබුණ නිලධාරිනියක්. මොරටුව මහා නගර සභාවේ විශාල කාලයක් අපිත් එක්කත් ගත කළා. අපිත් එහෙම හිතුවේ නැහැ එතුමියටත් මෙහෙම දෙයක් රජයේ ප්‍රතිපත්තිමය කාරණයක් ඒක අපිට වළක්වන්න බැහැ. ඒ නිසා ඒ කාරණයට අනුව තවත් නිලධාරීන් කිහිපදෙනෙක් යනවා ඉතින් අපි එතුමියට සුබ පතනවා අපි දන්නවා එතුමිය කීර්තිමත් විදියට නමක් දිනාගෙන මේ ආයතනයේ වැඩ කළා සේවය කළා. ඒ සියලු කාරණා වලට ජාතික ජනබලවේගයේ මන්ත්‍රී කණ්ඩායම විදියට ස්තුතිය ගෞරවය පුදකර සිටිනවා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදින්නාදු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනී, මම හිතන්නේ නගරාධිපතිවරයා ලෙස පත්වුණාට පස්සේ මට සිදුවුනු දෙවැනි විශාලතම පාඩුව විදිහට මට දරාගන්න අමාරු දෙයක්. පළවෙනි එක තමයි අපේ හිටපු එකවුන්ටන් තරිඳු මහත්තයා ස්ථාන මාරුවී යෑම දෙවැනි එක තමයි මේ ලංකා මහත්මියගේ ස්ථාන මාරුව. අනෙක් අයගෙත් මම කියන්නෙ මාරුවීම් ගොඩක් අයගේ සිද්ධ වෙලා තියෙනවා. පාඩුයි හැබැයි මේක ප්‍රතිපත්තියක්නම් මේ රැස්වීම් අංශය වගේ එකක හසල අත්දැකීම් තිබෙන සහ ඕනෑම කෙනෙකු එක්ක ඉතාම හොඳින් මහජන සම්බන්ධතාවය පවත්වා ගන්න පුලුවන් ඒ හැකියාවන් තියෙන රාජ්‍ය නිලධාරීන් හරි අඩුයි. ලංකා කියන්නේ ඉතාම උඩින් ඉන්නේ. ඕනෑම කෙනෙකුට ඉතාම හොඳන් ඇය කරුණු පැහැදිලි කරලා දෙනවා ආයේ කිසි ප්‍රශ්ණයක් නැතුව යන්න පුලුවන්. ඒ තරම් දක්ෂයි. ඉතින් ඇයගේ මාරුවීම ලොකුවට බලපායි. මම තීන්දුවක් ගත්තා මම මැදිහත් වෙලා කිසි කෙනෙක්ව මේ මාරුවීම වළක්වන්න කටයුතු කරන්නේ නැහැ මම තවමත් එකක් වළක්වන්න උත්සහා දරනවා. ඒ තමයි ඉඩම් පිලිබඳව කටයුතු කරන වුල්ලා මහත්තයා. මේ සභාවේ විශාල දේපළක් ඉතාම හොඳින් මේ සභාවට ඉතාම නිවැරදි ලෙස කරගන්න මහන්සි වෙන මොරටුවේ අත්දැකීම් තියෙන වුල්ලරත්න මහත්තයාගේ ස්ථාන මාරුව මම තවත් උත්සහා දරනවා. මේ සභාවේ විශාල දේපළ ප්‍රමාණයක් තියෙනවා හරියට නිරවුල් නැති. ඒක නිරවුල් කරගන්න අලුතින් කෙනෙකුට බැහැ. මගේ ඒ උත්සහාය හැරුණුකොට කිසි කෙනෙක් වෙනුවෙන් මම රඳවා ගන්න උත්සහා කරන්නේ නැහැ. ඒ මාරුවීමට ඉඩදීලා තියෙනවා කොච්චර බාධා අමාරුකම් තිබුණා වුණත් පිළිගන්න වෙනවා. මම ඒක පිලිගන්නවා. අර දේ කරන්නේ මේ සභාවේ දේපල ටික ආරක්ෂා කරගන්නනම් වුල්ලා මහත්මයාව තියාගත යුතුයි කියන තැන මම ඉන්නවා. ඒක තමයි මගේ අදහස. ඉතින් හැම කෙනෙකුටම ස්තුතිවන්ත වෙනවා ලංකා මහත්මියටත්, මට ආරච්චි විදියට එතුමියටත් යම් කළකිරීමක් ඇති දැන් දීර්ඝ කාලයක් ඉඳලා තව පොඩි කාලයයි මේ මාරුවීම සම්බන්ධව. තවදුරටත් මේ රාජ්‍ය සේවය කරගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියන ප්‍රාර්ථනා කරනවා. ඒවගේම තිලකසිරි මන්ත්‍රීතුමාටත් උපන්දිනය වෙනුවෙන් සුබ පතනවා.

අ.කලේ කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු,<br>
නගරාධිපති,<br>
මොරටුව මහා නගර සභාව,<br>
මොරටුව.

2026.05.07 දින,<br>
මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.